# ධරණී

සතුටින් ජීවිතය දරන්නී

2022 පෙබරවාරි 02 වන බදාදා
දෙවන කාණ්ඩය නවවන කලාපය මිල රු. 50 යි

ධරණී
ශ්‍රී ලංකාවේ
අංක එකේ
කාන්තා
පුවත්පත



අවුරුදු හතලිහක් කොකේන් ගහපු මමත් වෙනස් වුණානම් කාටද වෙනස් වෙන්න බැරි?

මතට ලොල් වූ කතකගේ ආදර්ශවත් ජීවිත කතාව

බිලීවින් ක්‍රීම් ගාන අයගේ මවාපෑම "රත්තරන්" අයියලාට අහුවෙන හැටි

විභාගේ ලියන්න ඔබේ දරුවාටත් දෙයියෝ එවපු පෑනක් හම්බුණාද?

උදේට ලෙඩ බලා හවසට ලුණු බලන දොස්තර නෝනා

ආචාර්ය පබිලිස් සිල්වාගේ
ආහාර වට්ටෝරු 15ක
විශේෂ කෑම වට්ටෝරු පොතක්
නොමිලේ

නිවසේ සිටින කාන්තාවන්ට ස්වයං රැකියාවත් වෙළඳපොළත් දෙකම මුනගස්වන
ධරණී
ස්වයං රැකියා

ආචාරිණී
නිශානි තිලකරත්න

■ ඡායාරූපය - සමන් අබේසිරිවර්ධන



# උඩරට මැණිකෙට හෑන්ඩ් ප්‍රින්ට් සාරියක්

**ජුවලරි හා සාරිය වගේම බොකේ එකත් එකම පාටට ගත්තා**

**මේක සීයට සීයක්ම අතින් ඇඳපු සාරියක්**

**බොකේ එක නෙළුම් පොහොට්ටුවලින්ම නිර්මාණය කළා**

**අමුරෙදි තමයි සාරියට භාවිතා කරලා තියෙන්නේ**

**ඇත්තටම මේකප් එකක් භාවිතා නොකළ තරම්**

**කොණ්ඩා මෝස්තරයත් ගොඩක් උසට දැම්මෙ නැහැ**







අද 'ධරණී' මනාලිය ලෙස හැඩගැන්වෙන්නේ බොහෝ සේ සුන්දර උඩරට මනාලියක්. සීයට සීයක්ම 'උඩරට මැණිකේ' කියන තේමාව යටතේ හැඩවුණු මේ මනාලිය තුළින් සාම්ප්‍රදායික බව උපරිමයෙන් දිස්වෙනවා. විශේෂත්වය වෙන්නේ ඒ සාම්ප්‍රදායික බවට අලුත් බවක් ලබාදෙමින් ඇයව හැඩගැන්වීමට තිඹිරිගස්යාය අංක 34/6 ස්ථානයේ පිහිටි 'සංජීවනී වික්‍රමසිංහ බ්‍රයිඩ්ල් ස්ටූඩියෝ'හි සංජීවනී වික්‍රමසිංහ කටයුතු කර තිබීම. ඉතින් ඒ නිසා මේ අපූරු උඩරට මනාලියව හැඩකරපු විදිය ගැන අපි සංජීවනීගෙන් ඇහුවා.

**"ගොඩක් දෙනෙක් මේ සාරියට වශීවෙලා ඉන්නේ. සාරිය නිර්මාණය කළේ කනිෂ්ක සගබෝ ඩයස්. අමුරෙදි තමයි සාරියට භාවිතා කරලා තියෙන්නේ. මේක සීයට සීයක්ම අතින් ඇඳපු සාරියක්. හෑන්ඩ් ප්‍රින්ට් එකක් කියලත් කියනවා. සාම්ප්‍රදායික බව ආරක්ෂා කරගනිමින් සාරිය නිර්මාණය කරන්න තමයි කනිෂ්කට අවශ්‍ය වුණේ. සාම්ප්‍රදායික මනාලියට ටිකක් විතර අලුත් කොණ්ඩා මෝස්තරයක් භාවිතා කරලා තියෙනවා.**

**මේකප් එක නම් ටිකක් සිම්පල්. ඇත්තටම මේකප් එකක් භාවිතා නොකළ තරම්. ඇයගේ ස්වභාවික බව මතු කරන්න තමයි මට අවශ්‍ය වුණේ. මොකද මනාලිය බොහොම පැහැපත් යුවතියක්. ඒ නිසා ඇයව අමුතුවෙන් මේකප් කරන්න අවශ්‍ය වුණේ නැහැ.**

**කොණ්ඩා මෝස්තරයත් ගොඩක් උසට දැම්මෙ නැත්තේ මනාලයා හා මනමාලිය හොඳින් ගලපගන්න ඕන නිසා. අලුත් තාලේ කොණ්ඩා මෝස්තරයට පරණ තැල්ලක් භාවිතා කරලා වෙනස්ම පෙනුමක් ලබා දුන්නා. සාම්ප්‍රදායික මනාලියට භාවිතා කරන ආභරණ සියල්ලම ඇයටත් භාවිතා කළා.**




**බොකේ එක නෙළුම් පොහොට්ටුවලින්ම නිර්මාණය කළා. නෙළුම් පොහොට්ටුවලින් හදපු බොකේ එකට ගෝල්ඩ් කලර් එක ආලේප කළේ සාරියට ගැළපෙන්න ඕන නිසා. ජුවලරි හා සාරිය දෙකම රත්තරන් පාටට සමාන නිසා බොකේ එකත් ඒ හා සමානවම ගත්තා. මනාලියගේ සෑම අංගයක්ම එක් තේමාවකට ගලපගන්නයි මම උත්සාහ කළේ."**



මනාලිය හැඩගැන්වීම -
රූපලාවන්‍ය ශිල්පිනී
**සංජීවනී වික්‍රමසිංහ**



ඡායාරූප -
**ගයාන් කරුණාරත්න**



සාරි නිර්මාණය -
**කණිෂ්ක සගබෝ ඩයස්**

සම්බන්ධීකරණය -
**ක්‍රිෂාන්ත පුෂ්පකුමාර**
**0763113839**

**අද බොහෝ කාන්තාවන් කාර්යබහුලය. ඒ නිසාම දැනුවත්ව හෝ නොදැනුවත්ව ඒ අයගේ ජීවිතවලින් සතුට සහ ආදරය අන් හැමදේටම පෙර පලා යයි. නමුත් පුංචි පුංචි දේවල්වලින් සතුටු වෙන්නට පුරුදු විය හැකිනම් ඒ ඕනෑම කෙනෙකුගේ ජීවිතය හිතනවාට වඩා සුන්දර එකක් වනු ඇත. විදෙස් රටක ජීවත් වන හෂිනි මේ කියන්නේ ඕනෑම අම්මා කෙනෙකුට, ඕනෑම බිරිඳකට එසේ සතුටින් දිවි ගෙවිය හැකි ආකාරයයි.**

# අලුත් අම්මලාට සහ අම්මලා වෙන්න ඉන්න අය වෙතටයි,



අසුබවාදී ආකල්ප ටික ටික ඔලුවෙන් අයින් කරගෙන ජීවිතේ දිහා සුන්දරව බලන්න පටන් ගනිද්දී මං අරමුණු තුනක් හදාගත්තා. පළවැනි එක මගේ හිතේ සතුට දිගටම තියාගන්න එක. දෙවැනි එක මගේ පවුලේ සාමාජිකයන්ගේ සතුට නැති නොකරන එක. අනිත් එක කිසිම බාහිර බලපෑමක් මගේ පවුලේ සතුටට බාධාවක් කරනොගැනීම. අද මම ලියන්න යන්නෙ මේ කාරණා තුනටම අදාළ කතාවක්.

මං සමාජ මාධ්‍යවල මගේම අත්දැකීම් ලියලා අනිත් අයත් එක්ක බෙදාගන්න නිසා අලුත දරුවෝ ඉපදුණ අලුත් අම්මලා මගෙන් අහන දේවල් තියනවා. දරුවගේ කෑම හදන විදිය, ඒ ඇරුණාම මං කොහොමද දරුවෝ පොඩි කාලේ වැඩ කරගත්තේ වගේ දේවල්. මං වෙන රටක තනියම ජීවත් වුණ නිසයි විශේෂයෙන් ඒ ගැන අහන්නේ.

මගේ දරුවෝ දැන් ටිකක් ලොකුයි. එක්කෙනෙක්ට වයස 8යි. අනික් කෙනාට 7යි. බාලයාට 4යි. ලොකු දූ හම්බවෙලා එයාට අවුරුද්ද පිරෙන්න සුමාන දෙකක් තියෙද්දී තමයි මගේ දෙවැනි දූ ඔව්න්‍යා ලැබුනේ. ඒ කාලේ වැඩ කරගන්න හරි අමාරුයි. අමාරු නෑ කියලා මට බොරු කියන්න බෑනේ. ලොකු දුවට අවුරුද්දක් පිරෙන්නත් කලින් දෙවැනි දූ ලැබෙන්න ආපු නිසා ලොකු දූගේ සමහර හුරතල් දේවල් මට මගහැරුණා. දෙවැනි දූ ලැබුනාම දෙන්නාම බලාගන්න වුණේ එකට. ලොකු දූ ලැබෙන්න ඉඳිද්දී මගේ අම්මා ආවා. දෙවැනි දූ ලැබෙද්දී දහම්ගේ අම්මා ආවා.



ඒ මොන දේ වුණත් දරුවා නාවන දේවල් වගේ හැමදේම කළේ මම. දරුවා ලැබිලා හොස්පිටල් එකෙන් එන්න කලින් මටයි, දහම්ටයි ඒ දේවල් කියලා දුන්නා. මට විතරක් නෙවෙයි මෙහේ හැම කෙනෙක්ටම එහෙමයි. පොල්කටු හිල් කරලා, බෙහෙත් උරච්චි කරලා ගාන දේවල් මෙහේ නෑ. දරුවාගේ වැඩ කරන්න ඕන විදිය හැමදේම හරිම මිත්‍රශීලී විදියට හොස්පිටල් එකෙන් කියලා දෙනවා. ඒ නිසා මුල්ම කාලේ අම්මලා උදව් කළත් මං දරුවගේ වැඩ තනියම කරගත්තා. ඒ ඇරුණාම දහම් උදව් කළා. අම්මලා ට හැමදාම මෙහේ ඉන්නත් බැරි නිසා මට කොහොමත් වැඩවලට තනියෙන් හුරු වෙන්න වුණා. ඒ කාලේ අමාරු වුණත් මට දැන් ඒ ගැන තියන්නේ සතුටක්.



ඕනම කෙනෙක්ට පළවෙනි දරුවා අලුත් අත්දැකීමක්. ඒ නිසා ඒකට හුරුවෙන්න පොඩි කාලයක් යනවා. දරුවාගේ නැගිටින, නිදියන වෙලාව සහ ඒ රටාව දැනගන්නත් සුමාන දෙකක් තුනක් යනවා. අම්මලා යන්න මාසයක් වගේ තියෙද්දී දහම් මට කිව්වා **“උයන පිහන මේ වැඩ අපිම කරගන්න ඕනේ, ටයිම් එක මැනේජ් කරගෙන ගෙදර වැඩ හිමීට ඔයා කරන්න, මං උදව් කරන්නම්”** කියලා. ඒ විදියටම එයාගෙන් මට උදව් ලැබුනා. මං තේරුම්ගත්ත වැදගත්ම දේ තමයි දරුවො ලැබෙද්දි අම්මලා අපේ උදව්වට හිටියට අපි එයාලා මත්තෙම යැපෙන්න නරකයි. එහෙම කළොත් අපිට හැමදේටම එයාලා නැතුව බැරිවෙනවා. එයාලට වුණත් සැඳෑසමය සතුටෙන්, නිදහසින් ගත කරන්න අපි ඉඩදෙන්න ඕනනේ.



මට මැසේජ් එවන ගොඩක් අය කියන්නේ දරුවා ලැබුනාම හැමදේම තනියෙන් කරගන්න වෙලා, ජීවිතේ එක තැන නැවතිලා වගේ, රෑට නින්දක් නෑ, මුළු රෑම ඇහැරන්, දරුවාට කිරි දෙන්න ඕනේ, ඉස්සර යාළුවෝ හම්බවුණා දැන් ඒකත් නෑ වගේ දේවල්.

**ජීවිතේ නිදහසින් විඳින්න කාලයක් අනිවාර්යයෙන් එනවා. එතකල් දරුවෝ එක්ක ගෙවෙන ජීවිතේ සුන්දරම කාලේ මතක හිටින්න විඳින්න**

මටත් ඔය දේවල් ඔහොමම නොහිතුනා නෙවෙයි. හැබැයි මට එදා නොහිතුනු දැන් තේරෙන ටික කියන්නද? ජීවිතේ එක තැන නතරවෙන කාලෙ නෙවෙයි, ජීවිතේ ඉක්මනින්ම යන කාලෙ තමයි ඒක. පුංචි අත දරුවෙක් ලොකු වෙන්නේ බලන් ඉඳිද්දී. රෑට ඇහැරලා කිරි දෙන එක මුළු ජීවිත කාලෙම කරන්න නෑ. දරුවෙක් රෑට ඇහැරන් එහෙම කිරි බොන්නේ උපරිම මාස 8ක් වගේ කාලයක්. ඊටපස්සේ එයාලා රෑට නිදියනවා. අර රෑට ඇහැරගෙන කිරි දීගෙන සුරතල් බලන සුන්දර කාලේ ආයේ එන්නේ නෑ. ඒ නිසා ඒවා පීඩනයක් කරගන්නේ නැතුව උපරිමෙන් විඳින්න උත්සාහ කරන්න. ඇයි දන්නවද මං මෙහෙම කියන්නේ? දරුවෝ හැමදාම පුංචියට ඉන්නේ නෑ. ලොකු වෙද්දි එයාලා අපිට තුරුල් වෙලා හුරතල් වෙන කාලේ අඩු වෙලා, පොඩ්ඩ පොඩ්ඩ අපෙන් ඈත් වෙනවා.

**රෑට ඇහැරගෙන නිදිමරන කාලේ ආයෙ එන්නෙ නෑ. ඒ නිසා ඒ මාස අට පීඩනයක් කරගෙන විඳවන්න එපා. ඒක විඳින්න**

ඒ නිසාම මගේ දරුවන්ගේ හැම තප්පරේම මං විඳිනවා. හැමවෙලේම බදාගෙන හුරතල් කරනවා. හැමවෙලේම මං එයාලාට ආදරෙයි කියනවා. ආස දේවල් හදලා දෙනවා. මං වැඩක් කර කර ඉන්න වෙලාවක වුණත් මගේ දරුවෙක් ඇවිත් දෙයක් කිව්වොත් ඒක මං අහනවා. චිත්‍රයක් ඇඳලා පෙන්නුවොත් මං අත්පුඩි ගහලා ප්‍රශංසා කරනවා. සෙල්ලම් කරන්න කතා කරද්දි සෙල්ලම් කරනවා. ඒ මේ කාලේ හැමදාම දෙමව්පියෝ විදියට අපිට ලැබෙන්නේ නෑ. පොඩ්ඩ පොඩ්ඩ ලොකු වෙන්න ලොකු වෙන්න එයාලා අපෙන් ඈත් වෙනවා. යාළුවෝ හම්බ වෙනවා. එයාලට තනියෙන් විනෝද වෙන්න ඕන වෙනවා. නිදහස හොයනවා. ඒ නිසා එයාලා අපිට තුරුල් වෙලා ඉන්න හදන කාලේ උපරිමෙන් එයාලව තුරුල් කරගෙන ආදරේ කරන්න. හැම මොහොතම විඳින්න. අපි කරන වැඩේට අවධානේ දීලා ඒක ලොකු කරගෙන දරුවාගෙන් අපිට ලැබෙන අවධානය නැති කරගන්න එපා කවදාවත්. යාළුවෝ කවදාහරි හම්බවෙන්න පුළුවන්. ජීවිතේ නිදහසින් විඳින්න කාලයක් අනිවාර්යයෙන් එනවා. එතකල් දරුවෝ එක්ක ගෙවෙන ජීවිතේ සුන්දරම කාලේ මතක හිටින්න විඳින්න. මාත් මේ දේවල් තේරුම් ගත්තේ ජීවිතේ ලැබුන අත්දැකීම්වලින්. මටත් මුලදී තේරුණේ නෑ. ඒ නිසාමයි අලුත් අම්මලාටයි, අම්මලා වෙන්න ඉන්න අයටයි මේ කියන්නේ. ඉතින් දරුවන්ගේ ජීවිතවල සුන්දරම මතකවල ඉන්න ආදරණීයම චරිත අපි වෙන තරමට එයාලා එක්ක ජීවිතේ විඳින්න. එතකොට එයාලා එයාලාගෙ දරුවන්ටත් සුන්දර මතක එකතු කරන දෙමව්පියෝ වෙන්න උත්සාහ කරාවි. අනික ඔයාලට කවදාවත් දරුවන්ගෙ ප්‍රතික්ෂේප නොවුණු දෙමාපියො විදියට ජීවිතේ අන්තිම කාලෙ සතුටින් සැනසීමෙන් ගත කරන්න පුළුවන් වේවි.

හෂීණී මනමේන්ද්‍ර

# පෙම් හබයක පැටලුනු මහසෙන්ට හොඳටම තුවාලයි

**'සෝමාවතිය ඇතා'** යනුවෙන්ද බොහෝදෙනා හඳුන්වන මහසෙන් මිනිසුන්ගේ ආදරය, අවධානය දිනාගත් සුන්දර හස්තියෙකි. නමුත් වසර දෙක තුනක කාලයක් තිස්සේ කිසිවෙකුගේ ඇස නොගැටීම නිසා මහසෙන් අතුරුදන්ව ඇති බවට ද කටකතා පැතිරී තිබුණි. ඒ සියලු කයි කතාන්දර වලට පිළිතුරු දෙමින් පහුගියද නැවතත් හෙතෙම පෙනී සිටියේය. ඒ නිකන්ම නොවේ. හොඳ අඩව්වක් ද අල්ලමිනි.

අලි පෙම් පලහිලව්වක් වෙනුවෙන් තවත් ඇතෙකු සමග මහසෙන් ඇල්ලූ මේ අඩව්වෙන් හෙතෙම පැරදී ඇත. එනිසා ඉහින් කනින් තුවාල ලබා සිටියදී ඔහුව සොයාගැනුනේ රිටිගල, මාන්නංකට්ටිය වැවට යාබද මිරිස්වත්ත ග්‍රාමයේ දීය.

සෝමාවතිය අවට රක්ෂිතය සිය වාසභූමිය කරගෙන සිටියත් එක දේශ සීමාවක රැඳෙන්නට බැරි ගාය නිසා මහසෙන් කලින් කලට විවිධ ප්‍රදේශවලට පැමිණෙයි. මින්නේරිය, කවුඩුල්ල වැව් පිටි සිඳී යන කාලයට එහි පැවැත්වෙන මහා අලි රැස්වීමට ද මහසෙන් එක්වෙයි. එම දැවැන්ත අලි රැස්වීම විදේශිකයින් අතරනම් ඉතා ප්‍රසිද්ධ ය. එහෙත් මේ වනවිට මොරගහකන්ද ව්‍යාපෘතිය නිසා මින්නේරිය සහ කවුඩුල්ල ජලාශ පුරවා ඇති බැවින් අලි සභාව විසුරුවා හැරීමට සිදුව ඇත. හයසියයක් පමණ අලි ඇතුන් ඉබාගාතේ යාමට පටන්ගෙන ඇත්තේ ද ඒ හේතුවෙන් විය හැකිය.

සාමාන්‍යයෙන් අලි රංචුවක වගකීම දරන්නේ, වයසින් වැඩි පරිණත ගැහැණු සතෙකි. ශක්තිමත් පිරිමි සතුන් අලි රංචුව සමීපයේ ගැවසුනත් ඒ ඇත්තන්ගේ ප්‍රධාන කාර්යය වන්නේ රංචුවේ ගැහැණු සතුන්ට බැල්ම හෙලන පිටස්තර අලින් පලවා හැරීමයි. ඒ ගැටුමේදී වඩාත් ශක්තිමත් සහ උපක්‍රමශීලී අලියාට ජයග්‍රහණයත් මනමාල පදවියත් යන දෙකම නිතැතින් හිමිවේ.



පශු වෛද්‍ය චන්දන ජයසිංහ



වනජීවී ආරක්ෂක අනිල් විතානගේ

අවශ්‍යතාවය මතු වූ විට සුදුසු සහකාරියක සොයා යාම අලියාගේ ස්වභාවයයි. මහසෙන් ද රිටිගලට පැමිණ ඇත්තේ ඒ රාජකාරිය ඉටු කරගැනීමටයි. මාන්නංකට්ටිය වැවට මේ ආකාරයට මහකනදරාවේ සිට 250 ක 300 ක පමණ අලි නඩයක් පැමිණේ. ඒ අතර නාහෙට නාහන නහරකාරයෝ කිහිප දෙනෙක්ද සිටිති. අග්බෝ, දර්ශන, දප්පුල, ආනන්ද සහ නන්ද ඒ ජාතියේ ඇතුන්ය. ඔවුන්ගේ දළ පිහිටා ඇත්තේද තවත් සතෙකුට පහර දීමට පහසු ලෙසිනි. නමුත් මහසෙන් ඒ අතින් අසරණ ය. ඒ පූට්ටු වී ඇති දළ යුගලයෙන් ප්‍රතිවාදියකු මෙල්ල කිරීමට ප්‍රමාණවත් සහයක් මහසෙන්ට නොලැබෙන නිසා ය.

කලා වැවෙන් හබරණට සංක්‍රමණය වන අලි ඇත්තු ද මේ ප්‍රදේශයේම ජීවත් වෙති. අනෙක් කණ්ඩායම් එන්නේ රිටිගල සහ තිරප්පනේ සිට ය.

මේ කවර කණ්ඩායමක හෝ සාමාජිකයකු සමග පෙම් හුටපටයක් වෙනුවෙන් මහසෙන් කලහ කරගෙන තිබේ. තුවාල දෙස බලන විට පැහැදිලි වන්නේ පහරදීම කර ඇත්තේ ඇතෙකු බවයි. අලංකාර දිගු පූට්ටු දළ යුගලයේ සහය නොලද මහසෙන්ට මිරිස්වත්තෙන් පිටවී යාමට නොහැකි තරමේ හානි සිදුකළ සටන්කාමියා සහකාරියද සමග ජයග්‍රාහී ලීලාවෙන් පිටව යන්නට ඇත. ඉන්පසු හිතත් ගතත් දෙකම තුවාල වූ මහසෙන්ට පිහිට වූයේ පශු වෛද්‍ය චන්දන ජයසිංහ ප්‍රමුඛ කණ්ඩායම සහ ගනේවැල්පල වනජීවී නිලධාරීන් ය.

නමුත් ඔහුට ප්‍රතිකාර කිරීමද ලේසි නැත. එකක් රෝගියා සිටින්නේ වනගතවය. අනෙක් පැත්තෙන් කොතරම් අසනීප වුවද එකතැන රැඳීමක් නැත. එනිසා නිරතුරු ඔහු ගැන ඇස ගසා සිටිය යුතුය.

අද ප්‍රතිකාර කළ පසු ඊළඟ ප්‍රතිකාරය කිරීමට කිලෝමීටර ගණනක් යාමට සිදුවිය හැකිය. එයද වනයේ රිංගා යාමෙනි. අනෙකුත් වන සතුන් මෙන්ම වෙනත් උවදුරුවලින්ද බේරීමට පශු වෛද්‍ය කණ්ඩායමට සිදුවේ. ඒ සියල්ල කළත් අතිවිශාල රෝගියාගේ හැසිරීම ද විශ්වාස කළ නොහැකිය. දැවැන්තයා නිර්වින්දනය කිරීම වුවද පහසු නැත.



'මහසෙන්' නිර්වින්දනය කර ප්‍රතිකාර කරන වනජීවී නිළධාරීන්

ප්‍රතිජීවක ලබාදීම සහ තුවාල මත ඖෂධ ආලේප කළ යුත්තේ ඉන් පසුවය. ඒ බාධක කෙසේ වෙතත් මහසෙන් සුව වන තුරු නියමිත ප්‍රතිකාර ලබාදෙන බව පශු වෛද්‍ය චන්දන ජයසිංහ පවසයි. දරුණු තුවාල කිහිපයක් තිබුනද මේ වනවිට ඒවා සුව අතට හැරෙමින් පවතින බවයි ඔහු ධරණී ට කීවේ. හානිකර මට්ටමේ නොවූව ද කලින් සිදුවූ වෙඩි ප්‍රහාර කිහිපයක කැළැල් ද මහසෙන්ගේ සිරුරේ ඇත.

කෙසේ වෙතත් මේ දක්වා තුවාල සිදුවූ ප්‍රදේශයේම රැඳී සිටින මහසෙන් සම්පූර්ණ සුවය ලැබූ පසු පුරුදු සංචාරය අරඹනු ඇත. එතෙක් වනජීවී නිලධාරීන්ගේ දැඩි රැකවල් මධ්‍යයේ සිටින මහසෙන්ට අවශ්‍ය ප්‍රතිකාර කලට වේලාවට ලබාදීමට පියවර යොදා තිබේ.

අලි සමගම නිතර මුහුවී ක්‍රියා කරන අලි හිතවතෙකු ප්‍රකාශ කළේ මහසෙන් මෙතෙක් කිසිදු මනුෂ්‍යයෙකුට කරදර කර නොමැති බවයි. පෙරමගට ඇදෙන විට ද ඇස් ඉවතට නොගෙන නැරඹීමට හැකි අඩි දහයක පමණ උසකින් යුතු හස්තියාට බොහෝ දෙනෙකු සලකන්නේ මින්නේරිය දෙවියන්ට මෙනි. එනිසා මහසෙන් ගැන දන්නා කිසිවකුත් ඔහුට කරදර නොකරන බව ද හෙතෙම පැවසීය.

මහසෙන් ස්වභාවයෙන්ම ඉතා තැන්පත් ඇතෙකු බව වනජීවී ආරක්ෂක අනිල් විතානගේ කියයි. ඊට උදාහරණ ලෙස ඔහුගේ මතකයේ ඇත්තේ අපූරු සිදුවීමකි.

කවුඩුල්ල වැව් පිටියට අලි ඇතුන් තුන්සියයක් පමණ රැස්ව සිටි මොහොතක රාජකාරි කටයුත්තක් වෙනුවෙන් හෙතෙම ඒ ප්‍රදේශයට පැමිණ සිටියේ ය. අසල ඇල මාර්ගයකට මෙපිටින් ඔහුගේ රථය නවතා තිබිණි. අලි රංචුව සිටියේ ඇල මාර්ගයට එපිටිනි. ආවේගශීලී වසභ ඇතා ද එතැනය. වසභ ගේ දළ දෙපසට විහිදී ඇත. එනිසා පහරදීමට ඉතා පහසුය. අනෙක් අලි ඇතුන් එලවමින් එතැන වීරයාගේ චරිතය රඟ දක්වමින් සිටියේ වසභයි. පෙම්වතියක සොයා ගැනීමට අනෙකුත් පිරිමි සතුන්ට ඉඩක් ඇත්තේම නැත.

කවුරුන් හෝ ඊට උත්සාහ දරයි නම් වසභගේ දළ පහරට ලක්වීමට සිදුවේ. හා හා පුරාකියා මහසෙන් ද කවුඩුල්ලට පැමිණියේ එදිනය. මහසෙන් ඇලෙන් මෙපිටය. ඇල තරණය කර වැව් පිටියට යාම මනා පෞරුෂයක් හිමි හස්තියාට සුලු දෙයකි. එහෙත් මහසෙන් ඇලට මෙපිටින් රැඳී වැව් පිටියේ සිටින අලි රංචුව මැනැවින් නිරීක්ෂණය කළේය.

කැපී පෙනෙන්නේ වසභගේ කලහකාරී හැසිරීමයි. එය නොමනා එකක් බව මහසෙන්ට හැඟෙන්නට ඇත. විනාඩි විස්සක් තිහක් පමණ ගතවිය. මහසෙන් ඇල තරණය කරන පාටක් නැත. විහින් කරදරේ වැටෙන්නේ කුමටදැයි ඇතාට සිතුණා විය හැකිය. දළ යුගලයේ තරම ද හොඳ හැටි දන්නා බැවින් කරදරයකට අත වැනීම අනුචිත නොවන බව ඉවසිලිවන්තයාට වැටහෙන්නට ඇත. එනිසා ඇල තරණය කරනවා වෙනුවට ආපසු හැරුණු මහසෙන් සන්සුන්ව කැලය දෙසට ගමන් ගත්තේය.

තම දුර්වලතා වටහාගෙන එලෙස අවදානම් මඟහැර යන මහසෙන්ට මෙවර වරදින්නට ඇත. නොඑසේනම් ප්‍රේමයට වඩා ජීවිතය වටිනවා යැයි සිතුවා විය හැකිය. ඒ කවරක හෝ අවසන් ඵලය වූයේ පරාජිත සටනකි.

එහෙත් මහසෙන් හෙට නැවතත් ගමන අරඹනු ඇත. සෝමාවතිය, කන්තලේ, ත්‍රිකුණාමලය, සේරුවාවිල, මැදිරිගිරිය, කවුඩුල්ල, මින්නේරිය සහ රිටිගල ආදී ප්‍රදේශවල විසල් සංචරණ පරාසයක මහසෙන් ගමන් ගැනීම සත්ව විද්‍යාත්මකව වාසිදායකය. ශක්තිමත්, සුන්දර අලි පරපුරක් බිහිවීමට ඒ ජාන එකතුවෙන් විශාල මෙහෙයක් සිදුවේ.

එනිසා සෝමාවතිය වැඳ පුදා ගැනීමට ගිය මොහොතක සෝමාවතිය ඇතා දුටුවේ නැතැයි කම්පා වීමට අවැසි නැත. මන්ද, මහසෙන් යනු දීර්ඝ සංචාරකයෙකු බැවිනි.



**තම දුර්වලතා වටහාගෙන එලෙස අවදානම් මඟහැර යන මහසෙන්ට මෙවර වරදින්නට ඇත. නොඑසේනම් ප්‍රේමයට වඩා ජීවිතය වටිනවා යැයි සිතුවා විය හැකිය. ඒ කවරක හෝ අවසන් එලය වූයේ පරාජිත සටනකි**

රෂ්නිකා ලියනගේ

# උබේසේකර කේෂ කල්‍යාණී තෛලය

සුමුදු සුසිනිඳු මොණර පිලක්වන්
කෙස් කළඹක රහස




**අකලට හිස කෙස් ගැලවීම, සුදු වීම, තට්ටය පෑදීම, හිස කෙස් දිරා යාම, තඹ වර්ණ වීම, පීනස් රෝග සමනය කරයි**

අවුරුදු 800කට වඩා ඉපැරණි පුරාණ පුස්කොල පොතකින් උපුටාගන්නා ලද අත්දුටු රහස් වට්ටෝරුවක් අනුව අවුරුදු ගණනාවක් පර්යේෂණ පවත්වා සමන් මල්, සඳුන් මල් ආදී දුර්ලභ වන මල් වර්ග රාශියක් සංයෝග කර මෙම තෙල් නිෂ්පාදනය කර ඇත. අකලට හිස කෙස් ගැලවී යාම, වහා නවතා මොණර පිලක් වන් සිය කෙස් වලින් හිස පුරවාලීමේ පුදුම බලයක් ඇති මෙම තෛලය, අතීතයේ භාරතයේ විසූ රාජකුමාරියන් පවා භාවිතා කළ ශ්‍රේෂ්ඨ බල ඇති තෛලයකි. අකලට හිසකෙස් නොවැටී. නොපැසී විශේෂ අරුම පුදුම බලයක් ඇති, කෙස් සුදුවීම, තට්ටය පෑදීම, උඳුගොව්වන් කෑම නතර කිරීම, හිසකෙස් දිරා යෑම, අඩ වර්ණ වීම, පීනස් රෝග සුව වීම්, හිස්හොරි වළැවීම හිස කැක්කුම, කල්පනාව අඩුකම, නිතර කිවිසුම් යාම, ඇස් දැවිල්ල, ඇස්පෙනීම අඩුකම, කබ කඳුලු ගැලීම ආදී සියලු රෝග වළකයි. හිස කෙස් දික්ව මොණර පිලක් බඳු අලංකාර කේෂ කලාපයක් ලබා ගැනීමට මෙම තෙල් දිනපතා හිස ගල්වන්න.

**සමන් මල් සඳුන් මල් ආදී දුර්ලභ වන මල් තිස් වර්ගයක් සංයෝග කර මෙම තෛලය නිෂ්පාදනය කර ඇත**

මිල රු.370/=



සාම විනිසුරු පාරම්පරික හිස කෙස් රෝග විශේෂ
දේශීය වෛද්‍ය විශාරද
**වෛද්‍ය ශිරෝමණි පණ්ඩිත ආර්. පී උබේසේකර**
කොටියාකුඹුර

035 2289064 | 072 5493435

db
ESTD. 1848
DARLEY BUTLER




# BIO clean


TILE & SURFACE CLEANER

**අද්විතීය හරිත පවිත්‍රකරණ විසඳුම**

BIO DEGRADABLE

**නිෂ්පාදනය** : ඊ. බී. ක්‍රීසි සහ සමාගම පී.එල්.සී
**අලෙවිය** : සී/ස ඩාර්ලි බට්ලර් සහ සමාගම. 98, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10
Consumer Care (011) 4766000
bioclean@darley.lk | www.facebook.com/BioCleanSL
**www.darleybutler.com**

රු. 230/- සිට



# සිරිපා කරුණාකර පහලට බහිද්දී...

# තරුණියක් කර තියාගෙන ආ කෝඩුකාරයෝ

දුරුතු පෝය ලබන්නට තිබුණේ හෝරා දෙක තුනක කාලයකි. පෝය සඳ සිරිපා අඩවියේ නේක රටා මවද්දී සැදැහැතියන් එකම මිනිස් පොදියක්ව ඈතට පෙනුණි. ඉන් පිරිසක් සිරිපා කරුණාකර පහලට එන්නන්ය. අනෙක් පිරිස **'කරුණාවයි කරුණාවයි සමන් දෙවිඳු කරුණාවයි'** කියමින් උඩමළුවට යන්නන්ය. මේ කියන දිනයේ, මේ කියන පිරිස අතරේ කවීෂා හා පූර්ණි යන අක්කා නගෝද උන්හ. ඔවුන් සිරිපා කරුණා කර පහලට එද්දී පාන්දර දෙක පසුවී තිබුණි. ඒ වනවිට දැනුණු සීතල ඇතැමෙකුට දරාගත නොහැකි අයුරින් පීඩා කරද්දී කවීෂාටත් දැනුණේ ඒ සීතල තම ගතට ඔරොත්තු නොදෙනා බවකි. ඇය අක්කාගේ අත තදින් අල්ලා ගත්තේ ඔවුන් ඒ වනවිට තමා ආ නඩයෙන්ද මගහැරී ගොස් සිටි නිසාය.



කවීෂාගේ ජීවිතය බේරාගැනීමට උපකාර වූ නඩය



සිරිපා බිමේ එම අවස්ථාවේ සිටි මහ සෙනගෙන් කොටසක්

**"එතකොට අපි හිටියේ ඇහැළකණුව ළඟ. නංගිට හුස්ම ගන්න බෑ. දැඩි අපහසුවකින් ඇය හිටියේ. ඒ තත්ත්වය එන්න එන්න වැඩිවෙද්දී මටත් කරකියාගන්න දෙයක් තිබුණේ නෑ. අපි එක්ක ඒ වෙලාවේ හිටියේ තව පොඩි ළමයි දෙතුන් දෙනෙක් විතරයි. ලොකු කට්ටිය මගහැරිලා. ඔය අතරේ සමහරු අපිව දැක්කත් නොදැක්ක වගේ ගියා. ඒ වෙලාවේ තමයි තරුණයෝ කණ්ඩායමක් අපිව දකින්නේ. බයයි දුකයි නිසා ඒ මොහොතේ මට හැඬුම් ආවා."**

පූර්ණි කීවාය. සුමන සමන් දෙවිඳුන්ගේ ඇල්ම බැල්ම ඇති අඩවියේ කාගේ හෝ පිහිටක් ඒ මොහොතේ පූර්ණිලාට අවැසිව තිබුණි. පෙර කවදවත් නොදුටුවද ඉහත කී නුගේගොඩ පෞද්ගලික විශ්වවිද්‍යාලයක අධ්‍යාපනය හදරණ සිසු පිරිස ඒ මොහොතේ ඔවුන්ගේ පිහිටට ආවේ මහා මනුස්සකමත් ඉස්සර කරගනිමිනි. නිලංග ගයාෂාන් ඒ නඩයේ කෙනෙකි. ඔහු ඒ මොහොත විස්තර කළේ මෙසේය.

**සීතල වැඩිවෙලා ඇය හිටියේ හුස්ම ගන්න බැරි අපහසුවකින්**

**"අපි ඇහැළකණුව ළඟ නැවතුණා. ඒ රොටියක් කාලා ප්ලේන්ටියක් බීලා යන්න. මම අරුණම අපේ කණ්ඩායමේ හිටපු ගොඩක් අය කෝඩුකාරයෝ. එදා සෙනඟත් ගොඩක් වැඩියි. ඔය අතරේ තමයි දැක්කේ නංගි කෙනෙක් අමාරුවෙන් හුස්ම ගන්නවා. අපි ඒ ළඟට ගියා. සීතල එක්ක එයාට අමාරුයි. අපි දන්න ප්‍රථමාධාර දීලා කෝපිත් පෙව්වා. ඒත් එයාගේ තත්ත්වයේ වෙනසක් වුණේ නැහැ. අපේ හිතටත් බයක් ආවා ඇයගේ ජීවිතය ගැන. ඊටපස්සේ අපේ නඩේ අය ඇයව ඔසවාගෙන පහලට එන්න ගත්තා."**

නිලංග කියනා පරිදි ඇයව පහලට රැගෙන ඒම අතිදුෂ්කර ගමනකි. එකක් මග සෙනඟ ගොඩේ පහලට ඒම ඒ රැයේ ඉතාමත්ම සීරුවට කළ යුතුව තිබූ හෙයිනි. සුළඟත් සීතලත් ඔවුන්ගේ ගමනට බාධා කරමින් තිබුණි.

**"ඇත්තටම ඒ වෙලාවේ මහ සෙනඟක් හිටි නිසා පහලට එන්න ලොකු කට්ටක් කන්න වුණා. සමහර මිනිස්සු ලෙඩෙක් අරන් යනවා කියලා පෙනි පෙනිත් අපට ඉඩ දුන්නේ නෑ. අපි බොහොම අමාරුවෙන් ඉඩ හදන් පහලට ආවා. පස්සේ අපි 1990 ගිලන් රථයකට කතා කරලා නල්ලතන්නියට ගෙන්න ගත්තා. මේ අතරේ එයාගේ අක්කවත් අපිට මගහැරිලා. කොහොමහරි ගිලන් රථය ළඟට ආවම තමයි ඒක දන්නේ. භාරකාරයෙක් නැතුව ලෙඩාව බාරගන්න බෑ කියද්දි, අපේ බැච් එකේ අක්කලා දෙන්නෙක් තමයි භාරකාරයෝ විදියට ඒ නංගි එක්ක රෝහලට ගියේ."**

කවීෂාව රෝහල්ගත කළ තරුණයන්ට දැනගන්නට ලැබුණේ තව පමා වූයේ නම් කවීෂාගේ තත්ත්වය බොහෝ නරක අතට හැරෙන්නට ඉඩ තිබූ බවයි. පූර්ණි රෝහලට යද්දී දයාබර සිත් ඇති තරුණ තරුණියන් තම නැගෙනිය රෝහල්ගත කර ඇයට අවශ්‍ය ප්‍රතිකාර කඩිනමින් ලබාදීමට අවශ්‍ය පහසුකම් සලසා තිබුණි. එය පූර්ණිට මහා සැනසුමක් වූයේ ඒ මොහොතේ නඩයද මගහැරී තමන් පත්ව සිටි අපහසුව, අසරණකම නිසාය.

**"නංගිට හුස්ම ගන්න අමාරු වෙද්දි ලොකු බයක් හිතේ තිබුණේ. ඇයට කතා කරගන්නත් බෑ. ඒත් ඒ අයියලා, දෙවිවරුන් වගේ මගේ පුංචි නංගි බේරලා දුන්නට ගොඩක් ස්තුතියි. ඒ වගේම එයාලට ගොඩක් පිං."**

පූර්ණි කියන්නේ හදවත රැඳි මහත් ගෞරවයකිනි.

මේ වනවිට එදා රෝහල්තත වූ කවීෂා දැන් සුවෙනි.

ඇය එදා විඳි පීඩාවත්, තම ජීවිතය බේරා දෙන්නට මහත් කැපවීමක් කළ තරුණ තරුණියන් පිරිස ගැනත් කීවේ මෙවැනි කතාවකි.

**"අපි සිරිපා කරණා කරලා පහලට එද්දි සීතලයි. ඒ වෙලාවත් රෑ එකට දෙකට ළංවෙලානේ. මගේ අක්කයි, අපේ නඩේ ගිය පොඩි අය දෙතුන් දෙනෙකුයි විතරයි ඒ වෙලාවෙ ළඟ හිටියේ.**

**මට යන්තමට මතකයි ඒ අයියලා මාව කරෙන් පහලට ගෙනා හැටි. කවදාවත්ම නොදැකපු පිරිසක් වුණත් ඒ මනුස්සකමට ගොඩක් ස්තුතියි."**

**ඒ අයියලා දෙවිවරු වගේ. මගේ පුංචි නංගි බේරලා දුන්නට ගොඩක් පිං**


කවීෂා කියන්නීය. උදව්වක් අවැසි මොහොතක උදව්වක් කරන්නටත් ඒ උදව්වෙන් කෙනෙකුගේ ජීවිතය බේරා දෙන්නටත් හැකි නම් ඒ තුළ වන මනුස්සකම කොතරම් දැයි අමුතුවෙන් කිව යුතු නෙවේ.

සැබෑවටම අපිට අවශ්‍ය වන්නේ එවන් මනුස්සකම් පිරි සොඳුරු මිනිසුන් මිස එම අවස්ථා මග හරින, ඊට උසුළු විසුළු කරන්නන් නොවේ. මෙම තරුණයින්ට ඒ මනුස්සකම වෙනුවෙන් නොමසුරුව මල්මිටක් දෙන්නේ එබැවිනි.

**දීපා වසන්ති එදිරිසිංහ**
**රුවන් එස්.සෙනවිරත්න**


ආදරණීය නවාතැන!
SANTORINI
Resort Apartments & Residencies
Negombo
මීගමුව
ලක්ෂ 229 සිට
2BR | 3BR | 4BR
Apartments and Villas
PropertyGuru
ASIA PROPERTY AWARDS 2021
WINS BEST DEVELOPER SRI LANKA
4TH PROPERTYGURU ASIA PROPERTY AWARDS 2021
SRI LANKA'S 1ST THEME PARK STYLE
RESORT APARTMENTS & RESIDENCIES
Water Park | Kids Park | Wellness Park | Entertainment Park | Food Park | Game Park | Fitness Park | Community Park | Green Park
9+ THEME PARKS
50+ ACTIVITIES
Model Apartment is ready for inspection
මුලින් ලක්ෂ 10ක් ගෙවා ඉතිරිය මාස 18න්
පොලී රහිතව හෝ බැංකු ණය මගින් ගෙවන්න.
Sampath Bank
WE PRESENT YOUR FUTURE
HNB
NSB
SEYLAN BANK PLC
The bank with a heart
DFCC BANK Keep Growing
NDB bank
HOME LANDS SKYLINE
INNOVATION AND EXCELLENCE
0703 333 777
No. 1060, Pannipitiya Road, Battaramulla. (+94)011 2 888 777
We're reachable through
zoom
"LIFE AT SANTORINI"
www.homelandsskyline.lk

# විභාගෙ ලියන්න ඔබේ දරුවාටත් දෙයියෝ එවපු පෑනක් හම්බවුණාද?













දරුවන්ටත් වඩා අම්මලා මහන්සි වෙන විභාගය තමයි ශිෂ්‍යත්ව විභාගය කියන්නේ. ඒක තිබුණේ ජනවාරි 22 වෙනිදා. ඒ වගේම සාමාන්‍ය පෙළ විභාගයත් හෙට අනිද්දට පටන් ගන්නවා. සාමාන්‍ය පෙළ කෙසේ වෙතත් ඔය ජනවාරි 22 වෙනිදා තිබුණු පහේ ශිෂ්‍යත්ව විභාගය ඉවර වෙනකල් අපිත් ඇඟිලි ගැන්නා. ඒ ඔබට එක්තරා විදියක කතාවක් කියන්න. මේ කතාව වැදගත් වෙන්නේ නොතේරෙන දරුවන්ට වඩා තේරෙන අම්මලාට. ඒ හින්දා අම්මලා මේ ලිපිය කියවනවා නම් අපිටත් සතුටුයි.

ශිෂ්‍යත්ව විභාගය කට උඩට එද්දිම ඔය ශිෂ්‍යත්ව විභාගය ලියන්න බලගතු පෑනක් පැන්සලක් රට වටෙන්ම උඩට ආපු හැටි මතකයිනේ. එක එක දෙවිවරුන්ගේ ආශිර්වාදයෙන් බලගන්වපු ඒ පෑනෙන් පැන්සලෙන් විභාගය ලිව්වම දරුවෝ උඩින්ම පාස් වෙනවා කියලා තමයි කියලා තිබුණේ. ඒ හින්දම ඔය බලගතු පෑන් පැන්සල් ගැන අපිත් පහුගිය ටිකේ හොයලා බැලුවා.

සමහර පත්තරවල පවා මම දැක්කා අහවල් දවසේ අහවල් තැනට ආවොත් ශිෂ්‍යත්ව විභාගය වෙනුවෙන් බලගන්වපු පෑන් පැන්සල් දෙන කතාවක්. ඉතින් ඔය විදියට පෑන් පැන්සල් අරගනිපු කෑගල්ල පැත්තෙ අම්මා කෙනෙක් එක්ක දවසක් නිකමට වගේ කතා කරන්න ලැබුණා.

**"අපේ පුතාටත් මේ පාර ශිෂ්‍යත්ව විභාගය ලියන්න අර බලගතු පෑනකුයි පැන්සලකුයි හම්බුණා."**

**"මට තේරුණේ නෑ."**

**"ඇයි දන්නේ නැද්ද දරුවගේ ශිෂ්‍යත්ව පන්තිය තිබුණු අන්තිම දවසේ පෑනකුයි පැන්සලකුයි බෙදුවා."**

**"ඉතින්..."**

**"ඒ දෙකම බලගතුයි. දෙවියෝ ළඟ ජීවං කරපුවාලු."**

**"ඒවා කොයි වගේද?"**

**"පෑන නම් ඔය රුපියල් දහයට කඩේ ගන්න තියෙන පෑනක්. ඒත් ඒකට මොකක්ද බලයක් තියෙනවලු."**

**"එතකොට පැන්සල කොයි වගේද?"**

**"ඒකත් කඩේ තියෙන ජාතියේ එකක්."**

**"අනේ මන්දා..."**

**"නෑ නෑ මල්ලි ඒක ඇත්තම ඇත්ත. අපේ අල්ලපු ගෙදර ළමයා ගිය සැරේ ඒ පෑනකින් ශිෂ්‍යත්වේ ලිව්වේ..."**

**"ඉතින් පාස්වුණාද?"**

**"ආයෙත් අහලා, ලකුණු 170 ක්ද කොහෙද තිබුණනේ."**

අම්මලා මොනවා කිව්වත් ඒ පෑනක් පැන්සලක් හම්බුණු දරුවෝ නම් මාර සතුටින් විභාගයට යන්න ඇති කියලා මටත් හිතුණා. පස්සේ මං ඔය ශිෂ්‍යත්ව පන්ති කරපු දන්න කියන ගුරුවරු කීපදෙනෙක්ම හම්බෙලා ඔය බලගතු පෑන් පැන්සල් කතාවේ ඇත්ත නැත්ත ඇහුවා. එහෙම එක්තරා ටියුෂන් ගුරුවරයෙක් හිනාවෙලා මෙහෙම කිව්වා.

**"මොන බොරු වැඩද මල්ලි. අපිත් ගිය අවුරුද්දේ එහෙම පෑනක් දුන්නා. අපිත් කිව්වා ඒක මහා බලගතු පෑනක් පැන්සලක් කියලා. එතකොට ළමයින්ගේ හිතට මාර ගැම්මක් එනවා. ඇත්තටම ඒක අපි සිදුකරන මනෝ විද්‍යාත්මක දෙයක්. ඔය පෑන පැන්සල ගන්න ළමයා ඒක පරිස්සම් කරගෙන ගිහින් විභාගය ලියනවා. ඇත්තටම ඔය පෑන් පැන්සල් නිකන්ම ටවුමේ කඩෙන් අරන් බෙදන එව්වා. ඒවගේ ඇති කිසිම අමුතු බලයක් නෑ."**

ඇත්තටම ඔය පෑන් පැන්සල් නිකන්ම ටවුමේ කඩෙන් අරන් බෙදන එව්වා. ඒවගේ ඇති කිසිම අමුතු බලයක් නෑ

ටියුෂන් ගුරුවරුත් ඉතින් තමන්ගේ වාසියටනේ කතාව. ඒ හින්දා අපි මේ සම්බන්ධයෙන් තවත් විශේෂ පුද්ගලයෙකුගෙන් විමසීමක් කළා. ඒ ජ්‍යේෂ්ඨ මනෝ උපදේශක, මනෝ චිකිත්සක, වෛද්‍ය චමින්ද වීරසිරිවර්ධන මහතාගෙන්. ටියුෂන් ගුරුතුමා කියපු විදියට ළමයින්ට විභාගෙ ලියන්න 'මාර ගැම්මක්' එන්න මෙහෙම රැවටීම් කරන එක හොඳද කියන එක ගැන වගේම සමස්ත ශිෂ්‍යත්ව විභාගය ගැනම මෙන්න මෙහෙම කතාවක් තමයි ඔහු කිව්වේ.

මේකත් හරියට අර ඉන්දියාවේ ළමයි නැති අම්මලාට ශිව ලිංග ගාවට ගිහින් ඒක කිරිවලින් නෑව්වම දරුවෝ ලැබෙනවා කියනවා වගේ කතාවක්

**"නිකන් හිතන්න ඔය දෙනවයි කියන බලගතු පෑන හෝ පැන්සල නැති වුණොත්, බිම වැටිලා උල කැඩුණොත්, හදිසියේ හරි ලියැවෙන්නේ නැතුව ගියොත් ඒ නැත්නම් ඒකෙන් ලියන්න බැරි වුණොත්, ශිෂ්‍යත්වෙට යද්දි හදිස්සියේ හරි ඒක අරන් යන්න අමතක වුණොත් ඒ දරුවා මනසින් කොච්චර වැටෙනවද කියලා. ඒකෙන් වෙන්නේ දරුවා අනිසි ලෙස බයවෙලා දඩිය දාලා කාංසාවට පත්වෙලා දන්න දේවත් ලියාගන්න බැරිව යන එක. මොකද දරුවා තුළ මිථ්‍යාව ඇතිවෙලා තියෙන්නේ එහෙමයි.**

**දරුවගේ මානසික මට්ටමට ඒක ලොකුවටම බලපානවා. ඒ හරහා විභාගය අවුල් වෙනවා. ඇයි ඉතින් දරුවගේ ඔලුව ඒකෙන් ලියන තැනට හදලනේ තියෙන්නේ. දරුවොත් හිතනවා ඒ පෑනකින් පැන්සලකින් ලිව්වොත් සේරම හරි කියලා. මේ විදියට දරුවෝ රවට්ටන්න එපා. මේකත් හරියට අර ඉන්දියාවේ ළමයි නැති අම්මලාට ශිව ලිංග ගාවට ගිහින් ඒක කිරිවලින් නෑව්වම දරුවෝ ලැබෙනවා කියනවා වගේ කතාවක්.**

**මං නම් කියන්නේ ශිෂ්‍යත්වය කියන්නේ ඉතා හොඳ විභාගයක්. හැබැයි ඒක ළමයින්ට ඔවුන්ගේ නිදහසේ ලියන්න දෙන එකයි වටින්නේ. ඒකට ළමයි පුහුණු කරවන එක වහාම නවත්තන්න ඕනේ. ශිෂ්‍යත්වය අස්සේ තියෙන බාහිර ක්‍රියාකාරකම් රජය මැදිහත්වෙලා හරි තහනම් කරලා දන්න ඕනේ. ටියුෂන් ගුරුවරු ළමයි අල්ලගන්න මොනවද නොකරන්නේ කියන්නකෝ. අමුතු පෝස්ටර් ගහයි. බලගතු පෑන් පැන්සල් බෙදයි. ලස්සන ලස්සන ටියුට් දෙයි. තව වැඩ කෝටියයි.**

**ගම්වල නුගත් දෙමව්පියෝ මේ දේවල්වලට ඇන්දෙනවා. අන්න ඒ ඇන්දෙන ඇන්දිල්ල යන්නේ දරුවන්ගේ පිටින්. ඒ නිසා දෙමව්පියෝ දරුවෝ ගැන මීට වඩා හිතන්න ඕනේ. ඇත්තටම කිව්වොත් බලගතු පෑන් පැන්සල් කියලා ජාතියක් නෑ.**

**එහෙම තියෙනවා නම් අපේ රටේ කිසිම විභාගයකින් දරුවෙක් ෆේල් වෙන්න බෑනේ. ඒ නිසා ඔය වගේ මිථ්‍යාවන්ට රැවටෙන්න එපා."**

කොහොම වුණත් අපිට අවසාන වශයෙන් කියන්න තියෙන්නෙ මෙච්චරයි. ඔහොම බලගතු පෑන් පැන්සල් තියෙනවා නම් ශිෂ්‍යත්ව විභාගය ලියන කිසිම ළමයෙක් ඒක ෆේල් වෙන්නේ නෑ.

ඒ වගේම එහෙම පෑන් පැන්සල් තියෙයි නම් ලෝකයේ අධ්‍යාපනය අතින් අපිට වඩා පොහොසත් සුපිරි රටක් තවත් නෑ කියන එකත් මතක තියාගන්න.

**භාතිය වෙඩිවර්ධන**


CONNECT
LIKE A
BOSS!
SMARTPHONE
TABLET
GAMING
SMART TV
LAPTOP
IOT
SELECT ALL
ශ්‍රී ලංකාවේ ප්‍රථම වේගවත්ම
සහ පුළුල්තම PREMIUM FIBRE
අන්තර්ජාල ආවරණය සමඟින් එකවර
smart devices කිහිපයකින් සම්බන්ධ වී
සුපිරි වේගවත් බවේ අසමසම අත්දැකීම විඳගන්න!
FIBRE | දේශයේ ෆයිබර් බලවේගය
sltgo
ඔබ කොහේ ගියත් ඔබේ
Home Broadband පහසුකම
SLTGO සමඟින් අත්විඳින්න
මිලියන 23ක්
දිවයින පුරා සහ
ලොව පුරා Hotspots
FibreOn
BROADBAND
PEO TV
VOICE
Get Fibre.
Call FibreOn
on 1212.
www.sltmobitel.lk
SLTMOBITEL
එකම එක සබැඳියාව

# අවුරුදු හයේ ඉඳලා කොකේන් ගහපු මමත් වෙනස් වුණානම් කාටද වෙනස් වෙන්න බැරි!




## උපන්දා සිට වසර හතළිහක් මතින් ජීවත් වූ කතකගේ කතාව

**"ජීවත්වීම තදබල විහිළුවක් ලෙසයි මට දැනුණේ. දරුවෙකු ලෙස මා මුහුණදුන් බොහෝ දේ කුමක් නිසා වුණාද කියලා මට අදටත් හිතාගන්න බෑ. ඒත්, අද ඒ සියල්ල වෙනස්. ඒ අත්දැකීම් සියල්ල තවත් අයෙකුට පිහිට වීම වෙනුවෙන් මට ලැබුණු බවයි මම විශ්වාස කරන්නේ."**

සිය ජීවිතය උඩු යටිකුරු කිරීමෙන් පසු ජිනී බර්ට්න් සිතන්නේ එලෙසිනි.

**"වයස අවුරුදු 39 දී මගේ පෙනුමයි, ඊට අවුරුදු දහයකට පස්සෙ අද තියෙන පෙනුමයි හාත්පසින්ම වෙනස්. ඒ කාලේ මම ඇන්දේ පුංචි දරුවෝ අඳින ප්‍රමාණයේ කුඩා ඇඳුම්. ඇවිද්දෙත් මළ මිනියක් වගේ. දැන් මම සෞඛ්‍ය සම්පන්නයි. මට මගේ ජීවිතය වෙනස් කිරීමට හැකි වුණා කියන්නේ ඕනෑම කෙනෙකුට තමන්ගේ ජීවිතය වෙනස් කරන්න පුළුවන් කියන එකයි."**






1972 දී ඇමරිකාවේ උපන් ජිනී බර්ට්න්ගේ ළමා කාලය කිසිසේත් සුන්දර නැත. ඇගේ මව දැඩිලෙස මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී සිටි තැනැත්තියකි. එමෙන්ම ඇය මානසික රෝගියකුද විය. පියා ඒ වනවිට සිටියේ සිරගතවයි. කුඩා ජිනීට හැදී වැඩෙන්නට සිදුවුණේ මත් සුළියක සිරවය. තමාට කිරීමට සිදුවන ඇතැම් දේ වැරදි බව කුඩා දැරියගේ සිතට දැනුණද ඉන් මිදීමට ඇගේ පරිසරය ඇයට ඉඩ දුන්නේ නැත. ජිනීගේ මව ඇයට මත්කුඩු හඳුන්වා දී තිබුණේ වයස අවුරුදු හයේදීය. වයස අවුරුදු 14ක් වනවිට ඇය කොකේන් භාවිතයට දැඩි සේ ඇබ්බැහිව සිටියාය. සියලු සබඳතාද මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් සමඟිනි. තමා මුහුණ දී සිටින ව්‍යසනය වටහා ගැනීමට නොහැකි තරමට ජිනී සිටියේ මතෙහි ගොදුරක් වීය. මේ අතර හැදුණු වැඩුණු පරිසරයේ සියලු නොපනත්කම්වලට මුහුණ දීමටද ඇයට සිදුවිය. වරක් සිය මවගෙන් මත්ද්‍රව්‍ය මිලදී ගැනීමට පැමිණෙන අයෙකු අතින් දූෂණයට ලක්වූ ජිනී සියදිවි නසා ගැනීමටද උත්සාහ දරා ඇත.

වයස අවුරුදු විසි තුනක් වනවිට ඇය දෙදරු මවක් බවට පත්ව සිටියාය. එහෙත් ඇගේ පැවැත්ම නිසා දරුවන් ඇගේ භාරයෙන් ඉවත් කිරීමට කටයුතු කෙරිණි. ඒ වෙද්දී ඇය හෙරොයින්වලට දැඩි සේ ඇබ්බැහිව සිටියාය. මත්ද්‍රව්‍ය ලබාගැනීම සඳහා ඕනෑම දෙයක් කරන මට්ටමකයි ඇය සිටියේ. සොරකමද එහි ප්‍රතිඵලයකි. බරපතළ වැරදි 17කට වරදකාරිය වූ ඈ තුන් වතාවක්ම සිර දඬුවම් වින්දය. උන්හිටි තැන් අහිමිව මංමාවත්හි දිවි ගෙවනවිට ජිනීට අනාගතය ගැන කිසිඳු හැඟීමක් නොවීය.

**"පාරට වැටිලා, අසූචි ගඳ ගසමින් කිසිඳු නෑමට ඉඩක් නොලැබෙනකොට ඔබ කොහොමද සමාජයට සේවයක් කරන්නෙ? ඔබේ ඇබ්බැහි වීම් ඔබටත් වඩා විශාල වුණාම ඒවා නඩත්තු කරනවා මිසක් සේවයක් කරන්න ඉඩ ලැබෙන්නෙ නෑ. ඔබ පාරෙ ඉන්න මිනිස්සුන්ගෙ ගොදුරක් වෙනවා. එතකොට ඔබට බලාපොරොත්තුවක් කොහෙන්ද? ඔබේ ජීවිතය ඔබටම දරාගන්න බැරිවෙනවා. එවිට ජීවත්වනවාට වඩා මියයාම හොඳ බව හිතෙනවා. මගේ ඇබ්බැහිවීම් නිසා මම ගතකළේ එවැනි ජීවිතයක්. කොයි මොහොතක හරි කවුරුන් හෝ මාව පුපුරුවා හරියි කියන බලාපොරොත්තුවෙනුයි මම හිටියේ."**

**පාරට වැටිලා, අසූචි ගඳ ගසමින් කිසිදා නෑමට ඉඩක් නොලැබෙනකොට ඔබ කොහොමද සමාජයට සේවයක් කරන්නෙ? ඔබේ ඇබ්බැහි වීම් ඔබටත් වඩා විශාල වුණාම ඒවා නඩත්තු කරනවා මිසක් සේවයක් කරන්න ඉඩ ලැබෙන්නෙ නෑ. ඔබ පාරෙ ඉන්න මිනිස්සුන්ගෙ ගොදුරක් වෙනවා**

බන්ධනාගාරගතව සිටි සෑම වතාවකදීම නිවැරදි වීම සඳහා ජිනීට අවස්ථාව හිමි වුණත් ඇය එහි ප්‍රතිඵල නොගත්තාය. නැවත නැවත පුරුදු ජීවන රටාවටම අවතීර්ණ වූවාය.

2012 ජිනීගේ තීරණාත්මක වසරයි. එවිට ඇයට වයස අවුරුදු හතළිහකි. සොරාගත් ට්‍රක් රථයකින් පළා යමින් සිටියදී පොලිසිය ඇය ලුහුබැඳ ගියේය. හොරා-පොලිස් ක්‍රීඩාව නැවතුණේ රථය ගසක ගැටීමෙනි. එය ජිනීගේ ජීවිතයේ වෙනසකට මග කීවේය. මේ රුදුරු සිහිනයෙන් අවදි විය යුතු බව ජිනී තීරණය කළේ ඒ මොහොතේය. අත්අඩංගුවට ගනු ලදුව පොලිස් රියේ පසුපස අසුනට බර දුන් ජිනී මේ ජීවිතය අතහරින බවට තමාටම පොරොන්දු වූවාය. අධිකරණ නියෝගය මත වොෂින්ටනයේදී අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව ඇයට හිමිවිය. සැබෑවටම ඈ ඉගෙනීමේ හපනියකි. සිය ජීවිතය කෙතරම් නාස්ති වී ඇතිද යන්න ඇයට ඒත්තු ගියේ එහිදීය. අධ්‍යාපනයට මෙන්ම ආගමානුකූලව දිවි ගෙවීම කෙරෙහිද ඇගේ නැඹුරුව විශේෂිත විය.

**දෙවියන් මං දිහා බලාගෙන ඉන්නවා ඇති. මගෙ වැරදි සියල්ලට සමාව දෙන්න ඇති. ඒ නිසා මං සමාජයට මගෙන් විය යුතු දේ ඉටු කරනවා**

ඉගෙනුම් කටයුතු විශිෂ්ට අන්දමින් සිදුකළ ජිනී බර්ට්න් වොෂින්ටන් සරසවියට ඇතුළත් වූවාය. එහිදී ඈ හැදෑරුවේ දේශපාලන විද්‍යාවයි. ඇයට ශිෂ්‍යත්වයක්ද හිමිවිය. අධ්‍යාපන ආයතන පනස් පහකින් ශිෂ්‍යත්ව ලැබීමට සුදුසුකම් ලද සිසු සිසුවියන් හැට දෙදෙනා අතරට තමාගේ නමද ඇතුළත් වීම ජිනීට පුදුමයක් විය.

**"ඔබට වැරදීමක් වෙලා. ඔබ දන්නෙ නෑ මම කවුද කියන එක. එනිසයි මෙතරම් වටිනා ශිෂ්‍යත්වයකට මා තෝරාගෙන තියෙන්නෙ."**

ශිෂ්‍යත්වය හිමිවීම ගැන ඇය සිය මතය දැක්වූයේ එලෙසිනි. එහෙත් ඊට ලද පිළිතුර ඇගේ හදවතේ ගැඹුරට කිඳා බැසීය.

**"අපි දන්නවා ඔබ කවුද යන වග. එනිසයි ඔබව තෝරාගත්තේ."**

වයස අවුරුදු හතළිහේදී මත්ලෝලී සෙරක වූ ජිනී ඉන් වසර අටකට පසු සම්පූර්ණයෙන් මතින් මිදුණු උපාධිධාරිනියක වූයේ ඒ සියල්ල මෙන්ම තමාගේම අවංක උත්සාහය හේතුවෙනි.

**"ජීවත්වීමට කිසිඳු ආසාවක්, බලාපොරොත්තුවක් නොතිබුණු මා අදටත් ජීවත් වෙනවා. මා මිය නොයන්නට ඇත්තේ මගෙන් මේ සමාජයට සේවයක් විය යුතු නිසා කියලයි මම විශ්වාස කරන්නෙ. දෙවියන් මං දිහා බලාගෙන ඉන්නවා ඇති. මගෙ වැරදි සියල්ලට සමාව දෙන්න ඇති. ඒ නිසා මං සමාජයට මගෙන් විය යුතු දේ ඉටු කරනවා."**

මේ වනවිට ජිනී ඇතුළතින් මෙන්ම බාහිරින්ද සම්පූර්ණයෙන්ම වෙනස්ය. වසර හතළිහක් පුරා ගමන්ගත් වැරදි මාවත වෙනුවට නිවැරදි මාර්ගයට පිවිසීමට ඈ සමත් වූවාය. සිය සැමියා ක්‍රිස් සමඟ ජිනී මේ වනවිට සාර්ථක දිවියක් ගෙවන්නීය. සිය දරුවන්ට ඈ දැන් සැබෑ මවකි. විවිධ සමාජ ක්‍රියාකාරකම් සඳහාද ඇය නිරතුරු දායක වන්නීය.

ඒ අතර ඇය අපූරුවට ජීවිතය විඳින්නීය. තමාට අහිමි වූ දේ වෙනුවෙන් ලෝකයට වෛර කරනවා වෙනුවට මිනිසුන්ට ජීවිතය දිනීමට ඈ මග පෙන්වන්නීය. ඇය පවසන පරිදිම ඕනෑම අයෙකුට සිය ජීවිතය නිවැරදි මාවතට රැගෙන යා හැකිය. කිසිවකුත් කිසිවකට ප්‍රමාද නැත. අවශ්‍ය වන්නේ ඒ වෙනුවෙන් උත්සාහ කිරීම සහ විශ්වසනීය පළමු පියවර තැබීම පමණි.

**රෂනිකා ලියනගේ**

ලංකාවේ දරුපල පමාව සඳහා වඩාත් සාර්ථකව ප්‍රතිකාර කරන

ෆර්ටි ඒඩ් ආයතනය

අවුරුදු 25 සපුරා SILVER JUBILEE

26 වන වසරට පා තැබූ වගයි...

ඔබ දරුපල පමා වූ අයෙක්ද?
මේ ආරංචිය ඔබටයි



# අද බොහෝවිට ඔබට ලැබෙන්නේ නිවැරදි ප්‍රතිකාරය නොවේ?

**පුංචි සෙල දෙකක් එක්වී දරුවෙකු පිළිසිඳ ගැනීමේ ක්‍රියාදාමය අද සිට කියවා තේරුම් ගනිමු.**

## පිරිමියෙකුගේ ශුක්‍රාණුවක් හා කාන්තාවකගේ ඩිම්බයක් සම්බන්ධ වී දරුවෙකු බිහිවීම මිනිස් සිරුර තුළ සිදුවන අපූර්වම සිදුවීමක්

**විශේෂයෙන්ම ඔබ දරුඵල පමා වූවෙක් නම් ඒ කතාන්තරය තේරුම් නොගෙන ඔබට දරුඵල පමාවුණේ ඇයි දැයි තේරුම් ගන්නට අපහසු වේවි. ඔබ මෙතෙක් ලද ප්‍රතිකාර වැරදී ගියේ ඇයි දැයි තේරුම් ගන්නටත් බැරි වේවි.**

### කාන්තාවකගේ බීජයක් වර්ධනය වන තැනින් අපි කතාව පටන් ගනිමු.

**කාන්තාව මුළු ජීවිත කාලයක් පිට කරන බීජ තම ඩිම්බ කෝෂවල දරා ගෙන මෙලොවට බිහිවෙනවා. වැඩිවිය පැමිණි දා සිට මාසයෙන් මාසය එකින් එක ඒ බීජ පිට කරනවා. මාස් ශුද්ධියක් ආරම්භ වෙන කොටම බීජයක් මෝරන්න පටන් ගන්නවා. බීජය මෝරන්න දින 13-14 ක් පමණ ගත වෙනවා. මෝරා පරිණත තත්ත්වයට පත්වෙන බීජය 13 වන දිනයේ සවස් කාලය වන විට ඩිම්බ කෝෂයෙන් පිටවෙලා පැලෝපීය නාලයට ඇතුළු වෙනවා.**

පැලෝපීය නාලයට ඇතුළු වෙන බීජය හෙමින් හෙමින් ගර්භාෂය දිහාවට පැලෝපීය නාලය දිගේ තල්ලු වී යනවා.

ඩිම්බ කෝෂයෙන් පැලෝපීය නාලයට ඇතුළු වන බීජය ජීවත් වන්නේ දින දෙකක් පමණයි. ඒ දින දෙක අතරතුර පුරුෂ ශුක්‍රාණු හමුවුවහොත් කලලයක් බවට පත්වෙලා ගර්භාෂය කරා යන ගමන දිගටම කරගෙන යනවා. පුරුෂ ශුක්‍රාණුවක් හමු නොවුණහොත් දින දෙකකට පසු පැලෝපීය නාලය තුළදීම බීජය විනාශ වී යනවා.

එහෙම වුණොත් තවත් දින 14 ක් ගතවූ තැන මාස් ශුද්ධිය ඇති වෙනවා.

කාන්තාවකට නිවැරදිව බීජ වැඩීම සිදුවෙනවා නම් දරු පිළිසිඳ ගැනීමක් සිදු නොවන මාස වලදී දින 28 කින් මාස් ශුද්ධිය ඇති වෙනවා.

**මාස් ශුද්ධිය දින 28 වරක් සිදු නොවෙනවා නම් එය බීජ වර්ධනයේ යම් දෝෂයක් ඇති බවට හොඳම සාක්ෂියක්. එහෙම කාන්තාවකට දරුඵල නොලැබෙන්නේ බීජ වර්ධනය හරි හැටි සිදු නොවෙන නිසයි.**

### බීජ වර්ධනයත් මාස් ශුද්ධියත් දින 28 කට වරක් සිදුවන්නේ කවර බලපෑමකට ද ?

බීජ වර්ධනයත් මාස් ශුද්ධියත් පාලනය වන්නේ ඒ අදාළ කාන්තාවගේ හෝමෝන වලිනුයි. මොළයට පහළින් පිහිටා ඇති කුඩා ග්‍රන්ථියක් වන පිටියුටරි ග්‍රන්ථියෙන් ස්‍රාවය වන හෝමෝන අතුරෙන් හතර වර්ගයක් බීජ වර්ධනය පාලනය කරන්න දායක වෙනවා.

***FSH, LH, Prolactin*** හා ***TSH*** ලෙස මේ හෝමෝන හතර නම් කරලා තියෙනවා.

මින් ***FSH*** හා ***LH*** බීජ වර්ධනයට බලපාන ප්‍රධාන හෝමෝන දෙකයි.

***Prolactin*** (ප්‍රෝලැක්ටීන්) බීජ වර්ධනයට අමතරව දරුවෙකු බිහි කළ කාන්තාවගේ කිරි ස්‍රාවයට ද උදව් වෙනවා.

***TSH*** තයිරොයිඩ් ග්‍රන්ථියේ ක්‍රියාකාරිත්වය පාලනය කරන හෝමෝනයයි. ***TSH*** වල පාලනයට අනුව තයිරොයිඩ් ග්‍රන්ථියෙන් ***T3*** හා ***T4*** යන තයිරොක්සීන් හෝමෝන දෙක ස්‍රාවය වෙනවා. මේ හෝමෝන ත්‍රිත්වය බීජ වර්ධනයට බලපෑම් ඇති කරනවා.

***FSH*** හා ***LH*** හෝමෝන දෙවර්ගයම 10ට අඩු අගයක පැවතිය යුතු අතර ***LH*** හෝමෝනය, ***FSH*** හෝමෝන අගයෙන් භාගයක් පමණ ප්‍රමාණයේ පැවතීම සාමාන්‍ය තත්වයයි.

***Prolactin*** හා ***TSH*** හෝමෝන දෙකත් බීජ වර්ධනය සාර්ථකව සිදු වන්නට සාමාන්‍ය පරාසයේ තිබිය යුතුයි.

දරුවෙකු පිළිසිඳ ගැනීමේ කතාන්දරය අද මෙතැනින් නවත්වනවා. ඊළඟ සතියේ ඊළඟ පියවර ගැන කතා කරමු.

## දරුඵල පමාවීමට බහුලම හේතුව බීජ වර්ධනය අඩාල වීමයි

කලින් සඳහන් කළා වගේම කාන්තාවකගේ බීජ වර්ධනය හරියාකාරව සිදුවනවා නම් මාස් ශුද්ධිය දින 28 කට වරක් ක්‍රමානුකූලව සිදුවිය යුතුයි.

ඔබ දරුඵල පමා වූ කාන්තාවක් නම් ඔබේ මාස් ශුද්ධිය අක්‍රමවත් නම්, අනිවාර්යයෙන්ම එයට හේතුව ඔබේ හෝමෝන අසාමාන්‍ය වීමත් ඒ නිසා බීජ වර්ධනය අක්‍රමවත් වීමත්ය.

ඔබ එවැනි කාන්තාවක් නම්, දරුඵල පමාවීම සඳහා ප්‍රතිකාර ගන්නට වෛද්‍යවරයෙක් ළඟට යනවා නම් වෛද්‍යවරයා ඔබ නිවැරදිව අධ්‍යයනයය කරනවා නම් අනිවාර්යයෙන්ම ඔබගේ හෝමෝන පරීක්ෂණයක් කළ යුතුම වෙනවා.

අද අප වෙත එන කාන්තාවන් බොහොමයකගේ මාස් ශුද්ධි රටාව අක්‍රමවත් වී තිබියදීත් හෝමෝන පරීක්ෂණයක් කර නැති තත්ත්වයක් අපි දකිනවා.

ඔබ මේ ගැන දැනුවත් වී සිටියා නම් මෙවැනි ව්‍යාකූල තත්ත්වයන්ට ඔබ ඇද වැටෙන්නේ නැති බව ඔබ තේරුම් ගත යුතුයි.

මෙසේ හෝමෝන පරීක්ෂා කොට ඔබට ඇති හෝමෝන දෝෂය හඳුනාගන්නේ නැතිව - ඒ කියන්නේ ඔබේ බීජ වර්ධනය අඩාල වී ඇති බවත් එය නිවැරදි කළ යුතු බවත් තේරුම් නොගෙන, ධාතු තැන්පත් කරන්නට පවා ඔබ යොමු කරන එතැනින් නොනැවතී නල දරු ප්‍රතිකාරවලට ඔබ යොමු කරන තත්ත්වයක් අප අනන්තවත් දැක ඇත.

මෙයට ආසන්නතම උදාහරණය ගිය සතියේ කටුගස්තොට සිට පැමිණි චතුරිකා සන්නස්ගලයි. වෘත්තියෙන් නීතිවේදිනියක වූ ඇය විවාහවී අවුරුදු 8 ක් ගත වී තිබුණා. අවුරුදු 6 ක් විශේෂඥ වෛද්‍යවරුන්ගෙන් ප්‍රතිකාර ලබාගෙන තිබුණා. ඇයගේ මාස් ශුද්ධිය මුල සිටම අක්‍රමවත් වී තිබුණු බවත් ඇතැම් විටෙක මාස 7-8 ක් පවා මාස් ශුද්ධිය හැදෙන්නේ නැති කාල වකවානු තිබූ බවත් ඇය කියනවා.

ඒත් ඇයගේ හෝමෝන පරීක්ෂාවක් කර තිබුණේ නැහැ. මාසයෙන් මාසය ස්කෑන් පරීක්ෂණ කර බීජ වර්ධනය වන බව කියා බීජ පිට වන්නට බෙහෙත් පවා විද ධාතු තැන්පත් කිරීම් පවා කරලා. ඒත් හරිහැටි බීජ වර්ධනය වීම තබා දින 28 කට වරක් ශුද්ධ වීම වත් නිවැරදිව සිදුවෙලා නැහැ.

අද අපි ඔබ වෙත දෙන පණිවිඩය නම් දරුඵල පමා වන බොහෝ කාන්තාවන්ට එසේ වන්නේ ඔවුන්ගේ හොමෝන අසාමාන්‍ය වීම නිසා බීජ වර්ධනය අඩාල වීම නිසා බවත් ඔබට සාර්ථකව ප්‍රතිකාර කරන්නට නම් හෝමෝන පරීක්ෂණයකින් පවතින තත්ත්වය තේරුම් ගෙන බීජ වර්ධනය නිවැරදි කරන්නට නිවැරදි ප්‍රතිකාර දිය යුතු බවත් ය.

මේ දේ අද බොහෝ තැන්වල සිදුවෙනවාද නැද්ද යන්න තීරණය කිරීම ඔබට බාරයි.



ප්‍රසව හා නාරිවේදී විශේෂඥ
**කුසුම්සිරි ද. සිල්වා**

**මේ ලිපි සපයන වෛද්‍ය කුසුම්සිරි ද සිල්වා මහතා මේ ක්ෂේත්‍රයේ වසර 30 කට වඩා වැඩි අත්දැකීම් ඇති ප්‍රසව හා නාරිවේදී විශේෂඥ වෛද්‍යවරයෙකි.**

**එංගලන්තයේ බර්මිංහැම් හි දී නල දරු ප්‍රතිකාර ක්‍රම ඇතුළු බටහිර වෛද්‍ය ක්‍රම පිළිබඳව මනා අත්දැකීම් ඇති ඔහු පසු කලෙක ඉන්දියාවේ හා ඉන්දුනීසියාවේ පෙරදිග වෛද්‍ය ක්‍රමයද හදාරා ඇත්තෙකි.**

**1995 දී ෆර්ටි-ඒඩ් ආයතනය පිහිටුවීමෙන් ලංකාවේ ප්‍රථම වරට දරුපල පමාවට විශේෂිත වූ වෛද්‍ය මධ්‍යස්ථානයක් පිහිටුවීමේ ගෞරවය ද**

**මහනුවර** — පේරාදෙණිය පාරේ, කිංස්වුඩ් විද්‍යාලය ඉදිරිපිට — අඟහරුවාදා | බ්‍රහස්පතින්දා | ඉරිදා

**කඩවත** — කඩවත නුවර පාරේ 198, ESESS Health Care, ගොඩනැගිල්ලේ — බදාදා | සෙනසුරාදා

**ප්‍රතිකාර පිළිබඳ වැඩිදුර විමසීම් : 077 3015122 081 2224672**



# මම නම් ජීවිතේ ඉගෙනගත්තු තරමක් පාඩම් ඉගෙනගත්තෙ ගෑනුන්ගෙන්

## සුරත් ද මැල්




මට 'සී+'ව හම්බවෙන්න අහම්බෙන්. අහම්බෙන් ලැබුණත් මේ පොතේ ඔලුව මත් කරවන උත්තේජනයක් තියෙන වග පිටු තුන හතරක් පෙරලද්දිම තේරුණා. මං ආසම කතුවරයා භාෂාව හසුරවන විදියට. ඒක පොතේ පිටු හැරවෙන වේගය වැඩි කරවනවා. ඒත් එක්කම දන්නෙම නැතිව කතාව ඉවර වෙනවා. හැබැයි නිකන්ම නෙවෙයි.

මේ කතාව කියන්නේ මහරගම මානසි. ආදරේට කියන්නේ 'සී'. කෙල්ලෙක්ද කොල්ලෙක්ද කියලා හිතාගන්න බැරි 'සී' සංකීර්ණ, කට්ටකෙරාටික, තැනේ හැටියට ඇණේ ගහන්න දන්න හැබැයි සංවේදී චරිතයක්. 'සී'ගේ හොඳම යාළුවා 'දිල්'. ඒ දෙන්නගෙ සම්බන්ධෙට දෙන්න වචනයක් මට තාම හිතාගන්න බෑ.

හැබැයි 'දිල්' එසේ මෙසේ චරිතයක් නෙවෙයි. 'හොඳින් නැත්නම් නරකින්' ඒ දිල්ගේ තේමා පාඨය. මැදදි කතාවට තව කෙනෙක් එකතු වෙනවා. ඒ කොළඹ හතේ සල්ලිකාර 'මුතු'.

මේ සරසවි සිසුවියන් තුන්දනා ලවා කාටවත් නොපෙනෙනා නැත්නම් උවමනාවෙන් බලන්නේ නැති කුණු වෙච්චි, පිලුණු වෙච්ච සමාජ ප්‍රශ්න කිහිපයක් සියුම්වට නිරුවත් කරන්නේ සුරත්. සුරත් ද මැල් තමයි මේ පොතේ කතුවරයා. 'සී+' ඔහුගේ දෙවැනි නවකතාව. ඔහුගේ පළවැනි නවකතාව 'තී හා තා' ඒක පාඨක, විචාරක සහ සාහිත්‍ය සම්මාන දිනාගන්න සමත්වුණු අතිශය ජනප්‍රිය කෘතියක්. ඉතින් එකහුස්මට 'සී+' සාරය උරාගත්තු උණුසුමෙන්ම සුරත් එක්ක 'සී+' ගැන ටිකක් කතා කරන එක හොඳයි කියලා හිතුවා. මේ ඒ කතාබහේ සටහන.

**මේ සුරත්ගේ දෙවැනි නවකතාව. නවකතාකරුවෙක් නැත්නම් ලේඛකයෙක් වෙන්න සිතීම පිටිපස්සෙම ලොකු හේතුවක් ඇති?**

ගොඩක් මිනිස්සුන්ට කියන්න කතා තියෙනවා. ඒ වගේම ඒ කතා අනිත් අයත් එක්ක රස කර කර කියන්න එයාලා ආසයි. ඒ මිනිසුන්ගේ හැටි. සමහරු තමන්ගේ කතාව පෙම්වතියට හරි යාළුවන්ට හරි කියනවා. තව සමහරු වයසට ගියහම දරු මුණුබුරන් වට කරගෙන මහ උජාරුවට ඒ කතා කියනවා. එහෙම එක එක්කෙනාට කනට කොඳුරලා කතා කියන්න මට කම්මැලියි. මගේ කතා එකපාර වැඩිදෙනෙක්ට කියන්නයි මට ඕනේ. ලේඛකයෙක් වෙන්න මම හිතුවෙම ඒකයි.

**මේ නවකතාව ගෙතෙන්නේ කාන්තා චරිත ත්‍රිත්වයක වටේ විතරයි. මේ වගේ චරිත ඉදිරිපත් කිරීමක් වෙනත් සිංහල නවකතාවක දැකලා නැති තරම්.**

ස්ත්‍රී චරිත වටා පමණක් ගෙතුණු නවකතා වෙනත් සාහිත්‍යවල නම් අපමණ තියෙනවා. හැබැයි සිංහල නවකතාව තුළ කොහොමත් අත නොතියපු චරිත සහ මාතෘකා ගණන කතාබහ කරලා තියෙන තේමා ගාණට වඩා බෙහෙවින් වැඩියි.

**ඒ නිසාද කවුරුත් කතා නොකරන මේ අලුත්ම තාලේ මාතෘකාවක් ගැන කතා කරන්න හිතුවේ?**

මිනිස්සු අමුතු මාතෘකා ගැන කතා නොකරන්නේ ඒක එළියට ආවම ඇතිවෙන්න පුළුවන් ඩිස්කෝසර් එකට නැත්නම් සමාජ කතාබහට ඇතිවෙන බයට. තව සමහරු ඇත්ත දැනගන්න බයයි. තමන් දන්න සත්‍ය අනිත් අය දැනගනී කියලා බයවෙන අයත් ඉන්නවා. මිනිස්සු කියන්නේ නැති, දන්නෙ නැති ටික ගැන ලියන්න තමයි මම කැමති.

**මිනිස්සු අමුතු මාතෘකා ගැන කතා නොකරන්නේ ඒක එළියට ආවම ඇතිවෙන්න පුළුවන් ඩිස්කෝසර් එකට නැත්නම් සමාජ කතාබහට ඇතිවෙන බයට. තව සමහරු ඇත්ත දැනගන්න බයයි**

**මේක එක කතාවක්. හැබැයි ඒ ඇතුළේ බබ ප්‍රශ්න කිහිපයක් ගැන කතා කරනවා නේද?**

මට අනුව නම් කතාවක් කියන්නේ මහලොකු වැදගැම්මකට ඇති දෙයක් නෙමෙයි. මං කිව්වනේ අපි හැමෝටම කතාවක් තියෙනවා. එහෙම ගත්තම මේ ලෝකේ කතා බිලියන හතයි. ඒත් කාටද ඕනේ ඔය හැමෝගෙම කතා අහන්න? හැබැයි ඔය හැම කතාවක් ඇතුළෙම ජීවිතයේ ගුණාත්මක පැවැත්මට බාධාවෙන කරුණු සහ සිද්ධි තියෙනවා. හැම කෙනෙක්ගෙම ජීවිත ගුණාත්මක කරන්න නම් බාධක ගැන කතා කරන්න ඕනේ. සමහර සටන් සාමූහිකයි. සමහර ඒවා පුද්ගල කේන්ද්‍රයි. 'සී+' ඇතුළේ ප්‍රශ්න කිහිපයක් කතා කරන එක තමයි මගේ පුද්ගල කේන්ද්‍රීය සටන.

**ඔබ 'සී+' ලියන්නේ ස්ත්‍රී ඇහැකින්. පිරිමින්ට වඩා ගෑනුන්ට මේ වගේ ප්‍රශ්න වැඩි නිසාද ස්ත්‍රී ආත්මෙකට ආරූඪ වෙන්න හිතුවේ?**

පිරිමින්ට ප්‍රශ්න තියෙනවා. හැබැයි අවාසනාවකට අපේ සංස්කෘතිය ඇතුළේ කාන්තාවන්ට ඊට වඩා ප්‍රශ්න තියෙනවා. කාන්තාවන් මේ ලෝකේ ජීවත් වුණාය කියලා පිරිමින්ට අමුතු ගැටලු ඇතිවෙන්නේ නැහැ. හැබැයි පිරිමි මේ ලෝකේ ජීවත්වීම නිසා කාන්තාවනට ප්‍රශ්න ඇතිවෙලා. මේ තත්ත්වය ඉතා බරපතළ වෙන්නේ අපේ වගේ පුරුෂ මූලික සමාජවල. මේ බෙදීම තවදුරටත් පවත්වාගන්න නොදියුණු සමාජවල පිරිමි අදටත් උත්සාහ කරනවා. නොදන්නාකම නිසා සමහර ගෑනුත් මේකට රුකුල් දෙනවා. ඒ නිසා ගෑනු පිරිමි කියන ලිංගභේදය අනුවත් මුහුණදෙන්න වෙන ගැටලුවල සංකීර්ණත්වය වැඩි වෙනවා. කාන්තා ඇසකින් 'සී+' ලියැවෙන්නේ ඒ නිසයි.

**පුරුෂ ආත්මයක් ස්ත්‍රී ආත්මයකට ඔය තරම් හොඳට ආරූඪ වෙන්නේ කොහොමද?**

ස්ත්‍රී ආත්මයකට ආරූඪ වෙන්න පිරිමියෙක්ට බැරි ඇයි? මගේ ජීවිතේ මට සමීපතම වැඩිදෙනෙක් ස්ත්‍රීන්. අම්මගෙන් පටන්ගත්තම ඉගෙනගත්ත තරමක් පාඩම් ඉගෙනගත්තේ ගෑනුන්ගෙන්. හරියන වරදින හැමතැනකදිම ඒ අය සිතන පතන හැසිරෙන විදිය මම අත්විඳලා තියෙනවා. ස්ත්‍රී පුරුෂ බෙදීම අතුරුදහන් වෙන වෙලාවල් තියෙනවා. එතකොට අපි හැමෝම එකයි වගේ දැනෙනවා. ඒක හරිම සුන්දරයි.

**ඒ කියන්නේ ඔබ මේ නවකතාව ලියන්නේ කාන්තා විමුක්තිය වෙනුවෙන්?**

කාන්තා විමුක්තිය දෙන්න මට බෑ. කාන්තා අයිතිවාසිකම් ගැන කතා කරන සමහරු ඒක කරන්නේ බඩවියත රැකගන්න රස්සාවක් විදියට. අනික ස්ත්‍රී අයිතීන් ඉල්ලන්නේ කාගෙන්ද? අණ්ඩුවෙන්ද? පිරිමින්ගෙන්ද? ඒක නම් සම්මජ්ජාතියකට වෙන්නේ නැහැ දෙයියෝ! අනික කාන්තා විමුක්තිය එයාලගෙන් ඉල්ලන්න කවුද ඒක එයාලා ගාව ආරක්ෂාවට තිබ්බේ? තමන්ගේ නිදහස තමන්ගේ. ඒක කවුරුත් ඉල්ලලා ගෑනුන්ගේ අතට ගෙනිහිල්ලා දෙන්න ඕන දෙයක් නෙමෙයි.

පිරිමින් විසින් නිර්මාණය කරපු ව්‍යාජ පුරුෂ ශිෂ්ඨාචාරයක හිරවෙන්න ආස නම් ඒක එක එක්කෙනාගේ පෞද්ගලික තේරීමක්. තමන්ගේ නිදහස තමන්ගේ අතට ගන්න ඕනේ. එතකොට චණ්ඩි නොන්ඩි වෙලා යන හැටි බලාගන්න පුළුවන්. ඒකට උදාහරණත් අද අපේ සමාජයේ ඕනතරම් තියෙනවා.

**පිරිමින් විසින් නිර්මාණය කරපු ව්‍යාජ පුරුෂ ශිෂ්ඨාචාරයක හිරවෙන්න ආස නම් ඒක එක එක්කෙනාගේ පෞද්ගලික තේරීමක්. තමන්ගේ නිදහස තමන්ගේ අතට ගන්න ඕනේ. එතකොට චණ්ඩි නොන්ඩි වෙලා යන හැටි බලාගන්න පුළුවන්**

**පොතේ හැම පරිච්ඡේදයකම ඒ පරිච්ඡේයට අදාළ වෙන විදියට කවි කොටසක් තියෙනවා. ඒ අලුත් අදහස පිටිපස්සේ සංකීර්ණ යටි අරමුණක් තියෙනවද?**

අපෝ නෑ. ඒක බොහොම අහිංසක ආකෘතියක් විතරයි. ඒක හැබෑ ලෝකෙදි ගීත රසිකයෝ වැඩිදෙනෙක් කරන රසාලිප්ත වැඩක්. මම ඉතින් ඒක අරන් නවකතාව ඇතුළට දැම්මා. දැන් කට්ටියට ඒක මාර ජිමික් එකක් වෙලා. එහෙම තමයි ආකෘති හරඹ වුණත් බිහිවෙන්නේ.

***'සී+' ආමන්ත්‍රණය කරන්නේ තරුණ පරපුරට විතරයි කිව්වොත්?**

මම ලියන්නේ එක පරපුරක්, එක පෘඨක සමූහයක් ඉලක්ක කරගෙන නෙමෙයි. අනික ලැබෙන ප්‍රතිචාර අනුවත් එහෙම දැනෙන්නේ නැහැ.

**'සී+'ට ලැබෙන රසික ප්‍රතිචාර කොහොමද? පැසසුම්වලට අමතරව විවේචන එහෙම ඇති?**

වැඩිම ප්‍රතිචාර කාන්තාවන්ගෙන්. ඒකත් සියලුම වයස්වල. දැනට නම් ලැබෙන්නේ පැසසුම් විතරයි. ඉදිරියේදී මල්වලට අමතරව ගලුත් එන්න බැරි නෑ ඉතින්.

**'එක් වචනයකින් මනසකුත්, වාක්‍යයකින් ජීවිතයකුත්, පොතකින් ලෝකයත් වෙනස් කරන්නට හැකි යැයි කියමනක් තියෙනවා. මේ පොත එකී කියමන සාධනය කරවනු පිණිස ලියූවක් නම් නොවෙයි. එහෙත් එහි සත්‍ය අසත්‍යතාවය මිනුම ඔබට බාරයි.'**

සංවාද සටහන අවසානයට 'සී+'ගෙන් උපුටා ගත්තු ඒ කොටස එකතු කරන්න හිතුවේ මට වගේම ඔයාගේ හිතටත් ඒක දැනෙයි කියලා හිතුණු නිසයි.

**සෙව්වන්දි හෙට්ටිආරච්චි**

# නිකන් දෙනවනම් දෙමළ පත්තරේ වුණත් කමක් නෑ වගේද?



ඉන්දියාවේ බැංගලෝර් විශ්වවිද්‍යාලය කියන්නේ එසේ මෙසේ විශ්වවිද්‍යාලයක් නෙවෙයි. ඒක ඒ රටේ තියෙන ප්‍රසිද්ධ සහ කීර්තිමත් විශ්වවිද්‍යාලයක්. ඒ නිසා ඉන්දියාවේ ගොඩාක් තරුණ තරුණියන් උපාධියක් ගන්න පෙරුම් පුරන්නේ ඒ විශ්වවිද්‍යාලයෙන්. මොකද බැංගලෝර් විශ්වවිද්‍යාලයෙන් උපාධියක් ගත්තාම තියෙන පිළිගැනීම වැඩියි.

ඔය අතරේ මේ කියන බැංගලෝර් විශ්වවිද්‍යාලය තීරණය කරනවා 2017 වසරේ හිටපු ඉන්දීය ක්‍රිකට් ක්‍රීඩකයෙකුව අගයන්න. ඒ ඔහු ඉන්දියාව වෙනුවෙන් වසර ගණනාවක් කරපු කැපකිරීමට ගෞරවයක් විදියට. ඒ අනුව ඔවුන් එම ක්‍රීඩකයාට විශේෂ ගෞරව ආචාර්ය උපාධියක් ලබාදෙනවා. එහෙම උපාධියක් ලබාගන්න එක ලේසි නෑ. ඒත් පුදුමය කියන්නේ මේ ක්‍රීඩකයා ඒ ගෞරව ආචාර්ය උපාධිය ගෞරවාන්විතව ප්‍රතික්ෂේප කරනවා. එහෙම කරලා ඔහු උත්සව සභාව අමතලා හරි ආදර්ශමත් කතාවක් කියනවා.

**“මගේ බිරිඳ වෛද්‍යවරියක්. ඇය ඇගේ වෛද්‍ය උපාධිය ලබාගන්න ගණන් කළ නොහැකි තරම් නිදි නැති රාත්‍රීන් සහ දින ගණන් ගතකරලා තියෙනවා. එහෙම දීර්ඝ කැපකිරීමක් කරලා තමයි ඇය ඇගේ වටිනා උපාධිය ලබාගත්තේ. ඒ වගේම මගේ අම්මා කලා අංශයේ මහාචාර්යවරියක්. අම්මගේ අවසාන උපාධිය ලබාගන්න ඇය අවුරුදු පනහක් තිස්සේ ඉවසීමෙන් බලාගෙන හිටියා. මං ඉන්දියාවේ ක්‍රිකට් කණ්ඩායමට එන්න ගොඩාක් මහන්සි වුණා. එහෙම ඇවිත් ක්‍රිකට් තුළින් ඉහළටම ගියා. ඒක තමයි ඇත්ත. ඒත් මම අධ්‍යාපනය පැත්තෙන් එච්චර හොඳට ඉගෙනගත්ත කෙනෙක් නෙවෙයි. ඉතින් මම කොහොමද මේ බලසම්පන්න ගෞරව ආචාර්ය උපාධිය පිළිගන්නේ? ගෞරව උපාධියක් නිකන්ම ලබාගන්නවට වඩා ක්‍රීඩා ක්ෂේත්‍රයේ යම් ආකාරයක ශාස්ත්‍රීය පරේයේෂණයක් කරලා ආචාර්ය උපාධියක් ලබාගන්න මං බලාපොරොත්තු වෙනවා. ඒ නිසා අද දවසේ මට ඉන්දියාවේ බැංගලෝර් විශ්වවිද්‍යාලයෙන් දෙන මේ ගෞරව ආචාර්ය උපාධිය ඉතා ගෞරවාන්විතව ප්‍රතික්ෂේප කරනවා.”**

ඔබ ක්‍රිකට්වලට ආදරේ කරන පුද්ගලයෙක් නම් මේ අපූරු කතාව කියපු පුද්ගලයා දැන් නොදැන ඉන්න විදිහක් නෑ. මොකද කවුරුත් නොදැන හිටපු ඔහුගේ කතාව පසුගියදා ඔහු මාධ්‍ය වෙත කියනවා. ඔහු තමයි හිටපු ඉන්දීය ක්‍රිකට් ක්‍රීඩක ‘රාහුල් ඩ්‍රාවිඩ්’ (Rahul Dravid). 1973 ජනවාරි 11 වෙනිදා ඉන්දියාවේ මධ්‍ය ප්‍රදේශ්වල ඉපදෙන ඔහු ජාත්‍යන්තර පිටියට අවතීර්ණ වෙන්නේ 1996 අවුරුද්දේ. එදා ඉඳන් ඔහු 2012 වසර වෙනකල් දකුණත් පිතිකරුවෙකු ලෙස ඉන්දීය කණ්ඩායමේ රැඳෙනවා. ටෙස්ට් තරඟ 164කදී ළකුණු 13288ක් වගේම එක්දින තරඟ 344කදී ළකුණු 10889ක් රැස්කරන්න පවා ඩ්‍රාවිඩ් සමත්වෙනවා. එමෙන්ම ඔහු වරක් ඉන්දීය ක්‍රිකට් කණ්ඩායමේ නායකයා මෙන්ම පුහුණුකරු විදිහටද කටයුතු කරනවා.

රාහුල් ඩ්‍රාවිඩ්ගේ සිදුවීමත් එක්ක මීට සමාන සිදුවීම් කීපයක්ම අපිට හොයාගන්න ලැබුනා. එයින් එකක් සිද්ධ වෙලා තියෙන්නේ 1952 අවුරුද්දේ.

ඒ වෙනකොට ලෝක ප්‍රකට භෞතික විද්‍යාඥයෙක් වුණු ඇල්බට් අයින්ස්ටයින්ට වයස අවුරුදු 73යි.

එම වසරේ ඔහුට ඊශ්‍රායල රජය විසින් එරටේ අගමැතිකම බාරගන්න කියලා ඉල්ලීමක් කරනවා. නමුත් එදා ඔහු එම ඉල්ලීම ගෞරවාන්විතව ප්‍රතික්ෂේප කරන ගමන් මෙහෙම කියනවා.

**“මං භෞතික විද්‍යාව පිළිබඳ යම්තාක් දුරට දන්න කෙනෙක්. ඒත් රාජ්‍ය පාලනය සහ පරිපාලනය ගැන කිසිදෙයක් දන්නේ නෑ. ඒ නිසා මට මේක බාරගන්න බෑ. කණගාටුවෙන් වුණත් මට ඔබේ රටේ ඉල්ලීම ගෞරවාන්විතව ප්‍රතික්ෂේප කරන්න වෙනවා.”**

ඒ වගේම රුසියානු ලෝක ප්‍රකට ගණිතඥයෙකු වන ග්‍රිගරි පෙරෙල්මන් 2006 අවුරුද්දේ ක්ෂේත්‍ර පදක්කම් සහ ගණිත ක්ෂේත්‍රයේ නොබෙල් ත්‍යාගයට සමානව ලබාදෙන විශාල මුදලක් ලබාගැනීම ප්‍රතික්ෂේප කරනවා. එහෙම ප්‍රතික්ෂේප කරන ඔහු අවසානයේ මෙන්න මෙහෙම කතාවක් කියනවා.

**“අපේ පවුල දුප්පත්කමේ උපරිමයේ ඉන්න කාලේ තමයි මගේ ළමා කාලය ගෙවිලා ගියේ. අම්මාට ලැබෙන ආදායම ඉතුරු කරගන්න මට ඇයගේ ගණකාධිකාරී ලෙස මුදල් කළමනාකරණය කිරීමට සිදුවුණා. කුඩා කාලයේ සිටම මට ගණිතය පිළිබඳ කුඩා දක්ෂතාවක් වර්ධනය කර ගැනීමට හැකිවුණේ ඒ හින්දයි. අපි ඒ ගෙවූ දරිද්‍රතාවයේ අවධිය දැන් මගේ ජීවිතයේ නැති නිසා මෙතරම් මුදලක් ලබාගෙන මං මොනවා කරන්නද?”**

*රුවන් එස්.සෙනවිරත්න*



රාහුල් ඩ්‍රාවිඩ් සිය බිරිඳ සහ දරුවන් සමඟ


## උකසට තබා බේරා ගැනීමට නොහැකිවූ ඔබේ රන් භාණ්ඩ නැවතත් ඔබේ අතටම

ඔබ දැනට උකස්තබා ඇති රිසිට් පත අපට 0767 888 222 අංකයට WhatsApp කරන්න

### වැඩි විස්තර සඳහා අමතන්න

| | | | |
|---|---|---|---|
| කොළඹ | 0771 408 547 | වැල්ලවත්ත | 0710 870 686 |
| මොරටුව | 0766 227 059 | කළුතර | 0776 167 149 |
| මීගමුව | 0766 227 056 | ගම්පහ | 0779 230 549 |
| වෙන්නප්පුව | 0710 869 378 | හලාවත | 0779 256 191 |
| ගාල්ල | 0705 979 274 | මාතර | 0705 979 237 |
| කුරුණෑගල | 0766 227 061 | ගම්පොල | 0710 870 735 |
| දිගන | 0778 156 738 | නාවලපිටිය | 0710 870 706 |
| තලවකැලේ | 0710 871 009 | හැටන් | 0778 790 372 |
| මාතලේ | 0702 539 389 | කෑගල්ල | 0703 583 363 |
| බේරුවල | 0772 999 934 | පූඩළුඔය | 0777 683 889 |
| මතුගම | 0772 206 413 | රාගල | 0710 870 703 |
| වව්නියාව | 0740 920 313 | උඩප්පුව | 0771 201 851 |
| මොණරාගල | 0771 201 852 | ත්‍රිකුණාමලය | 0771 201 854 |
| බදුල්ල | 0771 201 863 | පුත්තලම | 0771 201 861 |
| කොටහේන | 0702 539 382 | මහියංගනය | 0771 201 862 |
| කල්පිටිය | 0761 605 803 | මස්කෙලිය | 0760 909 822 |
| කටුගස්තොට | 0779 476 206 | පානදුර | 0776 157 119 |
| නාඋල | 0763 226 230 | | |

F.A.Ads



# සීදේවි නෝනා... දැක්කත් ගමටම කිරි උතුරනවා

## බඩගෝස්තරේ රැකගන්නට සීතලට කියැවෙන සාස්තරේ

**ශාස්ත්‍ර කීමේ හැකියාව ලැබෙන්නෙ පරම්පරාවේ ලේ වලින්ලු**

තැනින් තැන ඇවිදිමින් අත බලා ශාස්ත්‍ර කියන කාන්තාවන් පිරිසක් කොහේ කොතැනක හෝ ඔබටද මුණගැසී ඇත්නම් එහි අරුමයක් නැත. මීට අවුරුදු තිහ හතළිහකට පෙර පිටිසර ගම් දනව්වල නිවෙසක් නිවෙසක් ගානේ යමින් ශාස්ත්‍ර කියූ මේ කාන්තාවන්ගේ ප්‍රමාණය අද වනවිට වේගයෙන් අඩුවී ඇත. ඉන්දීය ක්‍රමයට අපිළිවෙලට හැඳි සාරියකින් සහ උරෙහි එල්ලාගත් ඔලොගුවකින් යුතු මොවුන් සමාජයේ වඩාත් ප්‍රකට අහිගුණ්ඨික කාන්තාවන් වශයෙනි. එම පැරණි අහිගුණ්ඨික නාමය වෙනුවට අද ඔවුන් හැඳින්වීමට **'තෙළිඟු'** යන ව්‍යවහාරය යෙදෙයි.

**'අහිගුණ්ඨික'** යන්න අපහාස නාමයක් සේ පෙනුණද එහි අරුත සර්පයින් අල්ලන්නා යන්නයි. **'අහි'** යනු සර්පයා හැඟවෙන පදයක් වන අතර, ගුණ්ඨික යනු අල්ලන්නා යන්න හැඟවෙන නමකි. බෞද්ධ පන්සිය පනස් ජාතක පොතේ අහිගුණ්ඨික ජාතකය නම් වෙනම ජාතකයක් තිබේ. ඉන් කියැවෙන්නේ රිලවුන් නටවන බ්‍රාහ්මණයෙකු පිළිබඳවය. බ්‍රාහ්මණ ලෙසින් හැඳින්වෙන්නේ භාරත සමාජයේ උසස්ම කුලවතුන්ය. එබැවින් අප රටේ අහිගුණ්ඨික ජනතාව පොදු සමාජයෙන් කොන්වීමට හේතුව මට නම් සිතාගත නොහැකිය. ලෝකයේ බොහෝ රටවල ජීවත්වන මේ ජනතාව ජාත්‍යන්තර වශයෙන් හැඳින්වෙනුයේ **'රොමා'** හෝ **'රොමාන්'** යනුවෙනි. නමුත් මොවුන්ගේ නිජබිම ඉන්දියාවය.

මොවුන් තමන්ගේ ජීවන වෘත්තීන් ස්ත්‍රී-පුරුෂ වශයෙන් බෙදාගෙන සිටිති. පුරුෂ පක්ෂය ප්‍රධාන වශයෙන් නයින් සහ රිලවුන් නැටවීමෙන් ජීවනෝපාය සරි කරගන්නා අතර මෙලෙස ශාස්ත්‍ර කියමින් දිවි රැකගන්නේ ඔවුන්ගේ කාන්තා පාර්ශවය පමණි.

සත්‍යම පවසන බවට කිසිඳු ලෙසකින් තහවුරු නොවුණත් හස්ත රේඛා ශාස්ත්‍රය ලොව බොහෝ රටවල විවිධාකාර අන්දමින් භාවිතා වෙයි. ඒ පිළිබඳව ලියැවුණු පොතපත සේම යමෙකුගේ අත්ලේ රේඛා සටහන් අනුව අනාවැකි කිව හැකි පරිගණක මෘදුකාංග පද්ධතිද කොතෙකුත් තිබේ.

එහෙත් මෙම අහිගුණ්ඨික කතුන්ගේ ශාස්ත්‍ර කීම ඒ හස්ත රේඛා ශාස්ත්‍රයෙන් ඉඳුරාම වෙනස් ඔවුන්ටම ආවේණික වූ කලාවකි. එබැවින් වරින්වර ඔවුන්ගේ මෙම අත බලා ශාස්ත්‍ර කීමේ සුලමුල සෙවීමට මම උත්සාහ ගත්තේ මීට දශක දෙකකට පෙර සිටය.

වරක් මෙම මෙම ශාස්ත්‍ර කලාවේ සුලමුල සෙවීම පිණිස ඔවුන් ජනාවාස තනාගෙන සිටි තඹුත්තේගම කුඩාගමට ගිය මම එහි ප්‍රධානියා වූ **'පොඩි මහත්තයා'** හමුවීමි. එවිට ඔහු කියා සිටියේ තම ගෝත්‍රයේ කාන්තාවන්ගේ පාරම්පරික උරුමයක් වන ශාස්ත්‍ර කීමට තමන් අත නොගසන බවය. පසුව මම ගල්ගමුවේ, අන්දරබැද්දේ පිහිටි ඔවුන්ගේ ජනාවාසයට ගොස් එම ජනකොටසේ නායක මසන්නා මහතා හමුවීමි. එවිට ඔහු කියාසිටියේ තම බිරිඳගේ ජීවන වෘත්තියද එය මුත් තමන් කිසිම දිනයෙක ඒ පිළිබඳව කතාකොට නොමැති බවකි. එමෙන්ම බිරිඳ තබා ශාස්ත්‍ර කීමේ යෙදුණු තම මවවත් කිසි දිනෙක තමන්ගේ අත බලා නොමැති බවද හෙතෙම කීය. ඊට හේතුව කුමක්දැයි මා විමසූ විට මසන්නා මහතා කියා සිටියේ **"අපි ගැන ඉතින් මොනවා අමුතුවෙන් දැනගන්නද? අපේ ජීවිත ඉතින් මේ විදිහෙම තමයි"** යනුවෙනි.

අනුරාධපුර පූජා නගරය තුළ මෙලෙස අත බලා ශාස්ත්‍ර කියන කාන්තාවන් නිතරම පාහේ දැකිය හැක. එනිසා ඊට කලෙකට පසු මම ඔවුන්ගේ ශාස්ත්‍ර කීමේ ක්‍රියාවලිය සියුම් ලෙස නිරීක්ෂණය කළෙමි. ඒ අනුරාධපුරයට පැමිණෙන බැතිමතුන් වැඩිපුර ගැවසෙන ස්ථාන ආශ්‍රිතවය. ඒ සඳහා රුවන්වැලි සෑ ආරාමයේ කැපකරුවෙකු වන ඩී.එම්.මුතුබණ්ඩා මහතාගෙන් ලැබුණු සහාය ද මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතුය.

**"මේක අපේ අම්මලා, අත්තම්මලා අපිට කියලා දීපු සාස්තරයක්, මේක කිසිම පොතපතක ලියැවිලා නැහැ. මේක එන්නේ අපේ පරම්පරාවේ ලේවලින්. නමුත් මේක පිහිටන්නේ ගෑනු අපිට විතරයි."** ශාස්ත්‍ර කියන කාන්තාවන් විසි තිස්දෙනෙකුගෙන් විමසූ මට ලැබුණු පොදු පිළිතුර වූයේ එයයි.

අත බලා ශාස්ත්‍ර කියන බවක් පැවසූවද එම කාන්තාවෝ කිසිවිටෙකුත් ශාස්ත්‍ර අසන්නාගේ සුරතේ අල්ලේ රේඛා සියුම් ලෙස පරීක්ෂා නොකරති. අඩුම තරමින් ඔවුහු ශාස්ත්‍රය අසන්නාගේ අත්ල දෙස විමසිලිමත්ව බලන්නේවත් නැත. සිදු කරනුයේ ශාස්ත්‍ර අසන්නාගේ මුහුණ දෙස බලාගත්වනම හෑල්ලක්, යාදින්නක් මෙන් එක දිගටම කියාගෙන යාම පමණි.

**ඔවුන් කවදාවත් බරපතළ අනාවැකි කියන්නෙ නෑ**

**"හොඳ සීදේවි මූණක් නෝනා, පවුලට විතරක් නෙවෙයි ගමටම කිරි උතුරනවා. එන්න අත පොඩ්ඩක් බලාගන්න."**

**"කාටවත් වරදක් නොකරන මහත්තයා, හැමෝටම උදව් පදව් කරගෙන බොහොම වැදගත් විදියට ජීවත්වෙන්න තමයි බලන්නේ."**

ඉහත සඳහන් ස්වරූපයේ වැකි මගින් තමන් අසලින් යන්නවුන් පිළිබඳව විවිධ වර්ණනාත්මක ප්‍රකාශ කරන මෙම කාන්තාවෝ එමගින් ශාස්ත්‍ර අසන්නවුන් තමන් වෙත යොමු කරගනිති.

එමෙන්ම මොවුන්ගේ ශාස්ත්‍ර කීමේ තවත් වැදගත් කරුණක් අනාවරණය කරගැනීමට මට හැකි විය. එනම් මොවුන් ශාස්ත්‍ර කීම සඳහා වෙනම **'වචන කට්ටල'** ගණනාවක් යොදාගන්නා අතර, තමන්ගෙන් ශාස්ත්‍ර අසන පුද්ගලයාට අදාළව ඒ වචන කට්ටල වෙන් වශයෙන් පෙළගස්වා ගන්නා බවකි. එමෙන්ම ඒ සම්බන්ධයෙන් මා තුළ අතිමහත් විස්මය දනවන කරුණක්ද විය. එනම් හස්ත රේඛා පරීක්ෂාව සම්බන්ධ පරිගණක මෘදුකාංග පද්ධති සකසා ඇත්තේ ද එක් එක් පුද්ගලයා සම්බන්ධයෙන් මෙලෙස වචන කට්ටල මාරුකොට දැක්වීමේ ක්‍රමවේදයකට අනුව වීමය.

මෙම අහිගුණ්ඨික කාන්තාවන්ගේ ශාස්ත්‍ර කීම තුළ ඉතා හොඳින් නිරීක්ෂණය වූ තවත් කරුණක් තිබිණි. එනම් මොවුන් කෙසේවත් තම ශාස්ත්‍රයන් ඔස්සේ බරපතළ නිශේධනාත්මක අනාවැකි පළ නොකිරීමය.

**"මහත්තයා ළඟදීම ලොකු අනතුරකට මූණ දෙනවා. නෝනට තව මාස කීපෙකින් සනීප කරගන්න බැරි ලෙඩක් හැදෙනවා"** ආදී වශයෙන් අසන්නවුන්ගේ සිත් සසල කරවන හෝ සිත් රිදවන අනාවැකි මෙම කාන්තාවෝ කිසිවිටෙකත් නොකියති. එමෙන්ම මොවුන්ගේ සමස්ත ශාස්ත්‍රයක් ගතහොත් ඉන් වැඩි කොටස ඒ ශාස්ත්‍රය අසන්නාගේ චරිත ස්වභාවය, ජීවන ගැටලු ආදිය සඳහා වෙන්කරන අතර, අනාවැකි කීම සඳහා වෙන්කරනුයේ ඒ ශාස්ත්‍රයෙන් සුළු කොටසක් පමණි.

නාඳුනන පුද්ගලයන් සම්බන්ධයෙන් මෙලෙස තොරතුරු කීම සීතල කියැවීම (Cold Reading) යනුවෙන් හැඳින්වෙන අතර, යමෙකු දුටුමණින් තීරණය කරගත හැකි ස්ත්‍රී පුරුෂභාවය, බාහිර පෙනුම, ඇඳුම පැළඳුම, හැසිරීම් රටා, වචන උච්චාරණය සහ විශේෂයෙන් දේහ භාෂාව ඔස්සේ ඒ තැනැත්තා පිළිබඳ **'අනුමාන සාධක'** ඉදිරිපත් කිරීම මෙම සීතල කියැවීම් ගණයට වැටෙයි. මනෝ විද්‍යාඥයන්,අපරාධ පරීක්ෂකයන්, මාධ්‍යවේදීන් ආදීන් තම වෘත්තීය කටයුතු සඳහා යොදාගන්නා එම සීතල කියැවීම් මගින් මළපොතේ අකුරක් නොදත් මේ කාන්තාවන් තම ජීවනෝපාය සලසාගැනීම පිළිබඳව එක් අතකින් අප ඔවුනට ප්‍රසංශා කළ යුතු යැයි මට සිතෙයි.



මාධ්‍යවේදී
තිලක් සේනාසිංහ

## කෙටිකතාව

# අත්තම්මලාගේ හුරතලේ තමයි ළමයි නරක් කරන්නේ

> දැන් හොයාගෙන තියෙනවා අම්මේ, ළමයින්ට ගහන්න හොඳ නැහැ කියලා. ගහද්දි දරුවන්ගේ මනසටත් ඒවා බලපානවා. එහෙමයි කියලා දරුවන්ගේ වැරදි නිවැරදි නොකර ඉන්නත් බැහැනේ

හේමලතා ගෙදරට ආවේ මුහුණත් දෙක කරන්.

**“ඇයි අම්මා? මහන්සිද?”** මිදුලේ වාඩිවෙලා පොතක් කියවා කියවා හිටිය නිම්මි ඇහුවේ කුතුහලයෙන්.

**“අර ශාලිකා, මහ හිතක් පපුවක් නැති අම්මණ්ඩියෙක්.”** හේමලතා කිව්වේ තමන්ගේ දියණිය නිම්මි ගාවින් වාඩිවෙන ගමන්. ශාලිකා කියන්නේ හේමලතාගේ ලේලි.

**“ඇයි අම්මා?”**

**“අනේ අර අහිංසක පොඩි එකාට මේකි දෙන වධයක්. මගේ නම් පපුවට කටුවකින් අනිනවා වගේ බලාගෙන ඉද්දි...”** හේමලතා කිව්වේ ඇස්වලට ආපු කඳුළු පිසදන ගමන්.

**“කියන්නකෝ අම්මා තේරෙන්න? පුතාට මොකද වෙලා තියෙන්නේ?”** නිම්මිත් ඇහුවේ කලබලයෙන්.

**“පොඩි දරුවෙක්නේ තාම. අනේ කොල්ලට ශාලිකා හැමදම කියනවලු සෙල්ලම් කළාට පස්සෙ බඩු ටික ආයෙමත් කබඩ් එකට දාන්න කියලා. කොල්ලා දාන්නේ නැහැලු.”** හේමලතා කියද්දි නිම්මිට හිනා ගියා.

**“අපෝ ඔව්. සත්සර පුතා මහ කම්මැලියා. කොයිවෙලේත් සාලේ පුරාම සෙල්ලම් බඩු. දවසක් අක්කා කියපු නිසාම මාත් පුතාගෙන් ඇහුවා ඇයි පුතා සෙල්ලම් බඩු අස් නොකරන්නේ කියලා. මේ පණ්ඩිත කොල්ලා කියනවා අස් කරන එක බොරු වැඩක්ලු. එතකොට ඊළඟ දවසේ ආයේ කබඩ් එක ඇරලා සෙල්ලම් බඩු ගන්න වෙනවලු.”** නිම්මි කිව්වේ හයියෙන් හිනාවෙන ගමන්. සත්සරගේ දඟ වැඩ මතක් කර කර ඉන්න නිම්මි කොහොමත් හරිම කැමතියි.

**“අනේ මගේ අහිංසකයා. කොල්ලාට තියෙන්නේ අපේ පුතාගේ මොළේමයි. හොඳට කල්පනා කරලා උත්තර දෙන්න දන්නවා. එහෙම කොල්ලටනේ මේ ගෑනි මෙහෙම කරන්නේ.”** හේමලතා ආයෙමත් කිව්වා.

**“කියන්නකෝ අම්මා මොකද්ද වෙලා තියෙන්නේ කියලා? ශාලිකා අක්කා පුතාට බැණලද? ගහලවත්ද? ඒක වෙන්න බෑනේ. අක්කා මාත් එක්ක කියලා තියෙනවනේ එයා නම් කවදාවත් පුතාට අතක් උස්සන්නේ නැහැ කියලා.”** නිම්මි ඇහුවේ කලබලයෙන්.

**“අනේ ශාලිකාගේ විකාර. දන්නවද කරලා තියෙන වැඩේ. පොඩි එකාගේ සෙල්ලම් බඩු ඔක්කොම බෑග් එකකට දාලා අල්මාරිය උඩින් තියලා. මම යද්දි කොල්ලා ඉකි ගගහා අඬනවා සෙල්ලම් බඩු බෑග් එක අරන් දෙන්න කියලා. ඇයි ඉතින් එච්චර උසකින් තියෙන බඩු පොඩි එකාට ගන්න බැහැනේ.”**

**“ඉතින්?”** නිම්මි ඇහුවා.

**“මම අරන් දෙන්න හදද්දි මටත් කෑ ගැහුවා අරන් දෙන්න එපා කියලා. කොල්ලට සෙල්ලම් බඩු ඕනෙ නම් කරන්න ඕනේ දේ එයා කියලයි තියෙන්නේ කිව්වේ.”** හේමලතා කිව්වේ තවත් තරහෙන්.

**“මොනාද අක්කා පුතාට කරන්න කියලා තියෙන්නේ?”** නිම්මි ඇහුවේ තවත් පුදුමෙන්.

**“අඬ අඬ ඉඳලා සෙල්ලම් බඩු නොලැබෙන බව තේරුණාම, හෙම්බත් වෙලා කොල්ලා ගිහින් එක්සයිස් පොතක් අරන් ආවා. ඊටපස්සේ ඒ පොතේ පේලි පහක් ලිව්වා මම මීටපස්සෙ සෙල්ලම් කරලා ඉවර වෙලා සෙල්ලම් බඩු අස් කරනවා කියලා. අනේ ඒක දකිද්දි මගේ පපුව හෝස් ගාලා ගියා.”** හේමලතා කියද්දි නිම්මි සුසුමක් හෙලුවා.

**“අම්මා, මෙහෙම කියනවට වරදවා හිතන්න එපා. ශාලිකා අක්කා වැරදි නැහැ.”** නිම්මි කියද්දි හේමලතා ඇය දිහා බැලුවේ ඇස් දෙකත් ලොකු කරගෙන.


**“අම්මට මතකද මන්ද ඉස්සර මායි, අයියයි දඟ වැඩ කරද්දි අම්මයි තාත්තයි අපිට කොච්චර නම් ගහලා ඇතිද? ඒ දවස්වල අපිට කොච්චර නම් දුක හිතුණද? රිදුණද? අපිත් ඒ දවස්වල කොච්චර ඇඬුවද? දැන් හොයාගෙන තියෙනවා අම්මේ, ළමයින්ට ගහන්න හොඳ නැහැ කියලා. ගහද්දි දරුවන්ගේ මනසටත් ඒවා බලපානවා. එහෙමයි කියලා දරුවන්ගේ වැරදි නිවැරදි නොකර ඉන්නත් බැහැනේ. ඉතින් අක්කා සත්සර පුතාගේ වැරදි නිවැරදි කරන ඔය ක්‍රමේ වරදක් නැහැ.**

**ඒ පුංචි දඬුවම නිසා සත්සර පුතාගේ වරද හැදෙනවා මිසක්, සත්සර පුතාගේ ඇඟටවත් හිතටවත් හානියක් වෙන්නේ නැහැනේ.”** නිම්මි කියද්දි හේමලතා මොහොතකට ගොලු වුණා.

**“දුව කියන්නේ පාරක් දෙනවට වඩා එහෙම කරන එක හොඳයි කියලද?”** මොහොතකින් හේමලතා ඇහුවා.

**“ඔව් අම්මා. ලොකු අය පොඩි අයට ගහන්නේ තමන්ට තරහ ගියාම. ලොකු අය හිතුවට පොඩි පාරක් කියලා සමහර වෙලාවට ඒ පාර ගොඩක් සැරයි. එහෙම ගුටි කන දරුවන්ට පස්සේ එක එක පෞරුෂ දුර්වලතා ඇති වෙනවා කියලත් හොයාගෙන තියෙනවා.”** නිම්මි කියද්දි හේමලතා නිහඬ වුණා.

සමාධි ඩයස්






# ඔන්ලයින් අනංගයන්ගෙනුත්



# ලිංගික රෝග බෝ වෙන්න පුළුවන්

කතාව ඔබට කියන්නට පහසු වීම තකා මම ඇයව තරුෂි නමින් හඳුන්වමි. දහතර හැවිරිදි තරුෂි සුප්‍රකට වුත්, ධනවත් වුත් ව්‍යාපාරිකයෙකුගේ එකම දියණියයි.

පොතපතේ වැඩටත්, ක්‍රීඩාවලටත් එක සේ දක්ෂ ඇය ඒවායින් කෙමෙන් කෙමෙන් ඈත් වෙන්නට පටන්ගත්තේ දහහතරවැනි උපන්දිනයට පියාගෙන් ලැබුණු ජංගම දුරකතනය නිසාය. තරුෂිට ෆේස්බුක් හරහා තිමිර හමුවන්නේද ඔය අතරය. ඔන්ලයින් පණිවිඩ හුවමාරුවෙන් ආරම්භ වූ පෙම් සබඳතාවය වීඩියෝ ඇමතුම් දක්වා දික්ගැස්සීමට වැඩි දිනක් ගතවූයේ නැත.

ඒ කතා කරන හැම මොහොතකම ඔහු ඇයට කීවේ **"මට ඔයාගේ මූණ නොබලා ඉන්න බැහැ... මම තරම් මේ ලෝකේ කවුරුත් ඔයාට ආදරේ නැහැ... මම ඔයාව මලක් වගේ බලාගන්නවා..."** වැනි පැණි බේරෙන රස කතාය. තිමිරගේ ආදරණීය කතා තරුෂිගේ කනට මී පැණිවලටත් වඩා රහට දැනුණාය. මෙතරම් ප්‍රේමණීය ආදරවන්තයෙකු ලැබීමේ සතුටට ඈ විටෙක තනිව හිනැහුණාය.

**"මට ඔයාව ඇත්තටම මුණගැහිලා කතා කරන්න ආසයි."**

තිමිර තරුෂිව මුණගැසීමට අවශ්‍ය බව පැවසුවේ පෙම් පලහිලව්වට මාස දෙකක්වත් ගතවීමට පෙරාතුවය.

පාසලටත් අමතර පංතිවලටත් තරුෂිව ඇරලවූයේ ඇගේ පියායි. ඒ නිසා හමුවීම දවසින් දවස කල්දැමීමට තරුෂිට සිදුවිය.

**"හැමදම මේක මෙහෙම කරන්න බැහැනේ. ඔයාට මාව හම්බවෙන්න එන්න බැරිනම් කියන්න. අපි මේ සම්බන්ධය නවත්තමු."** තිමිර පැවසූයේ තරමක් විස්සෝපයෙන්ය.

තිමිරගේ වටිනා ආදරය වෙනත් තරුණියකට හිමිවේ යැයි සිතූ තරුෂි පියා අමතර පංතියට ඇරලවා ගිය පසු පංතියට නොයා හෝ තිමිර මුණගැසීමට තීරණය කළාය.

තමා දුරකතන වීඩියෝවලින් දුටු තිමිරට වඩා ඒ පුද්ගලයා වැඩිමහල් බව ඇය දුටුවේ ඔහු පැමිණි සිටි ත්‍රීවිලර් රථයට ගොඩවූවාටත් පසුවය. ඔහු වෙතින් පලායාමට උත්සාහ කළත් ගොදුර ඩැහැගෙන මිසක් නතර නොවූ ඔහු නැවතත් ඇයව පංතිය අසලට ගෙන හැරලූයේ පැය දෙක තුනකට පසුය. ඔහු වීඩියෝ ඇමතුම් ගෙන ඇත්තේ මුහුණු යෙදවුමක් (Face App) යොදා බව ඈ තේරුම්ගන්නා විටත් සියල්ල සිදුවී හමාරව තිබුණාය.

මේ කිසිත් නොදන්නා ඇගේ දෙමාපියන් ඇයව මුලින්ම යොමුකර තිබුණේ මනෝ වෛද්‍යවරයෙකු වෙතය. ඒ ඇයට ඇතිව තිබූ විශාදය තත්ත්වයට ප්‍රතිකාර ගැනීමටය. එහිදී හෙළි වූ කරුණු කාරණාවලට අනුවය ඇයව ලිංගාශ්‍රිත සායනය වෙත යොමු කරන ලද්දේ. ඒ වනවිටත් සයමස් ගැබිනියක් වූ ඇයට ගොනෝරියාව නම් රෝගයද වැළඳී තිබිණි.

මෙය ඔන්ලයින් පෙම් සබඳතා නිසා දහවල් වළේ වැටුණු එක් තරුණියගේ කතාවක් පමණි. වෛද්‍ය ජීවිතයේදී දුටු මෙවන් සත්‍ය සිදුවීම් හිසේ කෙස් ගාණට උදාහරණ ලෙස පැවසීමට හැකිවීම කණගාටුදායකය.

බොහෝවිට මේ ඔන්ලයින් අනංගයන්ගේ ඉලක්කය යොමුවන්නේ මැදිවයස් ගතකරන විවාහක කාන්තාවන් සහ 9, 10, 11 වැනි වසරවල පාසල් දරුවන් වෙතයි. ඉන්ස්ටග්‍රෑම්, ෆේස්බුක් ඇතුළු සමාජ මාධ්‍ය ජනප්‍රිය වීමට පෙරාතුව මිස් කෝල් (Missed Call) හරහා කාන්තාවන් ලිංගික සබඳතාවලට පොළඹවාගැනීමේ ප්‍රවණතාවක් දක්නට ලැබුණු අතර, සමාජ මාධ්‍යවල ජනප්‍රියත්වය සමඟ පෙරට වඩා අන්තර්ජාල ලිංගික අපචාරවල පැහැදිලි වර්ධනයක් දක්නට ලැබේ.

ඔන්ලයින් ක්‍රමයට **'කැෂුවල් සෙක්ස්'** නැතහොත් ස්ථිර නොවන ලිංගික සහකරුවන්, සහකාරියන් සොයා යන බොහෝ පුද්ගලයන් මානසික ගැටලු සහිත මත්ද්‍රව්‍ය භාවිත කරන නැතහොත් ලිංගික සහකරුවෙකු සොයගැනීමට බැරිතරමේ ශරීර විකෘතිතාවක් හෝ වෙනත් ගැටලුවක් ඇති අයවලුන්ය. එක් සහකරුවෙකුට සීමා නොවන එවැන්නෙකු ලිංගාශ්‍රිත රෝගයකින් පීඩා විඳින්නෙකු වීමට ඇති ප්‍රවණතාවය ඉහළය.

## නිරුවත් ජායාරූප ඉල්ලපු පලියට දෙන්නෙ ඇයි?

තරුණියන් කිහිපදෙනෙකුට එකවර කෙටි පණිවිඩ යැවීම අන්තර්ජාල ලිංගික අපචාර සඳහා කාන්තාවන් ගොදුරු කරගන්නවුන්ගේ පළමු පියවරයි. එයින් පිළිතුරු ලැබෙන ගිණුම් තෝරාගෙන එම තරුණියන් සමඟ උපක්‍රමශීලීව කුළුපග වී ඔවුන්ගේ නිරුවත් ඡායාරූප හෝ වීඩියෝපට ගෙන්වාගැනීම ඇතැමුන්ගේ එක් කූඨෝපායකි. පසුව සිදුවන්නේ ඒවා සමාජ මාධ්‍යවල හෝ පවුලේ නෑ හිතවතුන් අතර ප්‍රසිද්ධ කරනා බවට තර්ජනය කර අදාළ කාන්තාව ලිංගික කාර්යයකට පොළඹවාගැනීම හෝ මුදල් කප්පම් ලබාගැනීමයි.

නිරුවත් ඡායාරූප හුවමාරු කරගැනීම නිසා මෙවන් තර්ජන නීතිය ඉදිරියට ගෙන යාමට බියවන ඇතැම් කාන්තාවන් මෙවැනි පුද්ගලයන්ගේ දැල්වලට පහසුවෙන්ම හසුවේ. පාසල් යන දුවා දරුවන්ට ගැටලු නිරාකරණයට ඇති ජීවන කුසලතාවය මඳ හෙයින් ඔවුන්ද ඉතා පහසුවෙන් මෙවන් පුද්ගලයන්ට ගොදුරු වෙයි. ඊට අමතරව යොවුන් වියේදී ඇතිවන ලිංගික හැඟීම් පාලනයට නොදන්නාකම නිසා ඇතැම් තරුණ දරුවන් ස්වකැමැත්තෙන්ම මෙවන් දේට එකඟ වෙති.

ඔන්ලයින් හරහා හමුවන සහකරුවන් සමඟ පවත්වන ලිංගික සබඳතා හේතුවෙන් උපදංශය, සුදු බිංදුම, හර්පීස්, HIV, ලිංගික ඉන්නන්, සිෆිලස් ඇතුළු ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග මෙන්ම ගැබ්ගෙළ පිළිකා, ශිෂ්ණ පිළිකා පවා ඇති විය හැකිය. විවාහක කාන්තාවක් නම් එම රෝග ඇගේ සැමියාට සම්ප්‍රේෂණය වීමේ අවධානමක් ඇති බවද කිව යුතුය.

ඔන්ලයින් අනංගයින්ගේ ඉලක්කය වන්නේ ආර්ථික ගැටලු සහිත පවුල්වල දරුවන් පමණක් යැයි වැරදි වැටහීමක් සමාජය තුළ ඇත. එහෙත් දරුවන් වෙනුවෙන් කාලය වැය කිරීමට අපහසු කාර්යබහුල දෙමාපියන් සිටිනා ආර්ථික අතින් සවිමත් පවුල්වල දරු දැරියන්ද මෙවන් දෙයට ඉතා පහසුවෙන් ගොදුරු වන බව අත්දැකීමෙන් දැක ඇත්තෙමි. ඒ නිසා මවක පියෙකු ලෙස නිතර දරුවන් වෙනුවෙන් කාලය යෙදවීම වැදගත්ය. එසේම ඔන්ලයින් අධ්‍යාපන කටයුතුවල නිතර වන දුවා දරුවන්ට මෙවන් දේ හි බරපතළකම පිළිබඳව නිසි ලෙස දැනුවත් කිරීම දෙමාපිය වැඩිහිටියන්ගේ යුතුකමයි.

ඔන්ලයින් හරහා හඳුනාගන්න අයෙකු විසින් ඔබගේ නිරුවත් ඡායාරූප හෝ වීඩියෝපටයක් ඉල්ලූවිට කළ හැකි හොඳම දේ එම පුද්ගලයාට ඔබ සමඟ සම්බන්ධවීමට ඇති සියලු මාර්ග අවහිර කිරීමයි. ඔබට සැබවින් ආදරය කරනා තැනැත්තෙකු මාසයක් දෙකක් කතා කළ පමණින් නිරුවත් ඡායාරූප නොඉල්ලන බවත් ගොනා හැරෙන්නේ පොල් පැළය කන්නට බවත් බුද්ධිමත්ව සිතා බැලීම වඩා හොඳය. නැතහොත් ප්‍රතිපත්තියක් ලෙස ඔබ එවන් දෙයට අකමැති බව සෘජු ලෙස පැවසීමටත් ඔබට හැකිය. එසේ කිරීමටත් අපහසුනම් අඩුතරමේ මුහුණ නොපෙනෙන අයුරින් ඡායරූප යැවීමටවත් කාන්තාවක ලෙස ඔබ බුද්ධිමත් විය යුතුය. විශ්වාසවන්ත ලිංගික සහකරුවෙකු සමඟ හැර සිදුවන ඕනෑම ලිංගික සබඳතාවයක යම් අවධානමක් තිබෙන බව මා අමුතුවෙන් කිව යුතු නැතැයි සිතමි.

තමාගේ ශරීරයේ වගකීම හිමිවන්නේ තමාටය. එවැනි සබඳතාවයක වගකීම ගැනීමට ඔබ සූදනම් නැතිනම් ඔබ කළ යුතු හොඳම දේ සෘජුවම එයට විරුද්ධත්වය ප්‍රකාශ කිරීමයි.

මෙවන් අන්තර්ජාල තර්ජනයකට හෝ අපචාරයකට ලක්වන්නේ නම් නිහඬව ඒවාට ඉඩ නොදී ළඟම ඇති පොලිස් ස්ථානයේ අන්තර්ජාල අපරාධ අංශයේ පැමිණිල්ලක් ඉදිරිපත්කිරීමට නැතහොත් කාන්තා හා ළමා කාර්යාංශයට පැමිණිලි කිරීමට ඔබට හැකියාව ඇත.

අද කතාවට පාදක වූ දියණියව අතරවරයට ලක්කළ පුද්ගලයා අත්අඩංගුවට ගැනීමට හැකි වූ බවත් අවසානයේදී සටහන් කළ යුතුය. දියණියගේ ලිංගාශ්‍රිත රෝගය නිට්ටාවටම සුව කළ අතර, ඇයට බිහි වූ දරුවා නීත්‍යානුකූලව හදාවඩා ගැනීමට ලබාදුන් බව පසුව දැනගන්නට ලැබිනි. කරුණු කාරණා එසේ වුවත් ජීවිත කාලය පුරාවට ඒ සිදුවීම ඇගේ අඳුරු මතකයන් අතර රැඳෙන්නට ඉඩ ඇතැයි මම සිතමි.



**ප්‍රගීත් ප්‍රේමදාස**
**ලිංගික සෞඛ්‍ය පිළිබඳ විශේෂඥ වෛද්‍ය**

**සෙව්වන්දි හෙට්ටිආරච්චි**








සිසුන්ගේ මනසට ඉතිහාසය පාඩම් කාවැද්දීමට නිශානි යොදාගත් මීම්ස් කිහිපයක්

# මළත් අමතක නොවෙන විදියට ඉතිහාස පාඩම් කියාදෙන ගුරුතුමී

## නිශානි තිලකරත්න

**ඉතිහාසය කියන්නෙ දරුවො ටිකක් අකමැති විෂයක්. ඒ නිසා මට ඕන වුණා වෙනස් විදියකට ඉතිහාසය උගන්වන්න**



**පාසල් යන දරුවන්ගෙන් බොහෝදෙනෙකුට ඉතිහාස විෂයය වහකදුරුය. අතීත රාජධානි, ඒවා පාලනය කළ රජවරුන් සහ ඒවාට අදාළ කාලසීමා මතක තබාගැනීම පොඩි එවුන්ට තියා මහ එවුන්ටත් ලේසි නැත. ඒ නිසා එකල නම් 'කට්' කරන පීරියඩ් ලිස්ට් එකේ ඉංගිරිසි පීරියඩ් එක හැරුණුකොට මුලින්ම තිබුණේ ඉතිහාස පීරියඩ් එකය. නමුත් මෙකල දරුවන්ට එහෙම කරන්නට අවශ්‍ය නැත. අපහසු විෂයයක් සරලව උගනින්නට ඔවුන්ට ඕනෑතරම් පහසු ක්‍රම සහ විධි ඇත. මේ අතර මළත් අමතක නොවන පරිදි අමුතු ක්‍රමයකට ඉතිහාසය උගන්වන බොහොම තරුණ සහ සුන්දර ගුරුවරියක් අපිට මුණගැසුණි. ඇය ඉතිහාසය උගන්වන විදිය පමණක් නොව ඇගේ ජීවිත කතාවද ඔබ දැනගන්නට වටින තරමේ එකකි. එනිසා 'ධරණී' කවරය දරා සිටිමින් ඇගේ කතාව කියන්නට අපි ඒ ඉතිහාස ටීචර්ට ඇරයුම් කෙරුවෙමු. මේ ඇගේ කතාවයි.**

පුංචි සන්ධියේ සිටම නිශානිට තිබුණේ ගුරුවරියක් වීමේ සිහිනයයි. ඇතැම් දට ඇය මවගේ සාරියක් අමාරුවෙන් ඇඟේ පටලවාගෙන කණ්ණාඩි මේසය ළඟට ගොස් සිසුන් සිතින් මවාගෙන පුංචි ගුරුවරියකට ඇන්දය.

නමුත් ඒ හීනය හැබෑ කරගැනීමට නම් හොඳින් ඉගෙනගැනීම අනිවාර්යය බව නිශානි දැන සිටියාය. වරින් වර විවිධ වෙස් දරාගෙන ආර්ථික ප්‍රශ්න ඇය ඉදිරියට ආවත් ඇයව වට්ටන්නට නොහැකි වූයේ එනිසාය. එවැනි අනේකවිධ දුෂ්කරතා හමුවේ සරසවි සිහිනය සැබෑ කරගැනීමට ඈ නොකළ කැපකිරීමක් නැත.

**"මං සාමාන්‍ය පෙළ ලිව්වේ 2011 අවුරුද්දේ ගමේ පාසලේ. ඒ පල්ලේවත්ත ගාමිණී දිසානායක ආදර්ශ විද්‍යාලයේ. ප්‍රතිඵලය තිබුණේ A හතයි B එකයි C එකක් විදිහට. ඒක ඒ අවුරුද්දේ මගේ පාසලේ හොඳම ප්‍රතිඵලය වුණා. සාමාන්‍ය පෙළ සමත්වෙලා මං 2014 අවුරුද්දේ වාණිජ අංශයෙන් උසස් පෙළ කරන්න ගියේ බදුල්ල විශාඛා උසස් බාලිකා විද්‍යාලයට. උසස් පෙළට A දෙකයි B එකක් එක්ක හොඳ ප්‍රතිඵලයක් ගන්න මට පුළුවන් වුණා. මගේ දිස්ත්‍රික් රැන්ක් එක වුණේ දසය. එදා නම් මං ගොඩාක් සතුටු වුණා."**

හුන්නස්ගිරි කන්ද තරම් ලොකු සතුටක් මැද වුවද නිශානිට දුක හිතෙන කතාවක් අසන්නට ලැබුණේ ප්‍රතිඵලත් ආ පසුය. ඒ දෙමව්පියන් ඇය වෙනුවෙන් විඳි නොවිඳිනා දුක් කම්කටොලු ගැනය.

**"උසස් පෙළ කාලේ මං හිටියේ බෝඩිං වෙලා. ඒ නිසා ගෙදර අයට මං වෙනුවෙන් ගොඩක් වියදම් දරන්න වුණා. බෝඩිං ගාස්තු, ටියුෂන් ගාස්තු, බස් ගාස්තු වගේ දේවල්වලට ලොකු මුදලක් ගියා. ඒ වෙනකොට තාත්තත් ටිකක් අසනීපෙන් හිටියේ.**

**අයියටත් ලොකු වයසක් නෑ. තාත්තගේ ව්‍යාපාරත් ටික ටික බංකොලොත් වෙලා තිබුණේ. ඉතින් මගේ වියදමට ගෙදරින් සල්ලි එවලා තිබුණේ ගිනිපොලියට ණයට අරන්. ඒ හැමදේම මං දැනගත්තේ උසස් පෙළ ප්‍රතිඵල ආවටත් පස්සේ. එතකල් ඒ අය මට කිසිම දෙයක් කිව්වේ නෑ."**

සරසවි සිහිනය යථාර්තයක් වුවද ඒ හේතු නිසා ඇයට ඉන්පසු ඒ සිහිනයේ පියමං කරන්නට හිත ඉඩ දුන්නේ නැත.

**"මං කැම්පස් යන්න ගොඩාක් ආසාවෙන් හිටියේ. ඒත් ගෙදර තිබුණු ආර්ථික ගැටලුත් එක්ක මට ඒ ගමන යන්න හිතුණේ නෑ. මං දැනගෙන හිටියා කැම්පස් ගියොත් මගේ අම්මා තාත්තා ගෙවල් දොරවල් විකුණලා හරි මට වියදම් කරනවා කියලා. ඒත් එයාලට තවත් දුක් විඳින්න දෙන්න බැරිකමට රැකියාවක් කරන්න තීරණය කළා."**

අලුත් රැකියාවට ගියද ඒ ජීවිතය ඇය හිතන තරම් පහසු වූයේ නැත. ලැබුණු වැටුප ඇයට හැරෙන්නටත් මදිය. අවසානයේ ඇය දුකට හැඬුවාය. පොඩි වෙලාවක් නොව පැය ගණන් වරු ගණන් හැඬුවාය.

**"මං පෞද්ගලික බැංකුවකයි රැකියාවට ගියේ. ඒත් බෝඩිමට ගෙවලා කාලා බීලා ඉවරවෙද්දි ගෙදර බර කරට ගන්න අමාරු වුණා. අනන්තවත් බඩගින්නේ ඉඳලා සල්ලි ටිකක් ඉතුරු කරගන්න හැදුවත් ඒකත් ලේසි වුණේ නෑ. අන්තිමේ තනියම බෝඩිමට වෙලා ඇඬුවා. දවසක් දෙකක් නෙවෙයි දිගටම ඇඬුවා. ඇත්තටම ඒ කාලේ ගෙවෙමින් තිබුණේ සතුටකින් නෙවෙයි."**

නිශානිගේ ජීවිතයට අලුත් වසන්තයක් එන බවට ඉඟි පහළවෙන්නේ මේ අතරය.

**"මං බැංකුවේ වැඩ කරගෙන යද්දි තමයි විද්‍යාපීඨ ගැසට් කළේ. ඒ 2017 අවුරුද්දේ. අන්තිමේ මං විද්‍යාපීඨ දැම්මා. ඒ මගේ කැමැත්තට වඩා අම්මලාගේ ඉල්ලීමට. මොකද අම්මලත් ගොඩාක් ආසාවෙන් හිටියා මං ගුරුවරියක් වෙනවට. දැන් මට හිතෙනවා එදා ගත්ත තීරණේ හරියටම හරි කියලා. මං ඉතිහාස ගුරුවරියක් විදිහට වැඩ කරන්න පත්වීම ලැබෙනකන් හරිම ආසාවෙන් ඉන්නේ."**

ගුරුවරියක් ලෙස විද්‍යා පීඨයෙන් පිටත්ව රජයේ පාසලක පුහුණු ගුරුවරියක් ලෙස කලක් ඇය සේවය කළාය. ස්ථිර පත්වීම් ලැබෙනතුරු දැන් ඇය ටියුෂන් ක්ෂේත්‍රයට පයගසා තිබේ. ඇගේ වෙනස්ම ඉගැන්වීමේ රටාව නිසා ටියුෂන් පන්ති ක්ෂේත්‍රය තුළ මේ ගුරුතුමිය ඉතා ඉක්මනින් ජනප්‍රිය විය.

**"මගේ මූලික විෂය ඉතිහාසය. ඒක ළමයි කවදත් ටිකක් අදිමදි කරන විෂයක්. මට උවමනා වුණේ ඒ තත්ත්වය නැති කරන්න. ඒකට මං යොදාගත්තේ සමාජ මාධ්‍ය සහ ඒ තුළ ප්‍රසිද්ධ වූ මීම්ස්. මොකද ගොඩාක් ළමයි සමාජ මාධ්‍ය පරිහරණය කරනවා.**

**මං හදන ඉතිහාසය මීම්ස් බලන හැමෝම කියන්නේ 'ආයෙත් නම් ඒ කොටස අමතක වෙන්නේ නෑ' කියන එක. හරිම වෙලාවට හරිම ඉතිහාස කරුණ උලුප්පලා ගන්න නිසා කාලීන කතාබහට ගැළපෙන විදියට හදන මීම්ස් ඉතා ඉක්මනින් සමාජ මාධ්‍ය තුළ පැතිරෙනවා."**

ඇය නිශානි තිලකරත්නය. ඉතිහාසය පසෙක තබා සංවාදය නිමා කරන්නට පෙරාතුව ඇය හරි අපූරු ජීවිත පාඩමක්ද කියා දුන්නාය.

**"ආර්ථික අපහසුතා නිසා උසස් අධ්‍යාපනය අඩාල වෙන දරුවෝ අපේ රටේ ගොඩාක් ඉන්නවා. ඒ අයට කියන්න තියෙන්නේ එක පාරක් වැහුණොත් තව පාරවල් ගොඩක් විවර වෙනවා. තමන්ගේ දක්ෂතා ඇසුරෙන් ඒ හරි පාර මොකක්ද කියලා අඳුරගන්න.**

**ඔබ අධිෂ්ඨානය සහ කැපවීම එක්ක ඒ පාරේ යන තාක් සොබාදහමත් ඔබට උපකාර කරනවා. මට ඒක දැනිලා තියෙනවා."**

රුවන් එස්.සෙනවිරත්න
ඡායාරූප - සමන් අබේසිරිවර්ධන

Skin Care with Malinga



# බිලීචින් ක්‍රීම් ගාලා 'රත්තරන්' අයියලට

මේක මම දන්නා අඳුනන කෙනෙක්ට වෙච්චි ඇත්තම ඇත්ත සිදුවීමක්. මේ කියන කාන්තාව සුදුත් නැහැ. හැබැයි කළුත් නැහැ. ඇයට තිබුණා ඇගේම කියලා හරි ලස්සන පාටක්.

තමන්ට ලැබිලා තියෙන දේවල් ගැන සතුටු වෙනවට වඩා අනුන්ට තියෙන දේවල් දිහා බලලා හූල්ලන්න සමහර උදවිය උපන් හපන්නේ. ඔන්න ඉතින් තියෙන පාට එපෝ! කියලා සුදු වෙන්න හිතාගෙන මෙයත් ගෑවා බිලීචින් ක්‍රීම් එකක්. ඒක හරි ලස්සන ඩප්පි පොඩ්ඩක තිබුණු හැමෝම දන්න කියන ක්‍රීම් වර්ගයක්. ක්‍රීම් එක ගෑවේ සතියයි දෙකයි මෙන්න මෙයා ශ්වේත වර්ණයෙන් බබළනවා. හරියට ඒ එයා නෙවේ වගේ. ඔන්න ඊළඟට තමයි හොඳම වැඩේ වෙන්නේ.

ක්‍රීම් ගාන්න පටන් අරන් මාසයක් දෙකක් යද්දි හදිසි උවමනාවකට මෙයා එයාගේ රත්තරන් මාලේ උකස් තියන්න ගිහිල්ලා.

**"මේ මාලේ උගස් තියන්න බෑ නෝනා.. මේකේ සංයුතිය වෙනස් වෙලා. කිසි වටිනාකමක් නැහැ."**

එහෙම කිව්වම එයාට දවල් තරු පෙනුණාලු. රත්තරන්වල සංයුතිය වෙනස් වුණේ බිලීචිං ක්‍රීම්වල බලේට කියලා ටිකක් විපරම් කරද්දි තමයි දැනගෙන තියෙන්නේ.

ඉතින් රත්තරන්වලට පවා එහෙම හානි කරන්න පුළුවන් බිලීචිංවලට අපේ සමට හානි කරන එක කජු කිරි වැඩක් නේද කියලා හිතුණු නිසා තමයි ඒ ගැන ටිකක් කතා කරන්න හිතුවේ.

**'කළු කැතයි, සුදු ලස්සනයි', 'සුදු සුබයි, කළු අසුබයි'** වගේ ඒවා අදක ඊයෙක ඉඳලා ඇහෙන කතා නෙමෙයි. ඉස්සර සුදු පැහැති සමෙන් නියෝජනය වුණේ වංශවත් බව, සශ්‍රීකත්වය වගේ දේවල්ලු. ඉතින් ඊජිප්තුව, ග්‍රීසිය, රෝමය වගේ ගොඩක් රටවල රජවරුන් කළු සමක් ඇති කාන්තාවන් මුළුතැන්ගෙයි මෙහෙකාරියන් විදියට පත්කරලා තියෙනවා.

**මේ මෑතකදී ඊජිප්තුවෙන් මීට අවුරුදු 3,500කට කලින් ජීවත්වෙච්චි අවුරුදු 20-25ක කියන්න පුළුවන් කාන්තාවකගේ මමියක හිසක් හොයාගත්තා. ඇයට ඕක්‍රොනොසිස් කියන චර්ම ආබාධය වැළඳිලාලු. මේක හැදිලා තියෙන්නේ දීර්ඝ කාලයක් විරංජන ආලේප භාවිත කළ නිසාලු. ඒ සළකුණු තාම ඒ හිසේත් දකින්න පුළුවන්**

ග්‍රීක මිථ්‍යා කතාවල ඇන්ඩොමීඩා කියලා දෙවඟනක් ඉන්නවා. ඇය ඉතියෝපියානු කුමරියක්ලු. හැබැයි පොත්වලත් දේවස්ථානවලත් සිතුවම් කරල තිබුණු ඇගේ කළු පාට රුව පුනරුදය කාලෙදි සුදු පාටින් වර්ණ ගැන්නුවලු.

වර්ණ භේදවාදය, එතකොට 19 වැනි ශතවර්ෂයේ ඇතිවුණු හොලිවුඩ් නිළි මේනියාව වගේ දේවලුත් **'කළු කෙල්ලෝ කැතයි, සුදු කෙල්ලෝ ලස්සනයි'** කියන කතාබහ ඇතිවෙන්න හේතුවෙලා තියෙනවා.

**කළු කැතයි, සුදු ලස්සනයි', 'සුදු සුබයි, කළු අසුබයි' වගේ ඒවා අදක ඊයෙක ඉඳලා ඇහෙන කතා නෙමෙයි**

හොලිවුඩ්වලට නිළියෝ තෝරනකොට ප්‍රධාන චරිතෙට අරන් තියෙන්නේ සුදු කෙල්ලන්ව විතරයි. කළු අයට අතවැසි චරිත. චිත්‍රපටයක ප්‍රධාන නිළිය ඡවි වර්ණයෙන් බබළන්න ඕනය කියන එක අදටත් ඉතින් ගොඩක් දුරට වලංගු දෙයක්නේ.

ඔන්න ඔය වගේ හේතු නිසා ලෝකේ වටේ ඉන්න ගොඩක් අයට සුදුවෙන උන්මාදය ඇති වුණා. ඉතින් දැන් සුදු පාට හමක් ලැබෙනවා කිව්වොත් ගොඩක් කාන්තාවන් නොකරන දෙයක් නැහැ. සුදු වෙනවා කිව්වොත් ගෑනු ගොම වුණත් උලා ගනී කියලා කතාවටත් කියන්නේ ඒකනේ.

සුදු වෙනවා නම් මේ අය ඕන අටමගලක් සල්ලි දීලා ගන්නවා කියලා දැනගත්තු වෙළඳ ප්‍රජාව තමයි කාන්තාවන්ට බිලීචිං ක්‍රීම් හඳුන්වලා දුන්නේ.

සමහරු මේකට **'මැජික් ක්‍රීම්'** කියලත් කියනවා. 19 වැනි සියවසේ ඉඳලා අද දක්වා මේ ක්‍රීම් වෙළඳම ගජරාමෙට සිද්ධවෙනවා.

ඒ විතරක් නෙවේ ඒ අයගේ ආලේපන විකුණගන්න කළු අය කැතයි සුදු අය ලස්සනයි කියලා ඇඟවෙන වෙළඳ දැන්වීම් පවා හැදෙනවා.

අප්‍රිකානු රටවල කාන්තාවන් 80%ක් බිලීචිං ක්‍රීම් ගානවලු. එතකොට ආසියානු රටවල 40%යි.හරි දැන් අපි අපේ රට දිහාවට හැරෙමු. ලංකාවෙ අපේ අනන්‍යතාවය තමයි තළෙළු සම. ඉස්සර හිටපු බවලතුන්ට ඔය සුදු උන්මාදය තිබිලා නැහැ.

තමන්ට ලැබුණු සම කළුද සුදුද කියලා නොහිතා තියෙන හමේ නිරෝගී බව රැකගන්න ඒ අය එක එක දේශීය සත්කාර කරලා තියෙනවා.

ලංකාවේ බිලීචිං ක්‍රීම් ප්‍රසිද්ධ වුණේ දැනට අවුරුදු පහළොවකට විස්සකට වගේ උඩදි. හැබැයි අද වෙනකොට බිලීචිං උලන ප්‍රවණතාවය එදට වඩා වැඩිවෙලා තියෙනවා.

# කාට බොරු කළත් බොරු කරන්න බෑ

සෙව්වන්දි හෙට්ටිආරච්චි

සමහර මංගල දැන්වීම්වල, **'පැහැපත් සුදු සමක් ඇති තරුණියක් සොයනු ලැබේ'** කියලා දලා තියනවා දැකලා තියෙනවද? ඉතින් දැන් ගොඩක් අය බ්ලීච්ං ක්‍රීම් ගාන්නේ මූණත්තහඩුව සුදු කරගෙන පුරුෂ ආකර්ශනය ලබාගන්න.

තව සමහර දුඹුරු ළමිස්සියෝ ඉන්නවා කිරි සුදු ඇප් දලා සමාජ මාධ්‍යවල පින්තූර ප්‍රසිද්ධ කරන. ඔන්න ඊටපස්සේ කරන්නේ බ්ලීච්ං ක්‍රීම් ටිකක් ගාලා ඇත්තටම සුදු වෙන්න පොටක් හොයන එක.

මොනවද මේ බ්ලීච්ං ක්‍රීම් කියන්නේ? මර්කරි නැත්නම් රසදිය, Hydroquinone, Corticosteroids වගේ සමට අහිතකර රසායනික සංයෝග ටිකකුයි එහෙන් මෙහෙන් එකතු කරගත්තු ක්‍රීම් ටිකකුයි එකට මිශ්‍ර කරලා තමයි බ්ලීච්ං ක්‍රීම් හදන්නේ. මේවයේ කිසිම ගුණාත්මකබවක්, ප්‍රමිතියක් නැහැ. මේක එක්තරා මාෆියාවක් විදියටත් හඳුන්වනවා.

ඒ නිසාම ගොඩක් රටවල බ්ලීච්ං ක්‍රීම් තහනම්! බ්ලීච්ං ක්‍රීම් ගෑවම මොකද වෙන්නේ කියලත් අපි කතා කරමු. සමකාසන්න රටවල අයගේ සම කළුයි. සම කළු වෙන්නේ සමේ වැඩිපුර මෙලනින් තියෙන නිසා. අනේ ඇත්ත ට මොකට ලැබුණද අපිට මෙච්චර මෙලනින්? ඒ නැත්නම් අපිත් සුදුයිනේ!

ඔහොම හිතුවට අපිට මෙලනින් ලැබෙන්නේ සොබාදහමේ දයාදයක් විදියට. හිරුකිරණේ තියෙන අහිතකර UV කිරණින් සම රැකගන්න මෙලනින්වලට පුළුවන්. බ්ලීච්ං ක්‍රීම් ගෑව හැටියේ ඒවයේ තියෙන අහිතකර රසායනික සංයෝග අනේ අර මෙලනින් ටික බිඳලා දනවා. ඊටපස්සේ ඉතින් දවසින් දෙකෙන් සුදුවෙන එක ගැන අහන්න දෙයක් නැහැ.

දවස් දෙකක් ගාද්දී තම්බපු ඉස්සෙක්ගේ පාටට සම සුදු කරන්න තරම් මේවා පවර්ෆුල්. හැබැයි ගොඩක් අය බ්ලීච්ං ක්‍රීම් ගාන්නේ මුහුණට විතරයි. ඊටපස්සේ වෙන්නේ මූණ ජපන් කඳ ජර්මන් කකුල් ඉතාලි කියලා එක එක විහිළු තහළුවලට ලක්වෙන එක.

අනික මේවා එක දවසක් ගාලා මදි. හැමදාම සුදුවට ඉන්න ඕනෙ නම් හැමදාම ක්‍රීම් ගාන්න ඕනේ.

දිගින් දිගටම බ්ලීච්ං ගාන කෙනෙක් මැරුණාට පස්සෙත් ඒ ලක්ෂණ හොයාගන්න පුළුවන්ලු. මේ මෑතකදී ඊජිප්තුවෙන් මීට අවුරුදු 3,500කට කලින් ජීවත්වෙච්චි අවුරුදු 20-25ක කියන්න පුළුවන් කාන්තාවකගේ මමියක හිසක් හොයාගත්තා.

ඇයට ඕක්‍රොනොසිස් කියන චර්ම ආබාධය වැළඳිලාලු. මේක හැදිලා තියෙන්නේ දීර්ඝ කාලයක් විරංජන ආලේප භාවිත කළ නිසාලු. ඒ සළකුණු තාම ඒ හිසේත් දකින්න පුළුවන්.

බ්ලීච්ං ක්‍රීම් ගාන්න ගාන්න සම තුනී වෙනවා. සම ඕනවට වඩා තුනී වෙලා යටින් තියෙන ලේ නහර පවා පේන්න පටන්ගන්නවා. කාලයත් එක්ක සමේ වර්ණක එකතැනකට එක්කාසු වෙලා පිග්මන්ටේෂන් හැදෙන්න බලනවා. එතකොට කුරුලෑ, අවපැහැගැන්වීම්, දද, තුවාල, වණ එහෙම ඇති වෙනවා.

අයියෝ! එච්චරද? නෑ...

මේවා බ්ලීච්ං ක්‍රීම් නිසා ඇතිවෙන සුළු ප්‍රතිඵල විතරයි.

බරපතළම හරිය කියන්නේ දැන්.

හිරුඑළියෙන් සම ආරක්ෂා කරන්න මෙලිනින් නැති නිසා සමේ පිළිකා ඇතිවෙන්න පුළුවන්. ඊට අමතරව තරබාරු වීම, සම ඉදිදීම, අධිරුධිර පීඩනය, වකුගඩු නරක්වීම, මතකය අඩු වීම, අතපය වෙව්ලීම විතරක් නෙවේ ලැබෙන්න ඉන්න දරුවන්ගේ ජාන විකෘති කරන්නත් මේ බ්ලීච්ං මාරයාට පුළුවන්.

**බ්ලීච්ං ක්‍රීම් ගෑව හැටියේ ඒවයේ තියෙන අහිතකර රසායනික සංයෝග මෙලනින් ටික බිඳලා දානවා. ඊටපස්සේ ඉතින් දවසින් දෙකෙන් සුදුවෙන එක ගැන අහන්න දෙයක් නැහැ**

කට බිම උලාගෙන මේ දේවල් කිව්වත් සමහරුන්ට මේ පුරුද්දෙන් ගැලවෙන්න බැහැ. සුදුවීමේ උන්මාදය මානසික ව්‍යාධියක් බවට පත්වෙලා ප්‍රතිකාර ගන්න යුවතියන් වුණත් දැන් සුලබයිලු.

අනික බ්ලීච්ංවලින් සමට වෙන හානිය සුව කරන්න ලේසි නැහැ. එකපාරක් බ්ලීච්ං ගෑවත් ඒ සංයෝග මාස හතර පහක්වත් සමේ රැඳෙනවා.

ඒ නිසා මුල්ම දේ තමයි **'කළු කැතයි'** කියන සංකල්පය ඔලුවෙන් මකලා දන්න. තමන්ට උපතින් ලැබුණු තමන්ගේ සමට ආදරේ කරන්න, ගෞරව කරන්න. දකින දකින හැම කෙනා එක්කම තමන්ව සංසන්දනය කරන්න යන්න එපා. එයාට එයා වෙන්න දෙන්න, ඔයා ඔයා වෙන්න. හැම කෙනෙක්ටම ආවේණික ලස්සනක් තියෙනවා කියන එක තේරුම් ගන්න. ඉන්දියානුවෝ කියන්නේ ඡවි වර්ණයට කෑදර උදවිය. හැබැයි මෑතක ඉඳලා ඉන්දියාවේ සමහර ප්‍රාන්තවල කළු පාටට හොඳ තැනක් දෙන්න පටන් අරන්. සීතා දේවී, ශිව, ක්‍රිෂ්ණා, ලක්ෂ්මී වගේ දේව ප්‍රතිමා කළු පැහයෙන් අඹලා කළු වර්ණයට තැනක් දෙන්න ඔවුන් උත්සාහ කරනවා.

**"හැම දෙවියෙක්ම සුදු නෑ, කළු දෙව්වරුත් ඉන්නවා"** කියලයි ඔවුන් කියන්නේ. ඉතින් කට්ට කළු සමක් තිබුණත් ඒ ගැන ආඩම්බර වෙන්න. කළු පාට සම නිසාම ලෝකය ජයගත්තු කාන්තාවෝ කොච්චර නම් ඉන්නවද?

ඉක්මන් කොටයිලුනේ. ඒ නිසා ඉක්මනට සුදුවෙන්න බලන්නේ නැතිව සමට හිතකර සත්කාර කරලා සම නිරෝගී කරගන්න බලන්න.

**හිරුඑළියෙන් සම ආරක්ෂා කරන්න මෙලිනින් නැති නිසා සමේ පිළිකා ඇතිවෙන්න පුළුවන්**



හැමදාම වතුර ලීටර් දෙකක්වත් බොන්න. සම පැහැපත් කරන විටමින් අඩංගු නිවිති, සාරණ, මුහුදු මාළු, රතු කැකුළු, ධාන්‍ය වර්ග, ඇට වර්ග, වෙරළු, මුකුණුවැන්න වගේ දේවල් වැඩිපුර කන්න.

මේ වෙනකොටත් බ්ලීච්ංවලින් හානිවුණු සමක් තියෙන කෙනෙක්ට ඒ හානිය අවම කරගන්න උදව් වෙන සත්කාර ටිකකුත් දැන් බලමු.

මේකට හොඳම දේ තමයි කෝමාරිකා. දවසට දෙපාරක්වත් සමේ කෝමාරිකා ගාන්න. ඒ වගේම වද කහ පොල් වතුරින් අඹරා ආලේප කරන එකත් හොඳයි.

කොහොඹ කොළ හොඳින් අඹරලා සමේ ආලේප කරන්න.

ඊට අමතරව සුපිරිසිදු පොල්තෙල් නැතිනම් ඔලිව් තෙල් ආලේප කරන්නත් පුළුවන්. නැවුම් කිරි, පොල් වතුර වගේ දේවල්වලින් නිතරම මුහුණ සෝදන්න.

සුදු හඳුන්, කහ සහ යෝගට් එකට මිශ්‍ර කරලා මුහුණේ ආලේප කරන එකත් හොඳ සත්කාරයක්. විරංජන නිෂ්පාදන නැත්නම් බ්ලීච්ං නිෂ්පාදන වෙනුවට සමේ තෙතමනය රකින ප්‍රමිතිගත නිෂ්පාදන භාවිතා කරන්න.

සමට හානියක් වෙලා නැති කෙනෙක්ට වුණත් සම නිරෝගී කරගන්න මේ දේවල් භාවිතා කරන්න පුළුවන්.

ඊටපස්සේ ලස්සන නිරෝගී සමක් ලැබුණාම ඕනම කෙනෙක් ළඟට ගිහින් 'ඔබ සොයනා කළු කෙල්ල මමයි' කියන්නත් බය වෙන්න ඕනේ නැහැ.



ප්‍රවීණ රූපලාවන්‍ය උපදේශක
මාලිංග ප්‍රනාන්දු
(Personal Grooming
fernando.malinga



# කොල්ලෙක් දිහා ඇහැක් ඇරලා බලන්නෙ නැතුව කසාද හරියන්න දෙයියන්ට භාරවෙලා වැඩක් තියෙනවද?

2022 අවුරුද්දෙනුත් මාසයක්ම ගෙවිලා. අවුරුද්ද පටන් ගනිද්දි ගොඩක් අයගෙ හිත්වල තිබුණු මොරාල් එක දැන් එන්න එන්නම අඩු වේගෙන යනවා. අවුරුද්ද පටන් ගන්න කලින් හදාගත්ත ඉලක්ක මේ වෙද්දි එකින් එක හිතින් අතහැරලා දාන තත්ත්වයට මිනිස්සු පත්වෙලා.

ඒ නිසා මිනිස්සු ඇත්තටම දේවල් සැලසුම් කළාට ඒවා යථාර්තයක් බවට පත් කරගන්න නොහැකි වන හේතු තුනක් ගැන අපි අද කතා කරමු. කෙනෙක් ජිම් එකට යන්න සෑහෙන්න සැලසුම් කළත්, **"අද නම් gym එකට යනවමයි"** කියල කොච්චර හිතුවත් ජිම් එකට යැවෙන්නේම නැති වෙන්න පුළුවන්. බිස්නස් එකක් පටන් ගන්න කොච්චර හීන දැක්කත් සමහරු ඒ සඳහා උවමනා කිසිම දෙයක් නොකරනවා වෙන්න පුළුවන්.

මිනිස්සු හිතන කියන දේවල් කරන්න බැරිවීමට එක ප්‍රධාන හේතුවක් තමයි, **"මට මේක කරන්න බැහැ! මම ඒකට දක්ෂ නැහැ!"** කියලා යටි හිතින් නිතර නිතර සිතීම. ඔවුන්ට තමන් ගැන තියෙන විශ්වාසය සෑහෙන්න අඩු වීම තමයි මෙලෙස සිතීමට ප්‍රධාන හේතුවක් වෙන්නේ. මීට පෙර අවස්ථාවකදී උත්සාහ කරලා අසාර්ථක වීම නිසා නැවතත් පරාද වීමට ඇති බියත් මේකට හේතුවක් වෙන්න පුළුවන්.

එක උදාහරණයක් මම කියන්නම්. මම හඳුනන එක්තරා අවිවාහක කාන්තාවකට එයා වැඩ කරන ස්ථානයේම, වසර දහයක් පමණ වැඩිමල් විවාහක පිරිමි පුද්ගලයෙකු සමඟ සම්බන්ධතාවයක් තිබුණා. මේ සම්බන්ධතාවය නිසා ඇය සෑහෙන්න ආතතියට පත්වෙලයි හිටියේ.

තමන් කරන්නේ පවක් බව පවසමින් නිරන්තරයෙන්ම ඇගේ යටි හිත කෑ ගහන්න පටන් ගත්තා. ඒ වගේම තවත් පවුලක් කැඩීමට තමන් දායක වනවා කියන හැඟීම නිසා ඇයට ඇය ගැනම පිළිකුල්භාවයක් දැනුණා. මේ හේතු නිසා ඇයට මෙම සම්බන්ධතාවය නැවතීමට දැඩි උවමනාවක් තිබුණත් එය නවත්වා ගන්න බැරිව ඇය හිරවෙලා හිටියා. මේ සම්බන්ධතාවය බිඳී ගියොත් ඇගේ ප්‍රේමවන්තයා එම කාර්යාලයේම වෙනත් කාන්තාවක් සමඟ සම්බන්ධතාවක් පටන් ගනීවි සහ එය දරා ගැනීමට නොහැකිවේවි යන බියෙන් මෙම තරුණිය ගිලී ඇති බව කතා කරද්දි මට වැටහුණා. එලෙසම ඔහු නැති වුණාහොත් කාර්යාලයේ වැඩ තනියෙන් කිරීමට සිදුවේදෝ යන අවිස්වාසයත් ඇය තුළ දිනපතා වර්ධනය වුණා. මෙම අනියම් සම්බන්ධතාවයෙන් ඉවත් වීමට ඇයට කෙතරම් උවමනා වුණත් පෙරකී බිය සහ අවිශ්වාසය නිසා ඒ තුළ තුළ සිරවී ආතතියට පත්වෙමින් බොහෝ කාලයක් සිටින්නට ඇයට සිදුවුණා. මේ විදියට ඔබත් යම්කිසි තීරණයක් ක්‍රියාත්මක කිරීමට බැරිව ලතවෙන කෙනෙක්නම් ඔබට ඔබ ගැනම ඇති අවිශ්වාසය සහ බිය මේ සඳහා හේතු වෙන්න පුළුවන්.

දෙවෙනි කාරණය තමයි **"මම වගේ මිනිසුන් එවැනි දේවල් කරන්න නුසුදුසුයි"** කියලා සිතින් විවිධාකාර වූ රාමු හදාගෙන සිටීම. මට එක්තරා දවසක හමුවුණා හරිම දක්ෂ වෛද්‍යවරියක්. හැබැයි ඇය පොඩ්ඩක්වත් සතුටින් නෙමෙයි ජීවත් වුණේ. වැඩේ කියන්න එයාට කිසිම අඩුපාඩුවක් තිබුණෙත් නැහැ. ඉතින් කතාබහ කරන්න කරද්දී තේරුණා ඇය ඉතාමත් දක්ෂ වෛද්‍යවරියක් වුණත් හිත යටින් ආස කරන්නේ විවිධාකාර වූ මෝස්තරවලට ඇඳුම් මැසීමට බව. නමුත් ඇය තරයේ පවසා සිටියේ වෛද්‍ය වෘත්තිය වැනි ඉහළ පෙලේ රැකියාවක් කරන තමාට ඇඳුම් මැසීම කිසිසේත්ම නොගැළපෙන බවයි.

**හීන දකිනවා වගේම ඒ හීන වෙනුවෙන් වැඩ කරන්න. පොඩ්ඩක් ඉවසන්නත් ඕන**

ඔබ සිදුකරන දෙයින් ඔබට හානියක් නොවන්නේ නම්, සමාජයට හෝ රටට හානියක් නොවන්නේ නම් එය නොකර සිටීමේ තේරුම කුමක්ද? ලංකාව වැනි ආසියාතික රටවල්වල බහුතරයක් මිනිස්සු ජීවත් වෙන්නේ තමන්ට උවමනා විදිහට නොවෙයි අනිත් අයට ඕන විදියට. ඒ අතරිනුත් කාන්තාවන් ඒ ගැන සෑහෙන්න සැළකිලිමත් වෙනවා.

අන්තිම කාරණය තමයි තමන්ගේ හැසිරීම් ගැන පොඩ්ඩක්වත් සැළකිලිමත් නොවී ඉලක්ක ගැන විතරක්ම සිතීම. අර කතාවටත් කියනවනේ ඕනෑවට වඩා හීන ගැන හිතන්න ගියොතින් කවදාවත් ඒවා සැබෑ කරගන්න වෙන්නේ නැහැ කියලා.

නිකමට හිතන්න තරුණියකට ඕන වෙනවා හොඳ ගුණ යහපත් තරුණයෙක්ව කසාද බඳින්න. ඉතින් ඇය හැමදාම උදේ ඉඳන් රෑ වෙනකම් කරන්නේ හීන මවමින් ඒවා තුළ ජීවත්වීම විතරමයි. ඇය කොච්චර හිතින් හිතුවත් හොඳ තරුණයෙක් ඕන කියලා, දෙවියන්ට භාර වුණත්, විශ්වයෙන් ඉල්ලුවත්, කොල්ලෙක් දිහා ඇහැක් ඇරලවත් බලන්නෙ නැත්නම් හොඳ තරුණයෙක් හම්බවෙයිද? මංගල සේවයන් හරහා සොයා බැලීම, හිතගිය තරුණයන්ව ඇසුරු කර බැලීම, මංගල යෝජනා පිළිබඳව සැළකිලිමත් වීම වැනි කාර්යයන් සිදු නොකරන තාක් ඇයගේ බලාපොරොත්තුවලට හරියන තරුණයෙක්ව හම්බවෙන්නෙ නෑ.

ඔබත් මිලියන ගණන් හම්බ කරන්න, අධි සුඛෝපභෝගී වාහන පදින්න, තමන්ගේම කියලා ව්‍යාපාරයක් ආරම්භ කරන්න සෑහෙන්න විදිහට හීන දකිනවා ඇති. හැබැයි ඒ හීන හැබෑ කරගන්න මහන්සි වෙන්නේ නැත්නම් ඒ හීන කවදාවත් සැබෑ නොවී හීන විදිහටම මැරිල යාවි. අන්න එදාට **"මේ ජීවිතය හරි අසාධාරණයි!"**, **"අපිට ඉතින් වාසනාව නෑනේ!"** වගේ හිත රවට්ට ගන්න කතාවන් කියන්න ලෑස්ති වෙන්න එපා.

මේ කියන හේතු තුනෙන් මිදිලා හෙමින් සීරුවේ ඔයාගේ සිහින වෙනුවෙන් වැඩ කරන්න පටන් ගන්න. අද හෙටම සාර්ථකත්වයක් පෙනෙන එකක් නැහැ. පොඩ්ඩක් ඉවසන්න! හරියට ජිම් යනවා වගේ. ඔයා දවසක් ජිම් ගිහින් ඇවිල්ල බලන්න! ඇඟේ කිසිම වෙනසක් පේන එකක් නැහැ! දවස් දෙක, තුන, හතර, පහ එක දිගට ගියත් ඔයාට කිසිම වෙනසක් පේන එකක් නෑ! හැබැයි ඔන්න මාස දෙකක් විතර යනකොට පැහැදිලි වෙනසක් පේන්න පටන් ගන්නවා. කිසිඳු වෙනසක් නොපෙනෙන කාලයේ වුණත් ඔයාට නොදැනෙන්න දේවල් වෙනස් වෙමින් තමයි තිබුණේ.

ඉතින් වෙනසක් නොපෙනුණත්, මේ හේතු තුන ගැන සැළකිලිමත් වෙමින් දිගටම මහන්සි වෙන්න. ඉක්මනටම ඔයාට ප්‍රතිඵල ලැබේවි.



හසින්ත හේවාවසම්

# බෝඩ් එකේ දලා තියෙන විදියට තමයි නංගි ආසෙ!






''දැන් නම් පඩියෙන් ජීවත්වෙන්න බෑ හලෝ! මං හිතුවා පාට් ටයිම් පොඩි බිස්නස් එකක් කරන්න.'' පිංකි පැවසුවේ කොණ්ඩ කිරිල්ලිට.

**''මොකක්ද කරන්න යන්නේ?''** කොණ්ඩි විමසුවේ ඊර්සියාව සිනහවකින් හංගා ගනිමින්.

**''මම කොත්තු හදන්න එක්ස්පර්ට් නේ. හබීත් මගේ කොත්තු රසයි කියනවා. අපේ ගේ ඉස්සරහ මං හවසට කොත්තු කඩයක් දනවා. පළවෙනි දවසෙ මට පොඩි සපෝට් එකක් දෙන්න එනවා නේද?''**

**''මං ශුවර් එකටම එතන ඇති.''** කපටි බැල්මක් හෙළමින් කොණ්ඩි පැවසුවා.

කොහොමින් කොහොමහරි පිංකි නිවස ඉදිරිපිට කොත්තු කඩය දැම්මා. එදා ඇගේ හබී ඕටී නිසා හිටියෙ නෑ. කොණ්ඩි නම් සපෝට් එකට හිටියා.

මඳ වේලාවකින් එතැනට ආවා හැන්ඩ්සම් තරුණයෙක්.

**''දෙන්නකෝ චූටි නංගිලා මට ලාර්ජ් කොත්තු දෙකක්ම''** ඔහු පැවසුවේ මනමාල හිනාවක් පාමින්. පිංකි හනි හනික කොත්තු දෙකක් උණු උණුවේ ඔතා දුන්නා.

**''කෝ... අනිත් එකත් දෙන්නකෝ''** තරුණයා පැවසුවේ දෙනෙත් අඩවන් කරමින් ඉවසිල්ලක් නැතිව.

**''ඔය කොත්තු දෙකම දුන්නේ? දැන් ඉතින් යනවා, අපිට අනිත් වැඩ කරගන්න දීලා''** එන පොට හොඳ නැති බව වටහාගත් පිංකි පැවසුවේ මඳ කෝපයකින්.

**''බෝඩ් එකේ තියෙන විදියට දෙන්නම ඕනෑ. ඔන්න මං බලෙන් ගන්නවා! මං සල්ලි දුන්නනේ!''** ඔහු එකවර ඉදිරියට පැන දෙපාරක් පිංකිව කිස් කරගෙන, කරගෙන ගියා. කොණ්ඩිට මාර ජොලි.

**'චටා.....ස්!'** පිංකි ඔහුගේ කම්මුලට පහර දෙකක් ගැසුවේ සික්සර් ගහනවාටත් වඩා වේගයෙන්.

බියවූ තරුණයා කොත්තු දෙකත් දමලා ගහලා හයි ස්පීඩ් එකේ දිව්වා.

පිංකි දිවගොස් තම කොත්තු කඩයේ බෝඩ් එක දෙස බැලුවා.

**'ලාබෙට උණු උණු කොත්තු'** කියලා ලියන්න ඕන එකට එහි ලියැවිලා තිබුණේ **'ලාබෙට උණු උණු තොත්තු'** යනුවෙන්.

බෝඩ් එක හැදූ ශිල්පියාට 'කො' යන්න වැරදිලා!!!

**සංඛ සඳරුවන්**

දිරිය ධරණී
සතුටින් ජීවිතය දරන්නී
**අයදුම් පත්‍රය**

නම ---------------------------------------------

ලිපිනය ---------------------------------------------

දිස්ත්‍රික්කය ---------------------------------------------

දුරකතන අංකය ---------------------------------------------

විද්‍යුත් තැපැල ---------------------------------------------

ජාතික හැඳුනුම්පත් අංකය ---------------------------------------------

උපන්දිනය ---------------------------------------------

රැකියාව ---------------------------------------------



සතුටින් ජීවිතය දරන්නට ඔබට මඟ කියන 'ධරණී' පුවත්පත මගින් මෙහෙයවන 'දිරිය ධරණී' වැඩසටහන් මාලාව හා සම්බන්ධ වීමට මෙහි දැක්වෙන අයදුම් පත්‍රය පුරවා



'දිරිය ධරණී',
කර්තෘ,
ධරණී පුවත්පත,
නො.91,
විජේරාම මාවත,
කොළඹ 07.

යන ලිපිනයට එවන්න.

077 16 36 807

නැතිනම් ඉහත අංකයට වට්ස්ඇප් කරන්න.

ආයෝජන/ හවුල්/ සංචාරක/ රැකියා පුහුණු අවස්ථා

කැනඩාව, සිංගප්පූරුව, මැලේසියාව, ජපානය හා යුරෝපයේ රටවල ආරම්භ කිරීමට නියමිත ANS CARE HOMES සඳහා ඉහත අවස්ථා ඇත.

හෙද නිලධාරී පුහුණුවීම් සඳහා සිසුන් බඳවා ගැනේ.

විදේශ භාෂා සමඟ වෘත්තීය පුහුණුව තුළින් ලෝකය ජයගන්න.

භාෂා කේන්ද්‍රය - ජපන් භාෂාව, චීන භාෂාව, ඉංග්‍රීසි භාෂාව (IELTS සඳහා විශේෂයි) ජර්මන්, ප්‍රංශ හා ඉතාලි

තාක්ෂණ අංශය - මෝටර් මොබයිල් අංශය Auto A/C & Electrical, ටින්කරින් & Painting, පෑස්සුම්කරණය (Welding) සිවිල් ගොඩනැගිලි (Civil Construction), Telecommunication Technician, ඇලුමිනියම් ෆැබ්රිකේෂන්

සෞඛ්‍ය අංශය - හෙද නිලධාරී පුහුණුවීම් සඳහා සිසුන් බඳවා ගැනේ. Care Given, Hair Cutting & Beauty Salon

ශාඛා මධ්‍යම පළාත - එම්.පී. සමරසිංහ - 15/3, ගුහාගොඩ පාර, කටුගස්තොට - 0718 774 630, 0776 407 889

ශාඛා ගාල්ල - තිලක් ජයවර්ධන - 566, හිරිඹුර පාර, කරාපිටිය, ගාල්ල - 0779 321 370, 0713 776 158, 0727 280 148

ලියාපදිංචිය සඳහා අමතන්න 0775 714 718

ANS Technical College (Pvt) Ltd
16/36, Pio Mw, Circular Road, Kandana.
0775 714 718



# දූලා දෙන්නා මට දීලා එයා සුරලෝකෙ ගියා

## මව මියගිය නිවුන් බිළිඳියන් රැකබලාගන්න තාත්තාගේ ආදරය



තම පවුලට දරු සිඟිත්තෙකු එක්වන්නට යන බව දැනගත් මොහොතේ නිරෝෂා නිල්මිණී කුමාරිගේ (32) දෙනෙත් දීප්තියෙන් දිලිසුණි. ඇගේ සැමියා වූ සුමිත් කුමාර (34) සිටියේද එවැනිම සතුටකින්ය. දූ සිඟිත්තයක ලැබුණොත් ලස්සන ඇඳුම් පොඩි ඇන්දවා හැඩ බලන විදිය ගැන නිරෝෂා නිතර සිහින දැක්කාය. ඒ දූ දරුවන්ගේ ලෝකය පාට කරන විදි ගැන සුමිත්ද කල්පනා කළ වාර අනන්තය. එසේ දින සති ගෙවී යද්දී මව් සායනයට ගිය නිරෝෂා අවශ්‍ය පරීක්ෂණවලටද යොමු විය. ඇයගේ කුසෙහි එක් දරුවෙක් නොව දෙදෙනෙකුම ඉන්නා වග දැනගනිද්දී ඒ දෙඇසට කඳුළු එක්වුණේ වෙනකක් නිසා නොව සතුට වැඩිකමටය.

**"අපි දෙන්නා විවාහ වුණේ ආදර සම්බන්ධයකින්. එයා රිදීගම ප්‍රදේශයේ කෙනෙක්. විවාහයෙන් පස්සේ, මාතලේ ආදුවල (මඩවල උල්පත) මගේ ගමේ තමයි අපි ජීවත්වුණේ.**

**කටුමැටි ගහපු පුංචි ගෙපැල වුණත් එදිනෙදා කුලියක් කරගෙන අපි හරිම සතුටින් ජීවත්වුණා. අපිට දරුවෝ ලැබෙන්න යනවා කියලා දැනගත්තම සතුටක් වගේම අනාගතය ගැන වගකීමක් හිතට ආවා. එයත් පරිස්සම් කරගෙන දරුවොත් පරිස්සමෙන් ගෙදරට ගේන එක තමයි මගේ හීනය වුණේ. නිරෝෂාත් දරුවෝ දෙන්නත් එක්ක ගෙවන ජීවිතේ ගැන ගොඩක් බලාපොරොත්තු තියාගෙන හිටියේ.**

**අපිට දුෂ්කරතා අගහිඟකම් නොතිබුණා නෙවෙයි. ඒත් ඒවා ගැන ලොකුවට හිතන්න ගියේ නැහැ. එයා දරුවෝ වෙනුවෙන් පොඩි ඇඳුම් මහලා හැඩ බැලුවා. ඒ දිහා එයා ආසාවෙන් බලා ඉන්න අවස්ථා තිබුණා."**

හැම අම්මා කෙනෙකු තාත්තා කෙනෙකුගේම හිතේ ඇඳෙන දරු සිහින ඒ තරම් ලස්සනය. නිරෝෂාත් සුමිතුත් සිටියේ ඒ ලස්සන බලාපොරොත්තුව ඉටුවන තුරුය.

**"එයාට දරුවෝ ලැබෙන්න දින ළංවුණාම මාතලේ මහරෝහලට ඇතුළත් කළා. අපට දෙසැම්බර් මාසේ දසය වැනිදා තමයි දුවලා දෙන්නා උපන්නේ. ඒ සිසේරියන් සැත්කමකින්. එයින් දින හතරකට පස්සේ අම්මවයි බබාලා දෙන්නවයි ගෙදර එක්කන් ආවා. එයාලා හොඳින් කියලා තමයි වෛද්‍යවරු කිව්වේ."**

**දරුවන්ව ලොකු මහත් කරගන්න ඕන කිරිපිටි දීලයි. මුලදි ගමේ අය තමයි කිරිපිටි අරන් දුන්නේ**

සුමිත් බිරිඳත් දරු දෙදෙනාත් නිවසට රැගෙන ආවේ දෙසැම්බර් දහනව වනදායි.

සුමිත් හා ඔහුගේ ඥාතීන් නිරෝෂාට කළ යුතු සත්කාර කළේ ඇය සැත්කමකටද මුහුණ දී සිටි නිසාය. පුංචි පුංචි අපහසුකම් තිබුණත් නිරෝෂා දෙදරුවන්ට කිරි බිඳක් පෙව්වේ මහත් සෙනෙහසිනි. තම පුංචි සුරංගනාවියන් දෙදෙනා කිරි බී සුවසේ නිදියද්දී ලෝකයක් හිමිවූවා සේ සතුටක් ඒ දෙනෙත් තුළ තිබිණි.

එහෙත් එසේ ගෙවුණේ දින තුනකි. ලොකු අසනීපයක් නොපෙන්වූ නිරෝෂා පසුදා මධ්‍යම රාත්‍රිය වනවිට යම් අපහසුවකින් පෙලුණාය.

**"ඒ අමාරුකම් වැඩිවෙද්දි රෑම ගිලන් රථයකින් අපි එයාව මාතලේ මහරෝහලට අරගෙන ගියා. දවස් දහතරක් එයා රෝහල් දැඩිසත්කාර ඒකකයේ ප්‍රතිකාර ලැබුවා. එයාට ෆිට් එක හැදුනා වගේ දෙයක් වුණේ. කොහොමහරි ඒ දවස් ටිකේ එයා ඇහැක්වත් ඇරලා බැලුවේ නැහැ. ජනවාරි 14 වෙනිදා එයා සදටහම අපි තුන්දෙනාව තනිකරලා ගියා. ඒ වෙද්දි බබාලා දෙන්නා ඉපදිලා මාසයක්වත් නෑ."**

සුමිත් කුමාරගේ හඬ වේදනාවෙන් බිඳී ගියත් ඔහුට දැන් අතහරින්නට බැරි අපේක්ෂා ගොන්නක් තිබේ.

ඒ තමාට නිරෝෂා ඉතිරිකර ගිය ලස්සන මල් කැකුළු දෙකට අනාගතයක් හදන එකය. කුලී වැඩ කිරීමට දැන් නොහැක්කේ පුංචි පැංචියන් දෙදෙනා රැකබලා ගැනීමේ වගකීම ඔහු මත පැවරී ඇති නිසාය.

බිරිඳට සිදුවූ දේ කුමක්දැයි කියන්නට ඔහු නොදනිතත් ඇයගේ සිරුරු කොටස් මේ වනවිට පරීක්ෂණ සඳහා යොමුකර ඇති බව පමණක් ඔහු දන්නේය.

**"මගේ අසනීපයෙන් ඉන්න අම්මත්, මගේ සහෝදරයන්ගේ බිරින්දෑවරු දෙන්නත් තමයි දැනට මගේ පුංචි දුවලා දෙන්නා බලාගන්න උදව් කරන්නේ. දරුවන්ට දවසකට කිරිපිටි පැකට් එකහමාරක් විතර යනවා. මුලදි ගමේ කවුරුහරි ගෙනැත්දෙන කිරිපිටි පැකට් එකකින් තමයි දරු දෙන්නා පෝෂණය කළේ. මේ ගැන මාධ්‍යයේ ගියාට පස්සේ අපට විවිධ උපකාර ලැබෙමින් තියෙනවා."**

**මාධ්‍යයේ මේ කතාව ගියාට පස්සේ විවිධ උදව් ලැබුණා**

සුමිත් කුමාරට දැන් දූ සිඟිත්තියන්ගේ කටයුතුද තරමක් හුරුය. ඔහු ඒවා කරන්නේ අම්මා නැති දියණියන්ට බිඳකින් හෝ ඒ අඩුව නොදැනෙන්ටයි.

දරුවන්ගේ රෙදි සේදීම, ඔවුන් පිරිසිදු කිරීම, ඔවුන්ට කිරි සැකසීම වාගේම ගෙදරදොරේ කටයුතුද දැන් ඔහුට නුහුරු නැත. නිරෝෂා සිටියදී අනාගතය ගැනත් දරු පැටුවන් ගැනත් සිහින දුටුවේ දෙදෙනා එක්ව නමුදු, ඈ නැති ලොව දැන් ඔහු තනිව ඒ සිහින සම්පූර්ණ කළ යුතුය.

පුංචි පැංචියන් දෙදෙනා ලොකු මහත්කොට ඔවුන්ගේ ලෝකය ලස්සන කිරීමේ වගකීම තම හිස මත පැටවුණත් ඔහු පියෙක් ලෙස යුතුකම් ඉටු කරන්නේ කැපවීමෙන් වාගේම කැමැත්තෙනි.

**"දරුවෝ දෙන්නට බඩගිනි වෙන්නේ එකට. එතකොට එයාලා එකටම වගේ අඬනවා. අම්මගේ උණුසුමේ අඩුව සම්පූර්ණයෙන්ම මට පුරවන්න බැරි වුණත් මට එයාලව ඒ අඩුව නොදැනෙන්න රැකබලා ගන්න පුළුවන්.**

**ඇත්තටම මට ඒකට හැමෝගෙන්ම ලැබෙන සහයෝගය ගොඩක් වටිනවා. දරුවෝ ටිකක් ලොකු වෙනතුරු මට මගේ පුරුදු රස්සාවට යන්න වෙන්නේ නැහැ."**

සුමිත් කුමාරට ඇත්තේ ලොකු වගකීමකි. නෑනලා දෙපළටද කුඩා දරුවන් සිටින බැවින් තම දෙදරුවන් රැකබලාගැනීම ඔවුනට දිගටම කළ නොහැක්කකි.

කෙසේ හෝ සුමිත්ට ඕනෑද තම දෙදරුවන් දෑස මෙන් තමන්ම රැකබලාගන්නටය. කිරිපිටි පැකට් එකකින් හෝ ඒ වෙනුවෙන් උදව් කිරීමට කැමති කාරුණික හදවත්වලට සුමිත් ඇරයුම් කරන්නේ ඒ නිසාවෙනි.

සුමිත්ගේ සිහිනය ඉටුවනදා පුංචි පැංචියන් දෙදෙනාගේ ලෝකය නිරෝෂා සිතූ ලෙසම ලස්සන වනු ඇත.

**දීපා වසන්ති එදිරිසිංහ**

GYMIN

EST 1835 GS &Co BELIEVE



# කාන්තා ඔබේ සුවතාවය වෙනුවෙන්

# GS SPORTS

By George Steuart Health (Pvt) Ltd.

ඔබේ ශරීර සුවතාව වැඩිදියුණු කිරීමට සහ සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් පවත්වා ගැනීම සඳහා නිසි ප්‍රමිතීන්ට අනුකූලව සකස් කරන ලද ව්‍යායාම් උපකරණ රැසක් ඔබ වෙත ගෙන එයි.

Stretch It ඉලාස්ටික් සහ ලූප් බෑන්ඩ්, සිරුර හැඩ ගැන්වීමට සහ ශක්තිමත් කිරීම සඳහා වඩාත් යෝග්‍ය තේරීමකි; සිරුරේ නිරෝගි බව වර්ධනයට උපකාරී වන විවිධ ශක්ති පරාසයන්ගෙන් ලබා ගත හැකිය.


3 Fold Exercise Mat
Rs. 6,900


AB Roller DIA
(63 MM/120 MM)
Rs. 1,500


Blanced Wodden Board
Rs. 6,900


Electronic Body Weight Scale
Rs. 5,730


Foam Roller
(33" 14 CM/30" 15 CM)
Rs. 2,800


Gym Balls
Rs. 1,950 - 3,500


Vinyl Dumbbell
Rs. 660 - 3,300


Kettle Ball
Rs. 1,260 - 20,160



Medicine Ball - Rubber
Rs. 3,500 - 10,900


Smart Jump Rope
Rs. 8,000


TRX
Rs. 9,500


Yoga Mat with Bag
Rs. 2,900 - 4,000

ශාඛාවන්:

කොළඹ 03 - අංක: 445 A, ගාලු පාර, කොළඹ 03. දුරකථන: 0112 582 532

මාදිවෙල - අංක: 332 A සහ 332 A 1/1, තලවතුගොඩ පාර, කෝට්ටේ. දුරකථන: 0112 865 320

මීගමුව - අංක: 165, හලාවත - කොළඹ ප්‍රධාන මාර්ගය, පෙරියමුල්ල, මීගමුව. දුරකථන: 07178 110 868

Visit us online www.gssports.lk

ක්ෂණික ඇමතුම්: 0775 551 000 | 0772 227 444 www.gssports.lk

# උදේට ලෙඩ බලා හවසට ලූණු බලන දොස්තර නෝනා

## වෛද්‍ය නයන්තරා ජයමිණී සිරිවර්ධන






පුංචි සන්ධියේ පටන්ම නයන්තරාගේ හිත තිබුණේ සෙල්ලමටය. පාසලේ පන්ති කාමරය තුළදිත් වදෙන් පොරෙන් පොතපතේ වැඩ ටික ඉවරකර දමන ඈ කොයිවෙලෙත් ඇඟිලි ගැන්නේ සෙල්ලම් කිරීමට ඉස්පාසුවක් ලැබෙනතෙක්ය. නාහෙට නාහන හිතුවක්කාර ගතිද මේ පුංචි කෙල්ල කෙරේ නොතිබුණාම නොවේ. ලොකු වුණාම කවුරුන්වීමට කැමතිදැයි පන්තිභාර ගුරුතුමිය අසද්දී ගිරවුන් සේ පිළිතුරු දෙන පන්තියේ අනෙක් ළමුන් අභියස ඇය බොහෝ විට කළේ මුනිවත රැකීමයි. ඒ එවැනි පැහැදිලි සිහිනයක් ඇයට නොතිබුණු නිසාය.

නයන්තාරාට අනාගතය පිළිබඳ සිහින නැතත් ඈ පිළිබඳ ලොකුවට සිහින මැව් කෙනෙක් සිටියේය. ඒ ඇගේ අප්පච්චීය. පුංචි දෝණි හැඩ වැඩ දැමූ සාරියක් ඇඳ දෙස්තර නලාවක් අතේ තියාගෙන ලෙඩ්ඩු බලන හැටි ඔහු හීනෙනුත් දැක්කේය. සෙල්ලමට බරවූ නයන්තරාගේ ගතිසොබා මෙල්ල වෙන්නට පටන්ගත්තේ ඒ හීන නිසාය.

**"මං කවදාවත් වෛද්‍යවරියක් වෙන්න හිතපු කෙනෙක් නෙවෙයි. ඒත් අප්පච්චි එහෙම හීනයක් දකිනකොට මට ඒක හැබෑ නොකර ඉන්න බැරි වුණා. අන්තිමේ මං හිතාගත්තා හොඳට ඉගෙනගෙන වෛද්‍යවරියක් වෙනවා කියලා. එහෙම හිතලා එදා ඉඳන් හොඳට මහන්සිවෙලා වැඩ කළා. මට සාමාන්‍ය පෙළ ලියන්න තිබුණේ 2005 අවුරුද්දේ. ඒ වෙනකොට මට මං ගැනම ලොකු විශ්වාසයක් තිබුණා. කොහොම හරි A හතයි B එකයි එක්ක මං පාස්වුණා. ඊටපස්සේ වෛද්‍යවරියක් වෙන්න හිතාගෙන උසස් පෙළ කළේ විද්‍යා විෂය ධාරාවෙන්. 2008 අවුරුද්දේ තමයි මට විභාගය ලියන්න තිබුණේ. මං C තුනක් එක්ක උසස් පෙළත් පාස්වුණා."**

ඉන්පසු අප්පච්චිගේ එකම සිහිනය සැබෑ කිරීමට ඇය 2010 වසරේ විදෙස්ගත වෙන්නීය. අවුරුදු හයක් පුරාවට නොදන්නා රටක නොදන්නා ඉසව්වකට වී ඒ හීනය වෙනුවෙන් ඇය තනියම වෙහෙසෙන්නීය. 2016 අවුරුද්දේ ඇය නැවතත් ලංකාවට එන්නේ වෛද්‍යවරියක් වෙමින් අප්පච්චිගේ එකම හීනය සැබෑ කරමිනි.

**"මං වෛද්‍ය සිහිනය වෙනුවෙන් අවුරුදු ගාණක්ම හිටියේ ජෝර්ජියාවේ. ඒ කාලේ අප්පච්චිලා තමයි මගේ හැම වියදමක්ම බැලුවේ. මගේ බැච් එකේ ලංකාවේ ළමයි 32 ක් හිටපු නිසා ලොකු පාලුවක් දැනුණේ නෑ. දැන් මම කොළඹ ප්‍රසිද්ධ පෞද්ගලික රෝහලක වෛද්‍යවරියක් විදිහට සේවය කරනවා."**

2017 අවුරුද්දේ ඇය විවාහ වුණේ ලංකාවේ අංක එකේ තරු පන්තියේ හෝටලයක සූපවේදියෙකු වන කසුන් සමඟය. ඔවුන්ගේ තනිය මකන්නට ටික දෙහකින් පුංචි පැටව් දෙන්නෙකුත් ඒ කැදැල්ලට එකතුවිය. හැමදේම හොඳට සිද්ධ වුණත් කසුන්ගේ වෘත්තියට නම් උදාවෙමින් තිබුණේ නරකම සමයකි. ඒ පාස්කු ප්‍රහාරය සහ ඉන්පසුව ආ කොවිඩ් වසංගතය නිසාය. කාටත් වැඩිය කසුන්ගේ සාක්කුවට එය දැනෙන්නට පටන්ගනිද්දී තමන් දන්න කියන ශිල්පය භාවිතා කර අතිරේක රැකියාවක නිරතවීමට ඔහු තීරණය කළේය.

**"මගේ සැමියා හොටෙල් එකේ රැකියාව කරන ගමන් අතිරේක ආදායමක් ලබන්න පුළුවන් විදිහක අලුත් වැඩක් පටන් ගත්තා. ඒක කෑම ලොරියක්. අපි කෑම ලොරියේ වැඩ පටන් අරන් දැන් මාස කීපයයි. ෆ්‍රයිඩ් රයිස්, කොත්තු, බර්ගර් සහ සැන්ඩ්විච් වගේ දේවල් හදන්නේ. එළිමහන් උත්සව තමයි ගොඩාක් ටාගට් කරන්නේ. එහෙම නැත්නම් සුපර්මාර්කට් එකක් වගේ තැනකට ගිහින් ලොරියේ බිස්නස් කරනවා."**

කසුන් කෑම ලොරියේ වැඩ කරනවිට ඔහුගේ අත් උදව්වට ගියේ දෙස්තර නෝනාය. උදේවරුවම රෝහලේ සේවය කරන ඈ



**ලොරියක බිස්නස් එකක් කරන්න වෛද්‍යවරියක් වීම බාධාවක් නෙවෙයි**

කසුන්ගේ සහයට හවස් යාමයට ලොරියට නැග්ගාය. ඇගේ එකම අරමුණ වූයේ සැමියාට උදව් කිරීමය.

**"මං වෛද්‍යවරියගේ භූමිකාව රඟපාන්නේ රෝහලේදී විතරයි. රෝහල් ගේට්ටුවෙන් එළියට ආවට පස්සේ මං සාමාන්‍ය කාන්තාවක්. උදේ රෝහලේ වැඩ කරලා හවසට සැමියත් එක්ක ලොරියේ කෑම බිස්නස් කරනවා. හවස පහේ විතර ඉඳන් රෑ එකොළහ විතර වගේ වෙනකල් බිස්නස් තියෙනවා. සමහර වෙලාවට මගෙන් බෙහෙත් ගත්ත රෝගීන් එහෙමත් ලොරිය ළඟ මුණගැහෙනවා. ඒත් ඒක මට ප්‍රශ්නයක් නෙවෙයි. මං වෛද්‍යවරියක් හින්ද ලොරියක කෑම හදලා විකුණනවා දැක්කොත් හරි නෑ වගේ ප්‍රාථමික අදහස් මගේ නෑ."**

ඇය හිතත පතන විදිහ හරියටම හරිය. වෛද්‍යවරියක් තම සැමියාත් සමඟ එකතුවී ලොරියක කෑම විකුණන එකේ කිසිම ඇදයක් පලුද්දක් අපටද පෙනෙන්නේ නැත. කෙසේ හෝ වේවා දැන් ඇය ඔහුත් සමඟ එකතුව හරි හරියට වැඩය. පිරිමින්ට ලැබිය යුත්තේද මෙවන් ගැහැනුය.

**"ලොරියේ හිටියට මං ලොකු ලොකු වැඩ කරන්නේ නෑ මොකද සැමියා ෂෙෆ් නිසා එයාට මට වඩා හොඳට කෑම හදන්න පුළුවන්. මං කරන්නේ හවසට ගිහින් එයාට උදව් කරන එක. එළවලු කපන වැඩ, ලූනු කපන වැඩ, තෙල් දාන වැඩ තමයි මං කරන්නේ. සැමියගේ බලාපොරොත්තුවක් තියෙනවා තව ලොරි කීපයක් දාලා මේ වැඩේ තවත් හොඳට කරගෙන යන්න. මොකද අපිට දැනිලා තියෙන්නේ මේ වැඩේ අල්ලලා යයි කියලා. බිස්නසුත් වරදක් නෑ."**

ඇය නයන්තරා ජයමිණී සිරිවර්ධනය. මේ වනවිට කොළඹ ප්‍රධාන පෙළේ පුද්ගලික රෝහලක පිළිගත් වෛද්‍යවරියකි. ඔහු කසුන් ප්‍රසාද් රණසිංහය. කොළඹ ප්‍රධාන පෙළේ තරු පන්තියේ හෝටලයක සූපවේදියෙකි.

ඔවුන්ගේ පදිංචිය ගම්පහය. කියවන ඔබත් එහේ මෙහේ යද්දි ඔවුන්ගේ මේ රසම රස කෑම ලොරිය මුණගැසීමට ඉඩ ඇත. ටිකක් ඕනෑකමින් බැලුවොත් උදේට ලෙඩ බලලා හවසට ලූණු බලන මේ වෛද්‍යවරියත් ඒ ලොරියේම සිටිනු දැකගත හැක. කැමති නම් ඇගේ අතින්ම හදන සැන්ඩ්විච් එකක වුවද රස බැලිය හැකිය.

**රුවන් එස්.සෙනවිරත්න**



# සිංගප්පූරු යවන්නට කියා ගම්බද සිඟිති දියණියන්ගේ අඩනිරුවත් ඡායාරූප ගත් කොළඹ මහත්තයා

හේනක්, කුඹුරක් කොටාගෙන හෝ කුලියක්, මලියක් කරගෙන ජීවත්වෙන ගමේ අහිංසක අම්මා අප්පච්චිලාට කොළඹ කියන්නෙත් සිහින පුරයකි. එහෙව් එකේ සිංගප්පූරු සිහින ඔවුන්ට කොහොමත් දුර වැඩිය. ඒත් කොළඹින් පිටිසරට ගිය එක්තරා මහත්තයෙක් එවැනි සිංගප්පූරු සිහිනයක් මේ අහිංසකයන්ට හරි ලාබෙට වික්කේය. අත දිගහැර හරි හරියට වියපැහැදම් කළ ඔහු ඒ හිලව්වට ඉල්ලා සිටියේ ගෙවල්වල සිටින දූ සිඟිත්තියන්ගේ ඡායාරූප ලබාගැනීමේ අවසරය පමණි. ඒවා සිංගප්පූරුවේ පවතින ඡායාරූප ප්‍රදර්ශනයක් සඳහා බවත්, ජයග්‍රහණය කළහොත් දරුවන්ට සිංගප්පූරු යා හැකි බවත් ඔහු සපථ කළේය. දරුවන්ගේ වාසනාව යැයි සිතූ අහිංසක දෙමාපියෝ ඊට අවසර දුන්නේ සද්භාවයෙන් වුණත් කොළඹින් ආ මහත්තයා නොසන්ඩාලයෙකු බව ඔවුන් දැනසිටියේ නැත. දරුවන්ගේ ඡායාරූප ලබාගන්නා අවස්ථාවල දෙමාපියන්ට ඒ පැත්ත පළාතේ ඒම තහනම්ය. අම්මලා ඉන්න තැන ෆොටෝ ගහන විට දරුවන් 'Nervous' වන බවයි ඔහු පවසා තිබුණේ. Nervous යන වචනයේ දිගක් පළලක් නොදැන සිටියත් දරුවාට පෑදෙන්නට යන ඉල්ලමට එය බාධාවක් බව සිතූ උන්දැලා ෆොටෝ ගසා ඉවර වෙනතෙක් ආපහු නිකමටවත් ඒ පැත්ත පළාතේ ගියේ නැත. එනිසාම මහ ගෑනුන් සේ පෙනෙන පරිදි මේකප් දමා ඔහු අරගත් දරුවන්ගේ අඩනිරුවත් ඡායාරූප ගැන හාංකවිසියක්වත් මේ දෙමාපියෝ දැනසිටියේ නැත. ඉතින් එලෙස ලබාගත් අඩනිරුවත් ඡායාරූප පලකළ වෙබ් අඩවි ගැන දෙවියන් වැඩමකොට කීවොත් හැර ඔවුන් කෙසේනම් දැනගන්නද?

කොහොම නමුත් ඒ අතරතුර මේ ඡායාරූප ශිල්පියාගේ මගෝඩි වැඩ ගැන කොළඹ සිටි නෝනා මහත්වරුන් පිරිසක් ඇහැ ගහගෙන සිටියහ. ඔහු විසින් අවුරුදු 5-11 අතර වයසේ පසුවූ එකී දැරියන්ගේ අඩනිරුවත් ඡායාරූප පලකළ අසැබි වෙබ් අඩවි පිළිබඳව ඔවුන් සොයාගත්තේ ඉන් අනතුරුවය. ඒ අනුවයි ඔවුන් ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පැමිණිල්ලක් කර තිබුණේ. මේ වනවිට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මේ සිද්ධිය සම්බන්ධ විමර්ශනයක් ආරම්භ කොට ඇති නිසා ඒ පිලිබඳ වැඩියමක් දැනගැනීමට අප ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපති උදය කුමාර අමරසිංහ මහතාට කතා කෙරුවෙමු. ඉදිරි පරීක්ෂණ කටයුතුවලට බාධාවෙන නිසා ඔහුගේ නම සඳහන් කළ නොහැකි බව කී සභාපතිවරයා එම තැනැත්තා අවුරුදු 39ක නුගේගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු බව පමණක් කියා සිටියේය.

**"පහුගිය ජනවාරි 13 වෙනිදා ළමා ආරක්ෂක අධිකාරියේ 1929 ළමා උපකාරක සේවා අංකයට මේ ගැන සොයා බැලීමක් කරන්න කියලා ඇමතුම් රාශියක්ම ලැබුණා. එතැනින් පස්සේ වෙනත් මාර්ගවලිනුත් අපිට මේ ගැන පැමිණිලි ලැබෙන්න පටන්ගත්තා. ඒ හැම කෙනෙක්ම වගේ අපෙන් ඉල්ලීම් කරලා තිබුණේ මේ ගැන විධිමත් පරීක්ෂණයක් පවත්වලා අදාළ පුද්ගලයාට නීති මගින් කටයුතු කරන්න කියලා.මේ ගැන විමර්ශණ කටයුතු කරන අතරවාරෙදි ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සහකාර අධ්‍යක්ෂවරියක් වන චන්දිමා දුනුවිල මහත්මිය විසින් අදාළ පුද්ගලයාට ලිපියක් යොමු කරලා තිබුණා. ඔහුගේ වෙබ් පිටුව ගැන අපිට නොසෑහෙන්න පැමිණිලි ලැබිලා තියෙනවා කියලත්, එහි අසභ්‍ය දර්ශන ඇතුළත් ඡායාරූප පලවෙලා තිබුණොත් දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් කළ හැකි බවකුත් ඇය විසින් ඒ ලිපියේ සඳහන් කරලා තිබුණා."**

මීට සතියකට පෙරාතුව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන් විසින් එම ඡායාරූප ශිල්පියා කැඳවා මේ පිළිබඳව ප්‍රශ්න කළ බවත් ඔහු අපට කීවේය.

**"ඒ පුද්ගලයා කිව්වේ මේ දරුවෝ හැම කෙනෙක්ගෙම ඡායාරූප ගත්තේ දෙමව්පියන්ගේ කැමැත්ත ඇතුව කියලා. නමුත් ඒක සනාථ කරන්නට ඒ පුද්ගලයා සතුව කිසිඳු ලිඛිත ලියැවිල්ලක්වත්, දෙමාපියන්ගේ විස්තර ඇතුළත් ලැයිස්තුවක්වත් තිබුණේ නෑ."**

**ඇත්තටම ඒ ෆොටෝ දැක්කම මේ පුද්ගලයා ගැන මටත් විශාල සැකයක් මතුවුණා**

තවදුරටත් කළ ප්‍රශ්න කිරීම්වලදී අනාවරණය වී තිබුණේ එම පුද්ගලයා විසින් එක් දරුවෙකුගේ ඡායාරූප 800ක් 1000ක් අතර ප්‍රමාණයක් ලබාගෙන ඇති බවය. ළමා රක්ෂණ අධිකාරියේ නිලධාරීන්ට එවැනි ඡායාරූප විශාල ප්‍රමාණයක් හමුවූ බවත්, ඒ සියල්ලම වැඩිහිටි නිරූපණ ශිල්පිනියන්ගේ ආකාරයට අඩ නිරුවතින් ලබාගත් ඒවා බවත් සභාපතිවරයා අපට කීවේය.

**"ඇත්තටම ඒ ෆොටෝ දැක්කම මේ පුද්ගලයා ගැන මටත් විශාල සැකයක් මතුවුණා. ඒ වෙලාවෙදි අපිට ඔහුව රඳවාගෙන ප්‍රශ්න කරන්න අධිකරණ නියෝගයක් තිබුණෙ නෑ."**

නමුත් යම් පුද්ගලයෙකු සන්තකයේ හෝ කිසියම් තැනක දරුවන්ගේ අසභ්‍ය වීඩියෝපට සහ ඡායාරූප ඇති බවට සාධාරණ සැකයක් ඇත්නම් අධිකරණ නියෝගයක් නොමැතිව අදාළ පාර්ශවයන් රඳවාගෙන ප්‍රශ්න කිරීම සඳහා බලයලත් නිලධාරියෙකු පත්කිරීමට ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපතිවරයාට බලය ඇත. ඒ 1998 අංක 50 දරණ පනතේ 33 වැනි වගන්තියට ප්‍රකාරවය.

**"අධිකරණ සෝදිසි වරෙන්තු අරගෙන අත්අඩංගුවට ගන්න හිටියා නම් ඒ කාලය ඇතුළත මේ පුද්ගලයා විසින් සාක්ෂි මකලා දාන්න පුළුවන්කම තිබුණා. ඒනිසා මම ඒ වෙලාවෙම අදාළ කටයුතු ගැන හොයලා බලන්න බලයලත් නිලධාරියෙක්ව පත්කළා."**

ඒ අනුව පසුගිය සතියේදී අදාළ පුද්ගයා රැඳී සිටි නුගේගොඩ විජේරාමයේ සහ පොල්ගස්ඕවිට ප්‍රදේශයේ ස්ථාන දෙකක්ද ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සෝදිසි මෙහෙයුම්වලට ලක්කර ඇත. එහිදී ඔහු සතුව තිබූ පරිගණක සහ ජංගම දුරකතන ආදී සියල්ලද ළමා රක්ෂණ අධිකාරියේ භාරයට ගත් බවයි ඔහු අපට කීවේ. පසුව උසාවි නියෝගයට අනුව බලය ලත් ආයතනවලට ලබාදී ඒවායේ දත්ත පරීක්ෂාවටද ලක්කොට ඒ පිළිබඳ පසුගිය සඳුදා දින අලුත්කඩේ අංක 06 දරණ මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කළ බවයි ඔහු කීවේ.

යම්කිසි ආකාරයකින් මොහු විසින් දරුවන්ගේ ඡායාරූප විකෘති කිරීම්, විකිණීම් සහ සඟවා තබා ගැනීම් ආදියට කටයුතු කර ඇති බවක් සැලවුවහොත් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමටද නියමිතය.



**දරුවෙක්ව ළමා චිත්‍රපටයකට, ටෙලි නාට්‍යයකට සම්බන්ධ කරන එකේ වරදක් නෑ. නමුත් මම මේ රටේ දෙමව්පියන්ගෙන් කරුණාවෙන් ඉල්ලන්නේ දරුවන්ගේ ළමාකම නැතිවෙන විදියට ඒ අයව සමාජයට නිරාවරණය කරන්න එපා**

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපති උදය කුමාර අමරසිංහ

**"ඇත්තටම දෙමව්පියන්ට ඕන වෙච්ච පලියට ඒ අයගේ කැමැත්ත උඩ දරුවන්ට ඕනම දෙයක් කරන්න ඉඩ දෙන්න බෑ. මොකද දරුවෙකුගේ ඉහළම භාරකරුවා වෙන්නේ අධිකරණය. මේ සිද්ධියට අදාළවත් කිසියම් දෙමව්පියෙක් විසින් හිතාමතාම තමන්ගේ දරුවව අඩනිරුවත් ඡායාරූපවලට යොමු කරලා කියලා කරුණු අනාවරණය වුණොත් එවැනි දෙමව්පියන්ට විරුද්ධවත් නීතිමය පියවර ගන්න ළමා ආරක්ෂක අධිකාරිය කටයුතු කරනවා.**

**අවසාන වශයෙන් මට දෙමව්පියන්ට කියන්න වැදගත් පණිවිඩ කීපයක් තියෙනවා. එකක් තමයි දරුවන්ගේ අසභ්‍ය දර්ශන ඇතුළත් මේ වගේ වෙබ් පිටු ගැන තොරතුරු ලැබුණොත් ඕනම වෙලාවක ළමා ආරක්ෂක අධිකාරියේ 1929 දුරකතන අංකයට හැකි ඉක්මනින් දැනුම් දෙන්න කියන එක. අනිත් කාරණාව තමයි මේ දරුවන්ගේ අධ්‍යාපනයට මහා පිළිලයක් වෙලා තියෙන මේ ටික්ටොක් වසංගතය. නීතිමය ප්‍රතිපාදන තියෙනවා නම් ළමා රක්ෂණ අධිකාරියේ සයිබර් විමර්ශන අංශය කිසිම පැකිලීමක් නැතුව ඒ ගැනත් කටයුතු කරනවා. ඒ වගේම කුඩා දරුවන්ව රියැලිටි සංදර්ශනවලට, වෙළඳ දැන්වීම්වලට යොදගැනීම ගැනත් රටේ සැළකිය යුතු පිරිසකගේ විරෝධය තියෙනවා. අපි මේ කියන්නේ ළමයින්ව කලාවට යොමු කරන්න එපා කියලා නෙවෙයි. නමුත් අනවශ්‍ය කීර්ති නාම, ප්‍රසිද්ධිය නිසා දරුවන්ව පාසලේදී මගතොටේදී වුණත් අපහසුතාවයට ලක්වෙන්න පුළුවන්. දරුවෙක්ව ළමා චිත්‍රපටයකට, ටෙලි නාට්‍යයකට සම්බන්ධ කරන එකේ වරදක් නෑ. නමුත් මම මේ රටේ දෙමව්පියන්ගෙන් කරුණාවෙන් ඉල්ලන්නේ දරුවන්ගේ ළමාකම නැතිවෙන විදියට ඒ අයව සමාජයට නිරාවරණය කරන්න එපා කියලා."**

මෙය සත්‍ය සිදුවීමක් වුවත් මෙකී දැරියන්ගේ නම් හෝ ගම් හෙළිකිරීම සිදුකල නොහැකිය. එය නීත්‍යානුකූල හෝ සදාචාරසම්පන්න නොවන බවයි ළමා ආරක්ෂක අධිකාරියේ සභාපතිවරයා වැඩිදුරටත් සඳහන් කර සිටියේ.

**ඒ පුද්ගලයා කිව්වේ මේ දරුවෝ හැම කෙනෙක්ගෙම ඡායාරූප ගත්තේ දෙමව්පියන්ගේ කැමැත්ත ඇතුව කියලා**

ලිහිණි මධුෂිකා

# අවසරයි

බියංකා නානායක්කාර ලියයි

55 කොටස

**මෙතෙක් කතාව**

*විදුහල්පතිවරයෙකු වූ සෙනරත් ඇල්ලේපොලගේත්, සේපාලිකා ඇල්ලෙපොලගේත් වැඩිමල් දියණිය වන අංජනා සරසවි සිසුවියකි. ඇමතිවරයකු වන බණ්ඩාර තෙන්නකෝන්ගේත්, සෙනෙහෙලතා මැණිකේ තෙන්නකෝන්ගේත් බාල පුතා වූ තේනුක ඇය හා පෙමින් බැඳෙන්නේ දුටු සියලු තරුණියන් අතරින් ඈ ළඟ හිත සෙවූ පෙම්වතිය සිටි නිසාය. දේශපාලනය නොරුස්සන ඔහු ගෙදරින් ඈත්ව ඔහුගේම ව්‍යාපාරයක් කරගෙන යන්නේ ජපානයේ සිට පැමිණියාට පසුවය. සෙනෙහෙලතා මැණිකේ දියණියට හා වැඩිමල් පුතුට වඩා තේනුකට ආදරය කළාය. ඒත් ඔහුගේ වැඩිමල් සහෝදරයා වූ මේනක බණ්ඩාර හැමවිටම ඔහු හා තරගයට ආ අතර මේනක විසින් තෙන්නකෝන් බණ්ඩාර ඇමතිවරයා නිතර රටේ කතාබහට ලක් කරන පුවත් මැව්වේය. සෙනරත් ඇල්ලේපොල හෘදයාබාධයකින් හදිසියේ මියයාමත් සමඟ රැකියාවක් නොකළ සේපාලිකාත්, අංජනා, නංගී සහ මල්ලීත් අසරණ වෙද්දී ඔවුනට පිහිට වූයේද තේනුකය. ඒ වනවිට ඔහු කඩවත පියාගේ නිවසේ පදිංචිව සිටි අතර මේනක, තෙන්නකෝන් බණ්ඩාර ඇමතිවරයා රවටමින් ඒ නිවසේ ගෙවත්ත එළවලු වගාවට ඉල්ලා සිටියේය. ඔහුට ඊට ඉඩදීමේ ප්‍රතිඵලයක් ලෙසින් තේනුකට ඒ නිවසේ සිටින්න බැරි වුණේය. ඒ අවස්ථාවේ කාටත් රහසින් සෙනෙහෙලතා මැණිකේ ඇගේ ගමේ ඉඩමක් සහෝදරයාට විකුණා ගත් මුදල් තේනුකට නිවසක් මිලදී ගන්නට දුන්නාය. ඔහු නිවසක් මිලට ගත්තද එය අංජනාට සැඟවූයේ දිනෙක ඈ පුදුමකරනු සඳහාය. ඒ නිසා ඔහු ඉන්නේ කුලී නිවසක බව කී තේනුක ඒ නිවසේම පහත මහළ අංජනාගේ පවුලේ අයට ලබා දුන්නේය. දරුවන් සම්පූර්ණයෙන් මාතලේ ඉගෙනීම් කටයුතු නැවැත්වූ පසු කොළඹ එන්නට සේපාලිකාගේ බලාපොරොත්තුව විය. මේ අතර තේනුකගේ කේන්ද්‍රයේ සිකුරුගේ බලය වැඩිවූවා සේ ඔහු නොදැන මංගල යෝජනා දෙකක් පැමිණ තිබුණි. එකක් බණ්ඩාර තෙන්නකෝන් ඇමතිවරයාගේ සහෝදර ඇමතිවරයෙකුගේ දියණියකි. අනෙක තේනුකගේ මාමාගේ දියණිය චතුමිණිය. ඒ කිසිත් නොදැන තේනුක අංජනාව සමන් දේවාලය වන්දවන්නට කැඳවා ගියේය. විදේශයක සිට ලංකාවට පැමිණ සිටි චතුමිණි දෙමාපියන් සමඟ ඔහු බලන්නට ඒ අතරවාරයේ ඇමති නිල නිවසට පැමිණියාය.*

**අද එතැන් සිට**

# සමන් දෙවියන්ට වැඳලා මාත් එක දෙයක් ඉල්ලුවා

මේනක බණ්ඩාරගේ ඇහැ ළඟ නැවතුණ චතුමිණිගේ ඇස් සිනාසුණේය. ඈ සිනාසෙන විට මලක් පිපෙනවා වැනි යැයි මේනකට සිතුණි.

**"පොකුණට පනින්න හිතුණා. අන්න අර මලකට ආස හිතිලා..."**

චතුමිණී කීවේ ඒ සිනාසුණ ඇස් එවර පොකුණේ වූ රතු නෙළුමක් ළඟ නවතමිනි.

**"ඔයාට නෙළුම් මලක් ඕනෙද...? ඉන්න පොඩ්ඩක්..."**

ඔහු වටපිට බලමින් කියද්දී ඊළඟට චතුමිණිට ඔහු කරන්නට යන දෙය දැනුණි.

**"අනේ එපා අයියා. මං කවදාවත් මල් කඩන්නෙ නෑ එහෙම නිකන් ආස හිතුණාට. මල අයිති ගස්වලට. ඒ වගේමයි දැන් ඔය නෙළුම් ගස් ටික ඔක්කෝම අයිති පොකුණටනෙ."**

''ඔයා **මාරයිනේ**...''

මේනක කීවේ උද්‍යානයේ සිව් කොණට ආරක්ෂක නිලධාරියෙකු සොයා කරකැවූ ඇස් ඈ ළඟ යළිත් නවතමිනි.

**"මගෙ හිත සතුටුවෙන්න මං නම් කවදාවත් අනුන්ගේ දෙයක් ගන්නෙ නෑ..."**

ඇය ඇවිද ගොස් ඒ ළඟ වූ සිමෙන්ති බංකුවෙන් ඉඳගත්තාය. ඒ පසුපසින්ම ගිය මේනකත් ඇයට මුහුණලා තිබූ අනෙක් බංකුවෙන් ඉඳ ගත්තේය.

රත්නපුරේ අහස ළානිල් පාටින් දිලිසුණේය. අව්ව සැරට තිබුණත් සැදැහැ සිත් ඇත්තන්ට ඒ අව්වේ සැර බව දැනුණේ නැත. සුදු වතින් සැරසුණු තේනුක බණ්ඩාර තෙන්නකෝනුත් අංජනා ඇල්ලේපොලත් සිටියේ සමන් දේවාලයට යන ගල් පඩිපෙළ නගිමිනි. තේනුක අත පූජාවට සැකසූ පලතුරු වට්ටිය විය. සුදෝ සුදු මල් වට්ටියක් අතින් ගත් අංජනා ඔහුගේ ළඟින්ම පියවර මැන්නාය.

**"මං හින්ද ඔයාට සෑහෙන්න කරදර නේද?"**

ඇය කීවේ ඇත්තටමය.

**"මං මීට ඉස්සෙල්ලා මේ වගේ තැන්වලට ඇවිත් නෑ. හැබැයි දැන් මගෙ හිතට මොකද්දෝ අමුත්තක් දැනෙනවා. ඒ කියන්නෙ හිතට හරිම සැනසීමක්..."**

**විශ්වාසය තමයි ශක්තියක් වෙලා අපේ ළඟට එන්නේ**

තේනුක කීවේ ඇත්තටමය. එද සතියේ දිනක් වුවත් සෑහෙන පිරිසක් සමන් දේවාල බිමේ වූහ. ඔවුන් දේවාලය අබියසට යන විට එක් පූජාවක් පටන්ගෙන තිබුණි.

**"මහත්තයෝ පූජා වට්ටිය ඇතුළෙ පැත්තකින් තියලා පූජාවට කලින් බුදුන් වැඳලා එන්න..."**

කපු මහතෙකු පැමිණ ඔවුන්ට කීවෙන් තේනුක අත වූ පූජා වට්ටිය දේවාලය තුළ පිටුපසට වන්නට වූ මේසයක් මතින් තැබුවේය. දකුණු පස වූ බුදු ගෙය වෙත ගොස් මල් පිදුවේය.

**"ගොඩක් වෙලා වැඳගෙන මොනවද කිව්වේ...?"**

බුදුන් වැඳ ඉඳ සිටි තැනින් නැගිටිද්දී තේනුකගේ අතැඟිලි යාන්තමින් අල්ලා අංජනා ඇසුවාය.

**"මාත් සමන් දෙවියන්ගෙන් දෙයක් ඉල්ලුවා..."**

**"ඒක හොඳයි. විශ්වාසය තමයි ශක්තියක් වෙලා අපේ ළඟට එන්නේ..."**

ඒ ප්‍රාර්ථනාව කුමක්දැයි ඇය අසාවි කියා තේනුක හිතුවත් ඒ මොකද්දැයි ඇය ඇසුවේ නැත.

**"ඊළඟ පූජාවට ඉන්න අය දේවාලෙ ඇතුළට එන්..න..."**

කපු මහතෙකු කියනු ඇසුණෙන් ඔවුන් දෙදෙනා ඉක්මනින් දේවාලය තුළට ගියහ. දේවාලයේ ඉදිරිපස සෙනග පොදිකමින් සිටියහ.

**"අපි එතෙන්ට පූජා වට්ටිය දෙන්න ඕන. ආ ඒක අඳුරගන්න ලකුණක් තියන්න ඕන කියලා අම්මා කිව්වා..."**

හදිසියේ මතක් වී අංජනා කීවාය. ඒ එතැන වූ පලතුරු වට්ටි සියල්ල එක වගේ නිසාය. එයට කෙසේ සළකුණක් තබන්නේදැයි තේනුකට කල්පනා වූයේ නැත. ඔහු සාක්කුවෙන් ගත් වාහනයේ යතුර එහිවූ තැඹිලි ගෙඩියේ අමුණා පලතුරු වට්ටිය කපු මහතාට දුන්නේය. දෙදෙනාම අනෙකුත් අය සේ බිම ඉඳගෙන වැඳගත්හ. කපු මහතා පූජාව පටන් ගත්තේය. තේනුක ඒ සියල්ල හොඳින් අසා සිටියේය. අංජනා ඉඳ සිටියේ ඔහුගේ ඇඟට හේත්තු වීය.

විනාඩි දහයකට පහළොවකට වඩා පූජාව තිබුණේ නැත. එතැනින් යළි ලැබුණු පූජා වට්ටිය අතට ගෙන ඔවුන් දෙදෙනා දේවාලයේ දොරටුවෙන් පිටතට ආහ.

**"අම්මා කිව්වා මේක විසිකරන්න එපා කියලා. කවුරුහරි ඉන්නවනම් කන්න දෙන්න කිව්වා. නැත්තම් අපිට හරි කන්න කිව්වා..."**

ඇය එසේ කියත්ම ඈත සෙවණක සිටි දරු දෙදෙනාත් කෙසඟ කාන්තාවත් තේනුක ඇයට පෙන්නුවේය.

**"අන්න එයාට දෙමු. එයා හුඟක් දුප්පත් කියලා පේනවා..."**

ඔහුගේ අතේ අත දවටාගෙනම ඇය ඔහු හා ඒ කාන්තාව ළඟට ගියාය.

''නෝනටයි මහත්තයාටයි සිතූ පැතූ ප්‍රාර්ථනා ඉෂ්ටවෙන්න ඕන.''

ඈ දෑතින් පලතුරු වට්ටිය ගෙන පිං දුන්නාය. තේනුක සාක්කුවෙන් ගත් රුපියල් සීයක් ද ඈ අත තැබුවේය. ඊට ඈ දෑත් දිගු කර වැන්දය. ඔවුන් දෙදෙනා එතැනින් මගහැර ගියේ ඒ ගැහැනු කෙනා නිසා හිතේ උපන් බරක් ද සමඟිනි.

''හවස් වෙනකල් වෙලාව තියෙනවා ඇවිදිනවා නම්...''

තේනුක කීවේ ඇගේ මුහුණු දෙස බලමිනි.

**"විහාගෙ ඉවරවෙලා ඇවිදින්න එමු. දැන් ඇවිද්දට වැඩක් නෑ."**

අංජනා කීවේ ඔහුගේ නෙතු පතුල බලමිනි. ඇයට දැනෙන්නේ කිලෝ ගණනක් බරැති දෙයක් හිසමත ඇති සෙයකි. විභාගයට ලියූ පසු ඒ තත්ත්වය නැතිව යන බව අත්දැකීමෙන් ඇය දන්නීය. එතෙක් ක්‍රියා විරහිත කර තිබූ දුරකතනය ඔහු ක්‍රියාත්මක කළේය. මගහැරුණු ඇමතුම සාප්පුවෙනි. ඔහු වින්දනට කතා කළේ ඔහු කතා කරන්නට ඇත්තේ අත්‍යාවශ්‍ය කරුණකට බව දන්නා නිසාය.

**"පහුගිය දවසක අපෙන් ෆෝන් එකක් ගත්ත කෙනෙක්ගෙ ෆෝන් එකේ අවුලක් ඇවිත්. මං කිව්වා තියලා යන්න, හදලා දෙන්නම් මේ වෙලාවෙ හදන කෙනා නෑ කියලා..."**

තේනුකගේ කටහඬ ඇසුන සැනින් වින්දන කියාගෙන ගියේය.

**"ඉතින්..."**

**"මිනිහා කෑගහලා ගියානේ බාල ෆෝන් විකුණනවා කියලා. මට කතා කරන්නවත් දුන්නෙ නෑ. පොලිසි යනවා කිව්වා..."**

**මිනිහා කෑ ගහලා ගියේ. පොලිසි යනවා කියලත් කිව්වා**

වින්දන ඇමතුම ගත්තේ බයවී වෙන්නට ඇති බව ඔහු එයින් දැනගත්තේය.


**"පොලිසි ගියාට නම් බය වෙන්න එපා. ඒවා කම්පැණි ප්‍රශ්න. කොහොමවුණත් අපි ෆෝන් රෙපෙයාර් කරන කෙනෙක් හොයාගන්න ඕනෙ. රාහුල් නොකියාම නැවතුණා. දැන් රාහුල්ගේ ෆෝන් එකවත් වැඩ කරන්නෑනෙ."**

දුරකතන ඇමතුමෙන් පසු තේනුකගේ මුහුණේ කණස්සල්ලක් ඇඳෙනු අංජනා දුටුවාය. ඈ පුරුදු ලෙස ඒ ගැන ඇසුවේ නැත. උවමනා නම් ඔහු ඒ ගැන කියනු ඇතැයි ඇයට සිතුණි. ඒ ඇමතුම අවසන් වූවා පමණි. ආයෙත් ඔහුගේ දුරකතනය නාද වුණේය. ඇමතුම ආවේ නාදුනන අංකයකිනි. නොගෙන ඉන්නට හේතුවක් නැති නිසා ඔහු ඇමතුම ගත්තේය. අනෙක් පසින ඇසුනේ ගැහැනු කෙනෙකුගේ හඬකි.

**"හායි තේනුක අයියා... අඳුරන්න පුළුවන්ද මාව?"**

ඔහුට එක්වරම බැලුනේ අංජනා දෙසයි.

ලබන සතියට...





# කළමනාකරණ උපාධියක් තියාගෙන කොණ්ඩ කපන බාබර් මල්ලි

කැම්පස් ඉන්න කාලේ හොස්ටල් එකේ එකට හිටපු කොල්ලන්ගේ කොණ්ඩ කැපිල්ලෙන් පටන් අරන් අද ලොකු සැලුන් එකක් කරන මේ තරුණයාගේ නම යොමාල් සඳරුවන් ජයසුන්දර. වයස අවුරුදු 27 යි. ඔහුගේ වෘත්තිය තමයි කොණ්ඩා කැපීම. අනුන්ගේ කොණ්ඩ කැපුවට මොකද යොමාල් කියන්නේ ලොකු උපාධියක් තියෙන තරුණයෙක්. එසේ මෙසේ උපාධියක් නෙවෙයි ඔහුට තියෙන්නේ වාණිජ හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ උපාධියක්. අවුරුදු හතරක කැම්පස් ජීවිතේට ආයුබෝවන් කියන හැමෝම රජයේ රැකියා හොයන්න මහන්සි වෙනකොට ඔහු කිසි හීනමානයක් නැතුව සැලුන් රස්සාව තෝරගන්නවා. කැලණිය, දළුගම තියෙන **'සැලුන් යොමා'**හි අයිතිකාරයා තමයි යොමාල්. ඉතින් අපිත් යොමාල්ගෙන් හැමෝම අහන ගතානුගතික ප්‍රශ්නෙම ඇහුවා. ඒ තමයි උපාධියක් අතේ තියාගෙන සැලුන් රස්සාව කරන්නෙ ඇයි කියලා. ඔහු නිහතමානීව පිළිතුරු දුන්නා. ඒක ටිකක් දිග උත්තරයක්. හැබැයි මේ කතාවෙන් ඔබේ ජීවිතේට එකතු කරගන්න ගොඩක් දේවල් තියේවි.

**"මං ඉපදුණේ කුරුණෑගල නිකවැරටියේ. ඒක ගොඩාක් දුෂ්කර පැත්තක්. හවස හයෙන් පස්සේ එළියට බහින්න බෑ අලි හින්ද. ඉතින් පණ බයේ තමයි ගොඩාක් දවස්වල රෑට නිදාගන්නේ. අපි ගෙදර හිටියේ අම්මයි, තාත්තයි, මමයි, නංගියි. ගොවිතැන තමයි ගෙදර ප්‍රධාන ජීවනෝපාය වෙලා තිබුණේ. ගොවිතැන කියන්නෙ ලේසි පහසු වෘත්තියක් නෙවෙයි. ඒක දන්නේ ගොවිතැන් කරන මිනිස්සු විතරයි. කොහොම හරි මං පුංචි කාලේ දුප්පත්කම නිසා ගොඩාක් දුෂ්කරතා වින්ද. තාත්තා එයාගේ බඩට නොකා හරි මගේ බඩගින්න මැකුවා. අතේ රුපියලක් නැති වුණාත් මට ඒක දැනෙන්න දුන්නේ නෑ. ණයක් වෙලා හරි සල්ලි හොයාගෙන මට ඉගැන්වුවා.**

**පුංචි කාලෙ ඉඳලම මං දැක්කා මගේ අම්මා තාත්තා මං වෙනුවෙන් මහන්සි වෙන හැටි. ඒක නිසා මං හොඳට ඉගෙනගත්තා. එහෙමයි කියලා කොල්ලො ඒ වයසේ කරන දඟ වැඩත් මම නොකර හිටියෙ නෑ. මං පුංචි කාලේ ගියේ ගමේ පාසලට. ඒ කියන්නේ ගිරිල්ල මධ්‍ය මහා විද්‍යාලයට. මං ශිෂ්‍යත්ව විභාගයත් හොඳට පාස් වුණා. ඒත් මං සාමාන්‍ය පෙළ ලිව්වෙත් ඒ පාසලේමයි. සාමාන්‍ය පෙළ විභාගයත් හොඳටම පාස් වුණා. ඊටපස්සෙ මං 2013 අවුරුද්දේ උසස් පෙළ කරන්න නිකවැරටිය මහසෙන් ජාතික පාසලට ආවා. උසස් පෙළ කළේ වාණිජ විෂය ධාරාවෙන්. අන්තිමේ A තුනක් අරගෙන විශ්වවිද්‍යාල වරම් ලබන්න පුළුවන් වුණා.**

**ඊටපස්සෙ මං කැලණිය කැම්පස් එකට ආවා. ඒක මගේ ජීවිතේ තිබුණු ලොකු හීනයක්. ප්‍රතිඵල පිටවුණු දවසේ මටත් වඩා සතුටුවුණේ මගේ අම්මයි තාත්තයි. හැබැයි කැම්පස් යන එකත් ලේසි වැඩක් වුණේ නෑ. මොකද අපේ ගෙදර ඉඳන් කිලෝමීටර් 250ක් විතර තියෙනවා කැම්පස් එකට. හැබැයි ඉතින් ඒ වෙනකල් මං විඳලා තිබුණු දුෂ්කරතා එක්ක මට ඒක ලොකු දුරක් කියලා හිතුණේ නෑ. පළවෙනි අවුරුද්ද දන්නෙම නැතිව ගෙවිලා ගියා. ඒත් දෙවැනි අවුරුද්දට එනකොට මට හිතුණා මං යන ගමන ඒකාකාරියි කියලා. පස්සේ පොඩි රැකියාවක් කරන්න කල්පනා කළා. ඒත් කරන්නේ මොකක්ද කියලා අදහසක් තිබුණේ නෑ.**

**එහෙම ඉන්න අතරේ දවසක් මං කොණ්ඩේ ටිකක් අඩුකරගන්න කියලා හිතලා කඩවත තිබුණු සැලුන් එකකට ගියා. එද ටිකක් සෙනඟත් හිටියා. ඒ නිසා මගේ වාරේ එනකල් මං සැලුන් එකේ කෙනා අනිත් අයගෙ කොණ්ඩෙ කපන දිහා හොඳට බලාගෙන හිටියා. බැලූ බැල්මට එතැන ලොකු දෙයක් තිබුබේ නෑ. ඒ කාලේ හැටියට පැය කාලක් වගේ ඇතුළත කොණ්ඩයක් කපලා කිසිම මහන්සියක් නැතුව එකසිය පණහක් දෙසීයක් ගන්න පුළුවන්. ඉතින් මගේ වාරේ එනකොට මාත් මේ සැලුන් රස්සාව පටන්ගන්න ඕනේ කියලා මං හිතලා ඉවරයි. පස්සේ මගේ කොණ්ඩේ කපන ගමන් මං එතැන අයිතිකාරයගෙන් ඇහුවා මටත් පොඩ්ඩක් සැලුන් වැඩ කියලා දෙනවද කියලා. එයත් හා කිව්වා. සතියක් විතර මං සැලුන් එකට ගියාත් එයා කපන හැටි බලාගෙන ඉන්නවා මිසක් ඔලුවක් අල්ලන්නවත් දුන්නේ නෑ. පස්සේ මේ වැඩේ හරියන එකක් නෙවෙයි කියලා මං සැලුන් එකෙන් එළියට බැස්සා.**

**පස්සේ මං තීරණයක් ගත්තා. එද මගේ අතේ යම් මුදලක් තිබුණා. ඒකෙන් මං කොණ්ඩේ කපන මැෂින් එකකුයි, පනාවකුයි, කතුරකුයි ගත්තා. එහෙම අරන් කෙළින්ම ගියේ හොස්ටල් එකට. ඒ යනකොට යාළුවෝ ටික සෙට්වෙලා බර කතාවක. මං ගිහින් කිව්වා 'මචං මං කොණ්ඩේ කපනවා. ඕන එකෙක් ඉන්නවා නම් කපලා දෙන්න පුළුවන්' කියලා. එහෙම කිව්වා විතරයි එතැන ඉඳපු අමිත් කියලා යාළුවෙක් කිව්වා කපලා දෙන්න කියලා. දෙයියනේ කියලා ඔන්න මං මුලින්ම කොණ්ඩයක් කැපුවා. දවස් දෙක තුනක් යද්දි හොස්ටල් එකේ යාළුවෝ මගෙන්ම කොණ්ඩේ කපන්න ගත්තා. මං සල්ලි ගත්තෙත් නෑ. එක දවසක් කොල්ලෙක් කොණ්ඩේ කපලා බලෙන්ම වගේ රුපියල් විස්සක් දීලා ගියා. ඒ තමයි කොණ්ඩයක් කපලා මුලින්ම ලැබුණු මුදල. ඒක මට අදටත් හොඳට මතකයි.**

**හොස්ටල් එකේ කොල්ලන්ගේ කොණ්ඩේ කපන වැඩේ අල්ලලා යද්දි මං හිතුවා කොහේ හරි පොඩියට සැලුන් එකක් පටන්ගන්න. එහෙම හිතාගෙන කැම්පස් එක හරියෙන්ම කඩ කෑල්ලක් හෙව්වා. වාසනාවට වගේ හිතට අල්ලන තැනක් හම්බුණා. එද 2019 පෙබරවාරි 08 වෙනිද. දෙයියනේ කියලා ඔන්න මං සැලුන් එකක් දැම්මා. ඒකට 'සැලුන් යොමා' කියලයි නම තිබ්බෙ. ඔය අතරේම කැම්පස් එක ඇතුළෙත් මං ගෑනු ළමයින්ට සැලුන් එකක් පටන් ගත්තා. ගෑනු ළමයි කීපදෙනෙක් එක්කයි ඒ වැඩේ කළේ. ඒත් කොරෝනා ආවට පස්සේ ඒක වහන්න වුණා. ඒත් කැලණියේ එක දිගටම කරගෙන ආවා. බිස්නසුත් හොඳටම තිබුණා. ඒක නිසා මං හිතුවා ලොකුවටම සැලුන් එක කරන්න. එහෙම හිතලා 2020 අවුරුද්දේ ඒක ලොකු තැනකට ගත්තා. මේ වෙනකොට බිස්නස් ඉතාම හොඳයි. සාමාන්‍ය රැකියාවක් කරලා ගන්නවට වඩා ලොකු මුදලක් දැන් මං සැලුන් රස්සාවෙන් හොයනවා.**

**සැලුන් රස්සාව කරන අතරෙම මං උපාධියත් සාර්ථකව අවසන් කළා. දැන් මං වාණිජ හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ උපාධියක් තියෙන උපාධිදරියෙක්. මෙච්චර ලොකු උපාධියක් තියාගෙන සැලුන් එකක් කරන්නේ ඇයි කියලා සමහරු අහනවා. තවත් අය උපාධිය අපරාදේ නේද කියලා අහනවා. උපාධිය වෙනුවෙන් කැපකරපු කාලේ අපරාදේ කියන අයත් ඉන්නවා. ඒත් මං ගත්ත තීරණය ගැන මට කිසිම පසුතැවීමක් නෑ. මොකද මං ගන්න තීරණ වෙනුවෙන් හැම මොහොතකම මං පෙනී ඉන්නවා. ඒ වගේම මං හිතනවා මගේ බිස්නස් එකට මගේ උපාධිය වැදගත් කියලා. සැලුන් එකක් කරනවා කියන්නේ පහත් වෘත්තියක් නෙවෙයි. ඒ ඉස්සර කතාවක්. දැන් සැලුන් එකක් කරලා හොඳට හම්බකරන්න පුළුවන්. රජයේ රැකියාවලට යන්න අවස්ථා ආවත් මට හැරෙන්න ආසාවක් නෑ.**

**මං එක දෙයක් කියන්න කැමතියි. අපේ රටේ අධ්‍යාපන ක්‍රමයේ ලොකු අවුලක් තියෙනවා. මං සැලුන් රස්සාවට එන්නත් ඒක යම්කිසි විදිහකට බලපෑවා. මොකද අපේ රටේ අධ්‍යාපන ක්‍රමය ඇතුළේ තමන් කැමති දෙයක් කරන්න අවස්ථාවක් නෑ. උසස් පෙළට තියෙන්නේ ගණිත, විද්‍යා, වාණිජ සහ කලා විතරයි. උපාධියක් ගත්තත් සුළු වෘත්තීන් කොටසක් තමයි තියෙන්නේ. ඉතින් ඒක ලොකු අවුලක්. මෙහෙම අධ්‍යාපන ක්‍රමයක් උඩ කවදාවත් රටක් දියුණු වෙන්නේ නෑ. ඒක නිසා ඒ තත්ත්වය වෙනස් විය යුතුයි කියන තැන මං ඉන්නවා.**

**ඒ වගේම මං රටේ තරුණ තරුණියන්ට දෙයක් කියන්න කැමතියි. අපිට උපාධි තියෙනවා අපිට ඕන මෙහෙම රැකියාවක් කිව්වට අපිට හිතන රැකියාව ලැබෙන්නෙ නෑ. ඒ නිසා හොඳම දේ තමන්ගේම දෙයක් පටන් ගන්න එක. ආරම්භය කොතැනින් ගත්තත් කමක් නෑ අවසානයයි වැදගත්. දැනට මගේ අරමුණ වෙන්නේ 'සැලුන් යොමා' ලංකාවේ ප්‍රමුඛතම සැලුන් නාමයක් කරන එක. මේ යන විදිහට මට ඒක කරන්න අමාරු නෑ."**

## යොමාල් සඳරුවන් ජයසුන්දර

> දවසක් කොල්ලෙක් කොණ්ඩේ කපලා බලෙන්ම වගේ රුපියල් විස්සක් දීලා ගියා. ඒ තමයි කොණ්ඩයක් කපලා මුලින්ම ලැබුණු මුදල

> සතියක් විතර මං සැලුන් එකට ගියාත් එයා කපන හැටි බලාගෙන ඉන්නවා මිසක් ඔලුවක් අල්ලන්නවත් දුන්නේ නෑ. පස්සේ මේ වැඩේ හරියන එකක් නෙවෙයි කියලා මං සැලුන් එකෙන් එළියට බැස්සා

*රුවන් එස්.සෙනවිරත්න*

# තාත්තා ගෙදර එන්න රෑ වෙනදාට අම්මාගෙන් දරුවන්ට දිම්ගොටු



**ඒ තාත්තා මාත් එක්ක විස්තර කිව්වෙ අඬ අඬා**

මීට මාස දෙකකට විතර කලින් මට කතා කරපු එක්තරා සැමියෙක් ඔහුගේ දුක්අඳෝනාව කියන්න පටන්ගත්තෙම **"වයිෆ් නිසා මට දැන් වහ ටිකක් කාලා මැරෙන්න හිතිලා තියෙන්නෙ"** කියලා කියාගෙන.

සියදිවි හානි කරගන්න හිතෙන තරමට බිරිඳ කරන අරියාදුව මොකක්ද කියලා ඇහුවට පස්සේ තමයි ඔහු අකුරක් නෑර ඒ සංවේදී කතාව මාත් එක්ක කිව්වේ.

මේ යුවළට දරුවෝ තුන්දෙනෙක් ඉන්නවා. දෙන්නෙක්ම ගෑනු දරුවෝ. වැඩිමල්ම දරුවට අවුරුදු 12යි. අනිත් දෙන්නා ඊට වඩා අවුරුදු දෙක තුනේ පරතරය ඇති අය.

මේ බිරිඳ තරමක් නපුරු කෙනෙක්. ඒ නිසා විවාහ වුණ මුල් කාලේ ඉඳලම දෙන්නා දෙමහල්ලෝ අතර නොයෙක් වාදබේද ඇතිවෙලා තියෙනවා.

හැබැයි ලොකු දූ ඉපදිලා අවුරුදු හය හතක් යනකොට තමයි මේ කියන ප්‍රශ්නේ පටන් අරන් තියෙන්නේ.

**"දවසක් මොකක් හරි පොඩි දේකට වයිෆ් මාත් එක්ක හොඳටෝම රණ්ඩු වුණා. එතකොට මගේ ලොකු දුව කිසිම දෙයක් නොතේරෙන දරුවෙක්. මාත් එක්ක ආපු කේන්තියට මේ ගෑනි යක්ෂාවේශයෙන් වගේ දරුවට හීන් කෝටුවකින් ගහගෙන ගහගෙන ගියා."**

දරුවට පහරදීපු නිසා එදා ඔහු ඇයට දිනුම දීලා කරබාගෙන පැත්තකට වෙලා තියෙනවා. හැබැයි සැමියව තමන්ට ඕන විදියට නටවන්න තියෙන හොඳම උපක්‍රමය දරුවෝ කියලා තේරුණු නිසා එදා ඉඳලා ඇය සැමියගෙන් පළිගන්න මේ දරුවන්ව පාවිච්චි කරලා තියෙනවා.

සේරම කුණු බේරේ වැවට වගේ සැමියා ගෙදර එන්න පරක්කු වුණත්, ඔහු ගැන සැකයක් හිතුණත් නැත්නම් වෙන මොන දේ වුණත් ඒ කේන්තිය පිටවෙන්නේ අර අහිංසක දරු පැටව් තුන්දෙනාගෙන්ලු. සමහරදාට ඇය දරුවෝ තුන්දෙනා කාමරයකට දාලා අගුළු දාලත් තියෙනවා.

අරක කළේ නැත්නම් දරුවන්ට උණුවතුර හලනවා, මේක කළේ නැත්නම් දරුවන්ට දිම්ගොටු දානවා වගේ බොහොම අමානුෂික කතා කියලා මේ සැමියව බය කරනවලු. ඒ වගේම ඇය එහෙම අසාධාරණ විදියට දරුවන්ට යම් යම් දඬුවම් දීපු අවස්ථාත් තියෙන බව ඔහු කීවා.

**මගේ වෘත්තීය ජීවිතයේ මෙතෙක් මා ඇසූ සංවේදීම සිදුවීමක්**

මේ සැමියා නැත්නම් තාත්තා මාත් එක්ක ඔය කතා කිව්වේ අඬ අඬ. දරුවන්ට කරදරයක් කරයි කියන බයට ඔහුත් බිරිඳ කියන හැමදේටම එකඟ වෙලා. ඉවසගෙන ඉන්න හිටින්න බැරි තරමට බිරිඳගේ හැසිරීම ප්‍රචණ්ඩ වුණු හින්ද තමයි ඇයව උපදේශනයට යොමු කරන්න හිතලා තියෙන්නේ.

ඇත්තම කිව්වොත් මේ සිදුවීම මගේ වෘත්තීය ජීවිතේ මටත් බොහොම සංවේදීවට දැනුණු සිදුවීමක්. ඉතින් මගේ උපදෙස් මත ඔය සැමියා දවසක් දරුවන්වයි බිරිඳවයි එක්කරගෙන මාව මුණගැහෙන්න ආවා. මම වෙලාව අරගෙන දරුවොත් එක්කත් ටිකක් තනියම කතා කළා.

**"අම්මා තාත්තා එක්ක රණ්ඩු කළාම අපිට කෑම උයලා දෙන්නේ නැහැ. ගිහින් තාත්තගෙන්ම ඉල්ලගනින් කියනවා. අම්මා අපිට ගහනවා."**

ඔන්න ඔය වගේ කතා මහගොඩක් ඔවුන් මාත් එක්ක කිව්වා. අම්මයි තාත්තයි කොයිවෙලේ රණ්ඩු කරයිද කියන බයෙන් තමයි මේ දරු පැටව් ජීවත්වෙන්නේ කියලා මට තේරුණා. ඉතින් උපදේශනයෙන් ඒ දරුවන්ගේ හිත් සුවපත් කරන්නත් මම කටයුතු කළා.

නමුත් ඒ වෙනකොට මේ බිරිඳගේ ප්‍රශ්නය මානසික ව්‍යාධියක් දක්වා දුරදිග ගිහිල්ලා තිබුණා. ඒ නිසා මම ඇයව මනෝවෛද්‍යවරයෙකු වෙත යොමු කළා. ප්‍රතිකාරවලින් පස්සේ නැවතත් ඇයව එක්කරගෙන එන්න කියලත් මම මේ සැමියට උපදෙස් දුන්නා.

තමන්ට ඇතිවෙන කේන්තිය ඊට පහළ ස්ථරයකින් මුදාහරින එක ගොඩක් අයගේ පුරුද්දක්. පහත් තැනින් යයි ගලා ජලේ කියලා කතාවටත් කියන්නේ ඒකනේ.

හැබැයි දෙන්නා දෙමහල්ලෝ අතරේ ඇතිවෙන ප්‍රශ්නවලට විසඳුම් හොයන්න හෝ පළිගන්න තමන්ගේ කුසින් වදාපු, තමන්ගේ ලෙයින් ජාතක කරපු දරු පැටවුන්ව අතකොළු කරගන්න එක නම් අනුමත කරන්න පුළුවන් වැඩක් නෙවෙයි. සැමියාගෙන් පළිගන්න දරුවන්ව ළිඳට දාපු අම්මලා, බිරිඳගෙන් පළිගන්න දියණියට අතවර කළ තාත්තලා ගැන පුවත් පවා අපිට ඇහිලා තියෙනවා.

සැමියා එක්ක බිරිඳ එක්ක ඇතිවෙන ප්‍රශ්න ලිහාගන්න දරුවන්ව පාවිච්චි කරන එක හරිම භයානකයි. මේක දරුවන්ගේ අනාගතයට වගේම දෙන්නගේ සම්බන්ධයටත් බොහොම දරුණුවට බලපානවා.මේ වගේ දේවල්වලට මුලදිම වැට බැන්දේ නැත්නම් මේක මානසික ව්‍යාධියක් දක්වා දුරදිග යන්න පුළුවන්. හරියට අපේ කතාවේ කාන්තාවට වුණා වගේ.

ඒ වගේම දරුවන්ගේ පැත්තෙන් මේක බලපාන විදියත් මම ටිකක් කියන්නම්.

ළමා අවධියේදී පහරකෑම්වලට ලක්වෙන දරුවෝ පසුකාලීනව සාමාන්‍ය ජීවිතේදී වගේම විවාහ ජීවිතේදීත් ප්‍රචණ්ඩකාරී වෙන්න තියෙන ඉඩකඩ වැඩියි. අනික අම්මා තාත්තා තමන්ට පහරදෙන්නේ වරදක් නැතිව කියන එක අවුරුදු තුන හතරක දරුවෙක්ට නොතේරෙනවා කියලා හිතන්න එපා. මේ වගේ දේවල් නිසා දරුවන්ට මානසික ප්‍රශ්න ඇතිවෙන්න පුළුවන්. අනික මේ ප්‍රශ්න දරුවෙක්ගේ අනාගතයටත් නිතැතින්ම වගේ බලපානවා.

දරුවෝ ඉන්න පවුලක් කියන්නේ අඹුසැමි දෙපළ විතරක්ම නෙමේ. දරුවොත් ඒ පවුලෙම කොටසක්. දරුවන්ට ප්‍රශ්න ඇතිවෙනවා කියන්නේම ඒ පවුල ඇතුළේ සතුට, සැනසීම අතුරුදහන් වෙනවා කියන එකයි. අනික ළමා කාලේ දරුවන්ට, දරුවන්ට වගේ සළක්නනේ නැතිව වයසට ගියාට පස්සේ ඒ අයගේ සැළකුම් බලාපොරොත්තු වෙන්න එපා.

මෙතැනදී මම මේ සැමියාගෙත් වරදක් දැක්කා. ඒ තමයි නි යපොත්තෙන් කඩන්න තියෙන දේ පොරොවෙන් කඩන මට්ටමට එනකල් ඉඳපු එක. ඔහු ප්‍රශ්නෙට විසඳුම් හොයද්දි කෝච්චිය යන්න පටන් අරන්.

කවුරුහරි දරුවෙක්ට අමානුෂිකව පහරදෙනවා නම් නීතිමය ක්‍රියාමාර්ගවලට පවා යන්න පුළුවන්. දරුවට පහර දෙන්නේ අම්මද තාත්තද කියන එක එතැනදී අදාළ නැහැ.

තමන්ගේ බිරිඳ සැමියා තමන්ව බය කරන්න හිතාගෙන දරුවන්ට ප්‍රචණ්ඩත්වයට පත් කරනවා නම් නැත්නම් වෙනත් හේතුවක් නිසා හරි දරුවන්ව අමානුෂික විදියට පහර දෙනවා නම්, වද දෙනවා නම් කරුණාකරලා ඔහුව හෝ ඇයව නිසි උපදේශනයකට යොමු කරන්න කියන එක තමයි මගේ ඉල්ලීම.



මානව හැකියා ප්‍රවර්ධන විශේෂඥ හා ජ්‍යෙෂ්ඨ මනෝවිද්‍යා උපදේශිකා
රත්නා පුෂ්ප කුමාරි

සෙව්වන්දි හෙට්ටිආරච්චි

# මේ පුංචි බට්ටෝ ටික

## අපිට දරුවෙක් නැති අඩුව කවදාවත් දැනෙන්න දුන්නේ නෑ

මොනිකා කුලරත්න ඒ වෙනකොට හිටියේ ලෙඩ ඇඳේය. ජීවිතය ගිලිහෙමින් සිටියදී අගේ අවසන් බලාපොරොතතුව වුයේ තුන්වැනි පුතු වූ ගැමුණු සසංක කුලරත්න ගෙදරට ලේලියක් කැන්දාගෙන එනු දැකීමයි. චිත්‍රපට අධ්‍යක්ෂවරයකු වූ සැමියා, සිරි කුලරත්නටත් බිරිඳ දිවිය හැරයන්නට පෙර ඇගේ ඒ බලාපොරොත්තුව ඉෂ්ට කරන්නට නොහැකි වුනේය. දරු සිව් දෙනාගෙන් ඒ වන විට අවිවාහකව සිටියේ බාල දරුවන් වූ සසංකත් ඔහුගේ මල්ලි හසිත නිරෝෂණත් පමණි.

**" අම්මා ජීවත් වෙද්දී කසාද බඳින්න බැරිවුණ නිසා එයා නැතිවුණාට පස්සෙ කවදාවත් කසාද බඳින්නෙ නෑ කියලා මං හිතුවා. ඒ අලුතම තමයි දවසක් අපේ පුංචි කෙනෙක් මට කතාවක් කිව්වේ. එයා දන්න ගෑණු ළමයෙක් අවුරුදු දහයෙදි කුප්පි ලාම්පුවක් පෙරලිලා ගිනි අරන් ඇඟ පිච්චිලා. එයාට කවදාවත් බබාලා ලැබෙන්නෙ නෑ කියලා දොස්තරලා කියල තියනවලු. ඒක හින්දා ඒ ළමයව කසාද බඳින්න කිසිම කෙනෙක් කැමති නෑ කියලා. ඒ කතාව ඇහුවම මට එයා ගැන දුක හිතුණා. එයාගෙ ජීවිතේට අත දුන්නොත් අපේ අම්මා ඉන්න තැනක ඉඳලා සතුටුවෙයිනෙ කියලා මට හිතුණා. "**

> **අවුරුදු දහයෙදි කුප්පි ලාම්පුවක් පෙරලිලා ඇඟ පිච්චුනාට පස්සේ දරුවෝ හදන්න බෑ කියලා කිව්වා**

ගැමුණු සසංක 2014 වසරේදී කුප්පි ලාම්පුව පෙරලී පිච්චුනු ඒ ගෑනු ළමයා සමග විවාහ වන්නේ ඒ අනුවයි. ඇය සේනාලි දේවිකා මධුවන්තිය. දරුවන් නොලැබෙතැයි එදවස කියා තිබුණත් හැම විවාහක යුවළකගේම මෙන් සසංක, සේනාලි දෙන්නාගේත් හිතේත් දරු සිහිනය උඩින්ම තිබුණෝය. ඒත් වෛද්‍යවරුන් කීවා සේම ඒ සිහිනය ඔවුන්ට නොපෙනෙන තරමට ඈතට ගොස් තිබුණි.

**" ටිකක් කල් යනකොට සමහරු දරුවො ගැන ඇහුවා. දොස්තරලා ගැන කිව්වා. ඒත් පෙර ආත්මවල කරපු පවක් වෙන්න ඇති කියලා අපි දෙන්නා හිත හදාගත්තා.**

**හැබැයි අපිටත් පාළුව තනිකම දැනුණා. ඒ නිසා අපි 2015 අවුරුද්දෙ අසල්වාසි ගෙදරකින් පූස් පැටව් ජෝඩුවක් ගෙනාවා. ඒ දෙන්නා ටිකී සහ කනික්කා. එයාලා ආවා විතරයි ගෙදර තිබ්බ පාලුව කොහෙන් ගියාද නෑ. එයාලගෙ සෙල්ලම් දිහා බලා ඉන්නකොට හිතේ තියෙන ප්‍රශ්න, ගැටලු, කරදර ඔක්කෝම අමතක වෙනවා."**

පූස් පැටව් දෙදෙනාගේ සෙල්ලම් වලින් පිරුණු ගෙදරට පාරෙන් තවත් බලු පැටව් දෙන්නෙකුත් පොමනේරියන් බලු පැටියෙකුත් සසංක ගෙන ආවේය. ටිකෙන් ටික ගෙදර සත්තුන්ගේ සුරතල් හැසිරීම්වලින් පිරෙද්දී ඔවුන්ට දරුවෙකු නැති අඩුව අමතක වන්නට විය.



**" ටවුමට ගියොත් එයාලට උවමනා කෑම බීම සෙල්ලම් බඩු ගෙනාවේ. මේ ගොල්ලො හදන්න ගත්තට පස්සෙ අපි රැයක් පිට ඉන්න කිසිම ගමනක් ගියේ නෑ. මඟුල් ගෙදරක, මළ ගෙදරක, දානෙ ගෙදරක හරි මොනම ගමනක් ගියත් තුන හමාර හතර වෙද්දි ගෙදර ආවා, එයාලා බඩගින්නෙ කියලා. සමහරු කිව්වා "ඔයාලා කරන ඔය පින් හින්දා කොයි වෙලාවෙ හරි දෙයියො මූණ බලයි කියලා. ඒකත් අපේ යටි හිතේ පුංචියට අදටත් බලාපොරොත්තුවක් වෙලා තියෙනවා. ඔය අතරෙ තව තව එක්කෙනා දෙන්නා පූස්ලා, බලු පැටවුන් අපේ ගෙදරට එකතු වුණා. "**

> **කොරෝනා කාලේ බලු පැටව් පූස් පැටව් ගෙවල් නැතුව පාරවල් ගානේ හිටියා**

විවාහයෙන් පසු සේනාලි හා වැල්ලව මහ ගෙදර පදිංචිව සිටි සසංක 2016 ඔහුගේ පියාගේ වියොවින් පසු බිරිඳගේ ගම වූ වාරියපොල පදිංචියට ගියේය. ඒ යද්දී සත්තු සේම ඔහුගේ එකම බාල සහෝදරයා හසිත නිරෝෂන් ද කැටුව ගියේය. ඔවුන් තරමටම හසිත ද සතුන්ට බෙහෙවින්ම ආදරය කරන කෙනෙකි. අවුරුදු ගණනාවක් කොළඹ සිට රැකියාව කළ සසංක දැන් වසර ගානක් තිස්සේ දිගටම සිටිනුයේ වාරියපොලය. විසිතුරු මසුන් ඇති කිරීම ආදායම් මාර්ගය ලෙස සාර්ථකව කරගෙන ගියත් කොරෝනා ඒ සියල්ල බංකොලොත් කළේය.

**" කොරෝනා වලින් පස්සෙ විසිතුරු මසුන් හැදීම නැවතුණා. දැන් මල්ලියි මමයි ඉලෙක්ට්‍රික් රෙපෙයාර් වැඩ කරනවා. පොඩ්වට මාස්ක් වෙළඳමක් කරගෙන යනවා. ඒ අතරේ මෑතකදී කොළඹින් අඳුනාගත් අක්කලා දෙන්නෙකුත් සත්තු වෙනුවෙන් අපට උදව් කරනවා. කොරෝනා කාලේ බලු පැටව් පූස් පැටව් ගෙවල් නැතුව පාරවල් ගානේ හිටියා. එයාලා එහෙම අසරණ විදිහට ඉන්නවා දැක්කම මට හරි දුකක් දැනුණා. ඒ ගොල්ලන්ගෙන් අපිට ලොකු සතුටක් ලැබෙද්දි ඇයි මේ පාරවල් ගානෙ එයාලා දාලා දුක් දෙන්නේ කියලා මට හිතෙන්න ගත්තා. අන්තිමට මං පුලුවන් විදිහට එයාලාව බලන්න හිතුවා. "**

ඉන්පසු සසංක කළේ ඒ සතුන් ගෙදරට ගෙන්වීමයි. මහා ලොකු වත්කමක් නැතත් සතුන්ගේ බඩ පුරවා සතුටින් තැබීමේ හැකියාව ඔවුන්ට තිබුණි.

**"විකී, මලී, චූටියා,සොයිසා, පුපුංචප්පු, යකී, චූටි මල්ලි, පුංචා, නෝටි, ලීසා, චීටරයා, සිගිති, බන්ටි, චූටි නංගි, ටිකිරි ඒ ගොල්ලන්ගෙන් ටික දෙනෙක්. ඔක්කොම පූස්ලා විස්සකට වඩා ඉන්නවා. බල්ලොත් ඉන්නවා කීප දෙනෙක්. දැන් මේ ගෙදරත් මෙයාලට එයාලගෙ ගෙදර වගේ. අපි පිට මින්ස්සු. මගේ බයිසිකලේ සීට් එක ඉවරයි. අපේ ගෙදර පුටු සෙට්ය නෑ දැන්. ඒක කොනහලා කොනහලා කාල. දොර ජනෙල් රෙදි වල නැගලා ඉවරයි. ඒත් එහෙම වුණා කියලා අපි කවදාවත් කේන්ති ගත්තෙ නෑ. සත්තුට ගැහුවෙ බැන්නෙ නෑ. ඒ වයසෙ දරුවෙක් හිටිය නම් ඒත් ඔච්චරයිනෙ. අපෙ දරුවො මොන වැඩක් කළත් අපි කේන්ති ගන්නෙ නෑනෙ. මේ අයත් එහෙමයි. "**



සසංක හා සේනාලි විවාහ වී මේ ගෙවෙන්නේ අට වැනි අවුරුද්දයි. එදා තිස් හත් හැවිරිදි වියේ සිටි සසංකත් සේනාලිත් ඒ කාලයත් සමග තවත් අවුරුදු අටකින් වයසට ගොස් ඇත.

ඒත් ඔවුන්ගේ හිතේ කිසිම තැනක කලකිරීමක් පසුතැවිල්ලක් නැත. ඒ වෙනුවට ඔවුන් සතුටින් සැනසුමෙන් සිනාසෙති.

**"දැන් පූස්ලම විස්සකට වඩා ඉන්නවා. බලුලත් කීප දෙනෙක් ඉන්නවා. පූස්ලා පොඩි දරුවො වගේ තමයි. කෑම කන්න ගියත්, ටී.වී බලන්න ඉඳගත්තත්, නිදාගන්න ඇඳට ගියත්, මිදුලෙ වැඩකට ගියත් මෙයාලා පිටි පස්සෙමයි. පොඩි වෙලාවකට හරි අතට අරන් ඔලුව අතගාන්න ඕන.**

**අපි පත්තර වලින් ප්‍රවෘත්ති දකිනවා. දරුවන් නෑ කියලා සමහර පවුල් මරා ගන්නවා. පවුල් කඩා ඉහිරවගන්නවා. රණ්ඩු සරුවල් ඇති කරගන්නවා. ඇත්තටම ඒ වගේ අයට මං කියන්නේ. හදන්න සුරතල් සතෙක්. හිත කොච්චර නිවෙනවද බලන්න. ඒ නිවෙන හදට දරුවෙක් වඩින්නත් පුළුවන් "**

සසංක කීවේ දැඩි ඇදහීමකිනි. විශ්වාසයකිනි.

**බියංකා නානායක්කාර**

අවසන් කොටස ලබන සතියේ....

## එල්.ටී.ටී.ඊ මරාගෙන මැරෙන කොටි කාන්තාවක් ධරණී ට කියයි

**මෙතෙක් කතාව**

ලෝජිනීගේ උපන්ගම කොටි සංවිධානයේ යුද මර්මස්ථානයක් වූ මුලතිව් මුල්ලියවලෙයි ග්‍රාමයයි. ලෝජිනීව රවටාගෙන එල්.ටී.ටී.ඊ සංවිධානයට බඳවා ගන්නා අතර පුහුණුවෙන් පසු සෝදියා බලකායට අනුයුක්ත කරයි.

සංවිධානය තුළ සිටියදී නොයෙකුත් හැළහැප්පීම් මැද දිවි ගෙවන ලෝජිනී සංවිධානය තුළ සිටි තම හොඳම මිතුරියන්ගේ වියෝවෙන් පසු මරාගෙන මැරෙන සෙබළියක ලෙස පුහුණුවීම් අරඹා එම පුහුණුව සාර්ථකව නිම කරයි. හමුදා ප්‍රහාර හමුවේ කඩා වැටෙන එල්.ටී.ටී.ඊ සංවිධානය අවසාන මාස කිහිපයේදී ලෝජිනී වව්නියාවට සංක්‍රමණය කරවන්නේ ඇගේ මරාගෙන මැරෙන ඉලක්කය ලැබෙන තෙක් එහි සිටින ලෙස දන්වමිනි.

එහිදී ඇගේ බාරකරු වන්නේ සුගන්දන් නම් ඕලන්දයේ සිටින දෙමළ ජාතිකයකු වන අතර දිනෙන් දින සිදුවූ එල්.ටී.ටී.ඊ සංවිධානයේ කඩාවැටීම හමුවේ ඔහුද ලෝජිනී පිළිබඳ සොයා බැලීම නවතා දමයි. ඒ අතර වව්නියාවේදී දැන හඳුනා ගන්නා රූබන් නම් ත්‍රිරෝද රථ රියදුරා සමග ප්‍රේම සබඳතාවයක් අරඹන ලෝජිනී තමන් මරාගෙන මැරෙන සෙබළියක් බව ඔහුට සඟවා ඔහු සමග විවාහ වෙයි. උතුරේ යුද හමුදා ප්‍රහාර දරුණු වීමත් සමග කොටින්ගේ සංවිධාන ජාලය බිඳ වැටීම නිසා ලෝජිනී හා කොටි සංවිධානය අතර සන්නිවේදනයද බිඳ වැටේ. එහිදී LTTE සංවිධානයේ නීතිරීතිවලට පටහැනිව කටයුතු කරමින් ලෝජිනී රූබන් සමග විවාහ වේ. ඒත් සමග හමුදා අත්අඩංගුවට පත්වීමේ අවදානම සමග LTTE විසින් තමාව ඝාතනය කරතැයි බිය සමග ලෝජිනී සිය විවාහ දිවිය ගත කරන්නීය.

මේ අතර කොටි ත්‍රස්තවාදය පරාජය කර ජයගත් රජයේ ඊළඟ අරමුණ වන්නේ සඟවා සිටින අවි ආයුධ හා එල්.ටී.ටී.ඊ. සාමාජිකයින් අත්අඩංගුවට ගැනීමයි. එහි ප්‍රතිඵලයක් ලෙස ලෝජිනීද පොලිස් අත්අඩංගුවට පත්වෙයි. මුලින්ම ගාල්ල වරාය පොලිසියේත්, පසුව රත්ගම පොලිසියේත් ඇයව රඳවා තිබිණි. අත්අඩංගුවට පත්වනවිට ඇය කුලුඳුල් දරුවා බිහිකරන්නට ගැබිගත්තා පමණි. පසුව ඇය ආරක්ෂක අංශවල රැකවරණය මැද්දේ ඒ දරුවා සුවසේ බිහි කළාය.



ලෝජිනී

අද එතැන් සිට....

# පුනරුත්ථාපන කඳවුරේදී ලෝජිනීට තමිලිනී හමුවෙයි



එල්.ටී.ටී.ඊ දේශපාලන අංශයේ කාන්තා නායිකා තමිලිනී

**එතන හිටපු ජ්‍යේෂ්ඨතම කෙනා තමයි තමිලිනී අක්කා අපි සංවිධානයේ ඉද්දි එයා ළඟට ගිහින් කෙළින් කතා කරන්නත් බයයි**

පිටත්ව යාම සඳහා සූදානම් වන ලෙස බන්ධනාගාර නිලධාරීන් පවසා තිබුණේ අධිකරණ තීන්දුවක් ක්‍රියාත්මක කිරීම සඳහාය. ලෝජිනීව වසරක කාලයක් පුනරුත්ථාපනය කර සමාජගත කරන ලෙස ඒ වනවිට ගාල්ල අධිකරණය විසින් නියෝගයක් ලබාදී තිබුණි.

**"අධිකරණ නියෝගය ගැන දැනගත්තාම පුදුම සතුටක් දැනුණා. මොකද රඳවාගැනීමේ නියෝග මත බන්ධනාගාරගත වෙලා ඉද්දි නිදහස් කරන්නෙ කවදාද? නඩු පවරනවද? වගේ කිසිදෙයක් දන්නෙ නැහැ. හැබැයි අවුරුද්දක පුනරුත්ථාපනයට දැම්මා කියන්නේ අවුරුද්දකට පස්සේ ස්ථිරවම නිදහස ලැබෙනවා කියන එක. අනිත් අතට පුනරුත්ථාපන මධ්‍යස්ථානවල බන්ධනාගාරේ තරම් දැඩි නීතිරීතිත් නැහැ. ඒත් අවුරුද්දක් එක හමාරක් විතර ඉඳපු තැන දාලා එද්දි වෙන්වීමේ දුකකුත් තිබුණා. එතැන ඉඳපු සිංහල අය මාව බදාගෙන අඬලා ගමනට සුබ පැතුවා. ගාල්ලෙන් උදේ පිටත්වුණ බන්ධනාගාර බස් එක කොළඹට එද්දි දවල් වුණා. කොළඹින් කෙළින්ම ගියේ වැලිකඩ හිරගෙදරට. එතැන නවත්තද්දි මට හිතුණා හිරගෙදරකින් තවත් හිරගෙදරකට ගෙනාවද කියලා. මගේ මූණ වෙනස් වුණ එක එතැන ඉඳපු ඉන්ධනාගාර නිලධාරියෙකුට තේරුණා."**

**"බය වෙන්න එපා ලෝජිනී. අද දවසට විතරක් වැලිකඩ ඉන්න. මොකද දැන් දවල් වෙලා නිසා වව්නියාවට යද්දි රෑ වෙනවා. වව්නියාව පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ කාර්යාලය හවසට වහනවා. ඒ නිසා ඔයාව භාරදෙන්න ගියාම කරදරයි. ඒ නිසා අද මෙහෙ ඉඳලා හෙට උදෙන්ම යමු."**

බන්ධනාගාර නිලධාරියා පැවසීය. සාමාන්‍යයෙන් බන්ධනාගාර රැඳවියෙකුට මුදල්, රන් ආභරණ, ඉලෙක්ට්‍රොනික උපකරණ හෝ අනවශ්‍ය ලෙස රෙදිපිළි ආදිය සන්තකයේ තබාගැනීමට අවසර නැත. ඒ නිසා බන්ධනාගාරගත වනවිට ඒවා ලේඛනගත කර බන්ධනාගාරයට භාරදිය යුතුය. බන්ධනාගාරයෙන් පිටමං වන අවස්ථාවේදී එම භාණ්ඩ ආපසු භාර දෙයි.

**"රත්‍රං මාලයක්, කරාබු දෙක, මුද්ද, වළල්ලක්, රේඩියෝවක්, ඇඳුම් පැලඳුම්, බබාගෙ සෙල්ලම් බඩු එහෙම තිබුණා. ඒවා ළඟ තියාගන්න බැරි නිසා වැලිකඩ බන්ධනාගාරයේ කාර්යාලයට භාර දුන්නා හෙට උදේට ගන්නම් කියලා.**

**"අපි මේ බඩු භාරගන්නම් හැබැයි හෙට උදේම දෙන්න බැහැ. කාර්යාලය ඇරියට පස්සේ ආයෙත් ගබඩාවෙන් අරගෙන පොත්පත්වල ලියලා භාරදේද්දි උදේ 10 විතර වේවි."** වැලිකඩ බන්ධනාගාර නිලධාරීන් පැවසූහ.

**"වැලිකඩ බන්ධනාගාරයෙන් එහෙම කීවම මාව භාරව ගිය නිලධාරියාට කරන්න දෙයක් නැහැ. එයා ටිකක් වෙලා කල්පනා කරලා කාටදෝ දුරකතනයෙන් කතා කළා. වාහනයට නගින්න කියලා කීවා. ආයෙත් වාහනය පිටත් වුණා. එතකොට දැනගත්තා අනුරාධපුර බන්ධනාගාරයට තමයි යන්නෙ කියලා. එහෙට යද්දි රෑ 11.30 විතර වුණා. එතැන ඉන්න තිබුණෙ පැය කීපයක් නිසා මගේ ළඟ තිබුණු බඩු ගැන ප්‍රශ්නයක් වුණේ නැහැ. පහුවෙනිදා උදේ වව්නියාව අධිකරණයේ විභාග වෙන නඩුවලට අනුරාධපුර බන්ධනාගාරයේ ඉන්න සැකකාරයෝ වගයක් අරගෙන යන්න තිබුණා. මටත් ඒ බස් එකේම වව්නියාවට යන්න කියලා කීවා.**

**මට යන්න තිබුණු පූන්තෝට්ටම් පුනරුත්ථාපන මධ්‍යස්ථානය තිබුණේ නගරයේ ඉඳලා කිලෝමීටර 2-3ක වගේ දුරකින්. ඒ යන අතරමග තමයි මගේ ගෙදර තිබුණේ. මම වව්නියාවට එනවා කියලවත්, පූන්තෝට්ටම් එනවා කියලවත් ගෙදර අය දන්නේ නැහැ. ඒත් බස් එකේ ජනේලය ළඟට වෙලා එළිය බලාගෙන ගියේ. ගේ ඉස්සරහින් යද්දි අත වනන්නම් කියලා හිතාගෙන. ඒත් ගෙදර ඉස්සරහ කවුරුවත් හිටියෙ නැහැ. පුනරුත්ථාපන මධ්‍යස්ථානයට ආවට පස්සෙ එතැනදී ලියාපදිංචි කරන කටයුතු සිද්ධ වුණා. මට ඒ වෙද්දි සිංහල පුළුවන් එක පහසුවක් වුණා. එතැන ඉඳපු හමුදාවේ අයට දෙමළ බැහැ. ඒ නිසා ආරංචිය ගිහින් තිබුණෙ සිංහල පුළුවන් කෙනෙක් ඇවිත් කියලා."**

**රූබන්ගේ සම්බන්ධය එක්ක සංවිධානය අත්ඇරියා කියලා මම කීවේ නැහැ. එහෙම කීවානම් මට පිළිගැනීමක් නැහැ. ඒ නිසා කීවේ ප්‍රහාරයකට ඇවිත් නියෝගය ලැබෙනකල් ඉද්දි යුද්ධය ඉවර වුණා. ඒ අතර මාව අත්අඩංගුවට පත්වුණා. සයනයිඩ් කන්න අවස්ථාවක් ලැබුණෙ නැහැ කියලා**

ඒ වනවිට එල්.ටී.ටී.ඊ. පුනරුත්ථාපන මධ්‍යස්ථාන තුළ වෙනම උප සංස්කෘතියක් බිහිවී තිබුණි. එකම තහනම් සංවිධානයක සාමාජිකයන් වීමේ වරදට පුනරුත්ථාපනය කරනු ලැබුවද ඔවුන් අතරද වෙනම කණ්ඩායම් සෑදී තිබුණි. එමෙන්ම තම රෑනේ සාමාජිකයෙකු පැමිණියා කියා එක්වරම සාදරයෙන් පිළිගැනීමට ඔවුහු මැළිකමක් දැක්වූහ. එයට හේතු පැහැදිලි කළ ලෝජිනී.

**"යුද්ධයේ අවසාන කාලයේදී සංවිධානයට සම්බන්ධ දහස් ගණනක් සාමාජිකයෝ හැමතැනම විසිරිලා ගියා. සමහරු මැරුණා. තවත් සමහරු රට ගියා. සමහරු හැංගුනා. තවත් පිරිසක් හමුදා අත්අඩංගුවට පත්වුණා. ඒ නිසා එක්කෙනාට එක්කෙනා දන්නෙ නැහැ අනිත් කෙනාට මොනවද වුණේ කියලා. මේ වෙන්වුණ අය එක එක තැන්වලින් මතුවෙන සංස්කෘතියක් තමයි තිබුණෙ. මෙහෙම වෙන්වුණ සමහර අය ප්‍රභූවරු හැටියට සමාජයේ ඉහළ තැන්වලින් මතුවෙනවා වගේම කුලීකරුවෝ වගේ දුක්ඛිත, ජීවිත ගත කරන අයත් හමුවෙනවා. ඒ වගේම තමයි පුනරුත්ථාපන කඳවුරේ ඉඳපු සමහර අය සංවිධානයේ අවුරුදු 10-15 සටන්කාමියෝ විදියට ඉඳපු අය. නමුත් හමුදාවට කියලා තියෙන්නේ මාස 6, අවුරුද්ද හිටියා කියලා. සංවිධානය තුළ කෑම උයන ඒවා, රියදුරු වගේ දේවල් කළේ කියලා. ඉතින් එයාලා බයයි අලුතෙන් එන කෙනා බොරු කියපු අයගෙ ඇත්ත විස්තරය දැනගෙන යුද හමුදාවට කියාවි කියලා. ඒ වගේම හමුදා බුද්ධි අංශ එක්ක සම්බන්ධතා තියෙන කෙනෙක්ද කියලා සැකයක් තියෙනවා. මේ වගේ හේතු නිසා කෙනෙක් අලුතෙන් ආපු ගමන්ම ආදරයෙන් පිළිඅරගෙන සේරම දේවල් කියන්නෙ නැහැ.**

**හැබැයි දවස් කීපයක් යද්දි ආශ්‍රය කරලා විශ්වාසය ඇති වුණාම සේරම දේවල් කියලා හොඳට යාළුවෝ වගේ ඉන්නවා. මම පූන්තෝට්ටම් ආපු ගමන්ම බැලුවේ සෝදියා බළකායේ හිටපු අය කවුද ඉන්නෙ කියලා. ඒ වෙද්දි කඳවුරේ සෝදියා බළකායට සම්බන්ධ තුන්දෙනෙක් හිටියා. එයින් එක්කෙනෙක් තමයි ලංකාවේ ප්‍රසිද්ධ එල්.ටී. ටී.ඊ. නායිකාවක් වුණ 'තමිලිනී'. තමිලිනී අක්කා අවුරුදු ගාණක්ම සෝදියා බළකායේ තමයි ඉඳලා තිබ්බුණේ. පස්සේ දේශපාලන අංශයට බැඳිලා කාන්තා අංශයේ නායිකාව වුණා. මම ඉස්කෝලෙ යන කාලයේ අපේ ඉස්කෝලෙට ඇවිත් ළමයි රැස් කරලා දේශන තියෙනවා. අපි පොඩි නිසා නොගියත් මේ දේශන අහලා සංවිධානයට බැඳුන අයත් ඉන්නවා. අනිත් කෙනා තමයි ඉසලිනී කියලා අක්කා කෙනෙක්. එයා සෝදියා බළකායේ මෝටාර් අංශයේ හිටියේ. මම මෝටර් පුහුණුව ලබද්දී එයා මගේ උපදේශිකාවක්. ආශා කියලා කෙනෙක් හිටියා. එයා සෝදියා බළකායේ ආහාර සැපයුම් භාරව හිටියේ. එතන හිටපු ජ්‍යේෂ්ඨතම කෙනා තමයි තමිලිනී අක්කා. පුනරුත්ථාපන මධ්‍යස්ථානය තුළත් එයාට විශේෂත්වයක් තිබුණා. අපි සංවිධානයේ ඉද්දි එයා ළඟට ගිහින් කෙළින් කතා කරන්නත් බයයි. ඒත් එතැනදී අපි සේරම එකයි. මාව අධිකරණයට ඉදිරිපත් කරලා තිබුණෙ මරාගෙන මැරෙන කොටි සාමාජිකාවක් විදියට. ඒ නිසා කට්ටිය අහද්දි මම කීවේ කරුම්පුලි (කළු කොටි) බළකායේ කියලා. මොකද එල්.ටී.ටී.ඊ. සංවිධානයේ තිබුණු සියලුම බළකා අතරින් අංක එකේ පිළිගැනීම තිබුණු බළකාය තමයි කළු කොටි (මරාගෙන මැරෙන) බළකාය. කළු කොටි සාමාජිකයෙක් එද්දි කොටි නායක ප්‍රභාකරන් පවා නැගිටලා ආචාර කරනවා. ඒ නිසා මම කළු කොටි සාමාජිකවක් කීවම පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ හිටපු අපේ අයගෙන් ලොකු පිළිගැනීමක් ලැබුණා. එයාලට ප්‍රශ්නයක් මගේ ජීවිතේ බේරුණේ කොහොමද කියලා. රූබන්ගේ සම්බන්ධය එක්ක සංවිධානය අත්ඇරියා කියලා මම කීවේ නැහැ. එහෙම කීවානම් මට පිළිගැනීමක් නැහැ. ඒ නිසා කීවේ ප්‍රහාරයකට ඇවිත් නියෝගය ලැබෙනකල් ඉද්දි යුද්ධය ඉවර වුණා. ඒ අතර මාව අත්අඩංගුවට පත්වුණා. සයනයිඩ් කන්න අවස්ථාවක් ලැබුණෙ නැහැ කියලා."**

සනත් ප්‍රියන්ත



# අයියාගේ ලොරිය අරන් හයර් දුවන නංගී

# අමරා වාද්දූව

**"ලොරියට ගල්, වැලි, සිමෙන්ති පටවගෙන ගෙවල්වලට ගියාම, සමහරදාට මටම තමයි ඒවා බිමට බාන්නත් වෙන්නේ. ඒ විදියට වැලි කියුබ් ගණන්, ගල් කියුබ් ගණන් මම තනියම බිමට බාලා තියෙනවා. ඒ ඕන දේකට ලෑස්තිවෙලා තමයි මම මේ රස්සාවට ආවේ. ඒ නිසා ඒ දේවල් ගැන මට දුකක් නෑ."**

එසේ කියන්නී අමරා වාද්දූව ය. තමා ලොරි රථ රියදුරුවරියක් බව ඈ කියන්නේ අභිමානයෙනි.

ජාතික සමසමාජ පක්ෂයේ හිටපු ප්‍රබල ක්‍රියාකාරියෙකු වන W.A.පෙරේරා ඇගේ පියාය. ඇගේ දියණියන් දෙදෙනාගෙන් බාල දියණිය මේ දිනවල සමාජ මාධ්‍ය හරහා කාගේත් අවධානය දිනාගෙන සිටින රෝසි උඩුමුල්ලයි.

**"මට මගේ දෙමාපියන්ගෙන් ලැබුණු ලස්සන ජීවිතයක් තිබුණා. ඒත් හිතුවක්කාරෙට කසාදයක් බැඳගෙන මං ඒ ජීවිතේම ප්‍රශ්න පත්තරයක් කරගත්තා. දරුවන්ට නොතේරෙන වයසෙදි එයාලගේ තාත්තව අතෑරලා ගියොත් දරුවෝ මං ගැන වැරදියට හිතන නිසා මට ඉවසන්න වුණා. ඒත් එයාලට හරි වැරැද්ද තේරෙන වයස එද්දි මම වෙනම ජීවත් වෙන්න තීරණය කළා."**

ඇය තම අතීතය මතක් කළේ එලෙසිනි. අමරා ඒ වනවිට සේවය කළේ බාටා සමාගමේය. නමුත් ලේ උරුමයෙන් ලැබුනු දේශපාලන පසුබිම නිසා ඇය 2002 වසරේ බණ්ඩාරගම ආසනය නියෝජනය කරමින් නව වාමාංශික පෙරමුණෙන් මහ මැතිවරණයට ඉදිරිපත් විය.

**"මම නව වාමාංශික පෙරමුණ වෙනුවෙන් ගොඩක් දඩිය මහන්සිය හෙලපු කෙනෙක්. ඒත් පස්සෙ තේරුණා පක්ෂ නායකයෝ අපිට පේන්න වමට සිග්නල් දැම්මට හරවලා තියෙන්නේ දකුණට කියලා. ඒ ඇතිවෙච්ච කළකිරීමත් එක්ක අන්තිමට මම දේශපාලන ගමන එතැනින්ම නතර කළා."**

ඔය කාලය වනවිට බාටා සමාගමේ සේවකයන් සහ පාලන අධිකාරිය අතර සේවක අර්ථසාධක අරමුදල් සම්බන්ධයෙන් උග්‍ර ගැටුම් ඇතිවෙමින් තිබුණි. පසුව තම සහෝදර සේවක සේවිකාවන්ගේ අර්ථසාධක මුදල රැකගැනීමට ඉදිරියට පැමිණ හඬ නැගූ අමරාට සිරබත් කෑමට සිදුවූවා පමණක් නොව වසර 15ක් පමණ කළ රැකියාවද අහිමි වන්නීය.

අමරාගේ පෙරටුගාමී ගති පිළිබඳව ඇස ගසාගෙන සිටි ඇමෙරිකානු රාජ්‍ය නොවන සංවිධානයක් මෙරට සියලුම කාන්තා වෘත්තීය සමිතිවල සභාපතිවරිය ලෙස කටයුතු කිරීමට ඇයට ඇරයුම් කරන්නේ ඔය අතරය. එහෙත් දේශපාලන අතරමැදියෙකු වීමට තිබූ අකමැත්ත නිසා එම තනතුරෙන් ද ඉතාමත් කෙටි කලකින් ප්‍රතික්ෂේප කළ බව ඇය කියයි. පසුව බාටා සමාගමේ රැකියාවෙන් ලද අත්දැකීම් ප්‍රයෝජනයට ගත් අමරා ස්වයං රැකියාවක් ලෙස පාවහන් සාදා විකිණීමට පටන් ගත්තාය.

**රියදුරු රැකියාවේ වසර 12ක පළපුරුදුකාරියක් වන ඇය අදටත් අළුබෝමුල්ල හංදියේ ලොරි රථය 'හයර්' කරන්නී**

**"දරුවො දෙන්නගෙ වැඩයි, ගෙදරදොරේ වැඩයි සේරම කරන ගමන් තමයි සෙරෙප්පු හැදුවේ. පිටකොටුවට ගිහින් ඒවට ඕන කරපු අමුද්‍රව්‍ය ගෙනාවෙත් මම. උදේ ඉඳලා රෑ වෙනකල් සෙරෙප්පු හදලා ඒවා විකුණගන්න මං කඩවල් ගාණේ ඇවිදපු තරම් කවුරුවත් ඇවිදලා නැතිව ඇති."**

ජීවිතය අත්නොහැර සිටින්නට එතරම් උත්සාහ ගත්තත් දෛවය ඒ මොහොතේද ඇයට අකාරුණික වන්නට තීරණය කර තිබුණි.

**"දවසක් සෙරෙප්පු හදල විකුණලා ඇවිත්, මහන්සියට ගෙදර නිදාගෙන ඉඳිද්දී අමුතු විදියට පපුව රිදෙන්න ගත්තා. පස්සේ මං පපුව අතගාලා බලද්දි සබන් කැටයක් තරම් ලොකු ගැටිත්තක් අහුවුණා."**

තමා පියයුරු පිළිකාවට ගොදුරු වී ඇති බව අමරා දැනගත්තේ පසුවද දරුවන්ටද නොකියා රෝහලට ගිය පසුය.

**"එදා හොඳටම වැස්ස දවසක්. දෙස්තර මහත්තයා පියයුරු පිළිකාවක් කියලා කිව්වට පස්සේ මම වැස්සේ තෙමීගෙනම රෑ කඩේකට ගිහිල්ලා කහට තේ එක්ක බිව්වා. ඒ වෙලාවේ මට දරු දෙන්නව මතක් වුණා. මගේ හිත කිව්වෙම 'වැටෙන්න එපා දරුවො වෙනුවෙන් උඹ නැගිටපන්' කියලා."**

පසුව වෛද්‍යවරුන්ගේ නිර්දේශය මත ඇයට පියයුරු දෙකම ඉවත් කිරීමට සිදුවිය.

**"ඊටපස්සේ මම පිළිකාවක් තිබුණා කියන එක අමතක කරලා දාලා ජීවත් වුණා. දිගින් දිගටම සායනවලට එන්න කිව්වට මට ඒ ටික කරන්න පුළුවන් වුණේ මුල් කාලේ විතරයි. මොකද දරුවො දෙන්නව දාලා ගිහින් පිළිකා රෝහලේ ඇඳක් උඩට වෙලා ඉන්න පුළුවන්කමක් මට තිබුණේ නෑ."**

රෝහල්ගත වී ප්‍රතිකාර ගත් කාලය අතරතුර දුක් මහන්සියෙන් ගොඩනගාගත් ස්වයං රැකියාවද කඩාවැටී තිබිණි. කොතරම් බාධක පැමිණියද අමරා ජීවිතය අතහැරීමට සූදානම් වූයේ නැත. කරන්නේ කුමක්දැයි කල්පනා කරමින් සිටියදී අමරාගේ මතකයට එන්නේ අයියාගේ ලොරි රථයය.

**"අන්තිමට මම අයියගෙන් ලොරිය ඉල්ලගෙන 'හයර්' කියලා බෝඩ් එකක් එල්ලගත්තා. පස්සේ අළුබෝමුල්ල හංදියට ගිහින් හයර් ලැබෙනකල් බලාගෙන හිටියා. ඇත්තටම මං බලාපොරොත්තු වුණු විදියටම හයර් ලැබුණා. ගල්, වැලි කියුබ් ගණන් හාඩ්වෙයාර්වලින් පටවගෙන ගෙවල්වලට ගිහින් දලා තියෙනවා. සමහර වෙලාවට සිමෙන්ති කොට්ට කරේ තියාගෙන අරන් ගිහින් ලොරියට දගත්තු වෙලාවල්, ලොරියෙන් බිමට බාපු වෙලාවල් තියෙනවා."**



**මම පිළිකාවක් තිබුණා කියන එක අමතක කරලා දාලා ජීවත් වුණා. දිගින් දිගටම සායනවලට එන්න කිව්වට මට ඒ ටික කරන්න පුළුවන් වුණේ මුල් කාලේ විතරයි.**

නමුත් ඇය කිසිමවිටෙක එය කරදරයක් හෝ අභියෝගයක් ලෙස සැලකුවේ නැත.

රියදුරු රැකියාවේ වසර 12ක පළපුරුදුකාරියක් වන ඇය අදටත් අළුබෝමුල්ල හංදියේ ලොරි රථය 'හයර්' කරන්නීය.

**"අද වෙනකොට මගේ දුවලා දෙන්නටම උපාධිය දක්වාම අධ්‍යාපනය ලබාදීලා තියෙනවා. දුවලා දෙන්නටම ගෙවල් දෙකක් හදලා දීලා ලොකු දුවව විවාහ කරලා දීලත් ඉවරයි. මගේ පොඩි දුව රෝසි.**

**එයා ඉපදෙනකොට ගොඩක් අඩුපාඩුත් එක්ක ඉපදුණ දරුවෙක්. දෙස්තර මහත්තරු එයාව මගේ අතට දීලා කිව්වා එයා දවස් තුනකට වැඩිය ජීවත්වෙන්නේ නෑ කියලා. මට මතකයි ඒ වෙලාවේ මම දෙස්තර මහත්තුරුන්ට කිව්වා මම කොහොමහරි මගේ දරුවව දවස් තුනකට වඩා ජීවත් කරලා පෙන්නනවා කියලා. කිව්ව විදියටම අද වෙනකොට මම එයාව අවුරුදු විසිපහක් ජීවත් කරවලා තියෙනවා. මේ වෙනකොට එයාට සැත්කම් විසි ගානක් කරලා, ඉපදෙනකොට හිටියට වඩා ගොඩක් සාමාන්‍ය අතට පත්කරගෙන තියෙනවා. තරුණ කාලේ පවුල් ජීවිතය අසාර්ථක වුණාට පස්සේ මටත් ගොඩක් පිරිමින්ගේ ඇල්ම බැල්ම වැටිලා තියෙනවා. ඒත් මම කවදාවත් වැරදි තීරණයක් ගත්තේ නෑ. ඒ නිසා අද ජීවිතේ සැඳෑ සමය (63) මේ විදියට සැනසීමෙන් ගෙවන්න මට පුළුවන්."**

ලිහිණි මධුෂිකා




# Collar එක සහිතව Princess Line Blouse එකක් මහමු

පාඩම් අංක 26

## Princess Line Blouse (Collar එක සහිතව)



1 රූපසටහන

## Blouse එක සඳහා අවශ්‍ය මිමි

01. ඉදිරිපස කර ගැඹුර (කර මුලත් පපුව නොපෙනෙන ප්‍රමාණයත් අතර මැද දක්වා අරගන්න) .........
02. Cup Point එක දක්වා උස ...........
03. ඉන දක්වා උස .........................
04. සම්පූර්ණ උස .........................
05. කර පළල .........................
06. උරහිස .........................
07. අත දිග .........................
08. අත් කට .........................
    - ✦ අත් රවුම .........................
    - ✦ අත ඉහළ කොටස ..............
09. පපුව .........................
10. Cup දෙක අතර පරතරය ............
11. ඉන .........................
12. උකුල .........................

## Blouse එක කැපීමට අවශ්‍ය මූලික මිනුම්

(1 වගුව බලන්න)

## Back - පිටුපස

(2 රූපසටහන බලන්න)

01. පළමුව කළ යුත්තේ මිමි සාදගැනීමය. මෙහිදී වගුව අනුව සාමාන්‍ය Blouse එකේ ආකාරයට මිමි සුළු කරගන්න.

02. Princess Line එක ඇඳගැනීමෙන් පසු පිටුපස සහ ඉදිරිපස මැද සහ පැති වශයෙන් එක් පලුවක් කොටස් 2කට වෙන්කරනු ලැබේ.
නැවත එම කොටස් 2 එකිනෙකට තබා මසාගැනීමේදී මැහුම් වාසිය 1/2ක් බැගින් පලු දෙකටම අඟල් 1ක් අවශ්‍ය වේ. එම නිසා සාදගත් මිමි අතරින් අත් රවුමට, පපුවට, ඉනට සහ උකුලට නැවත අඟල් 1 බැගින් එකතු කර එක් පලුවක් සඳහා අරගන්න.

03. මිමි සාදගත් පසු එම මිම්වලට අනුව සාමාන්‍ය Blouse එකේ පිටුපස පලුව සාදගත් ආකාරයටම මේ සඳහා පිටුපස පලුව සාදගන්න.

04. Princess Line එක ඇඳගැනීම සඳහා අත් රවුමේ ස්ථානය ලකුණු කර ගැනීමේදී උරහිසේ පහල කෙළවරේ සිට අත් රවුමේ කෙළවර දක්වා රේඛාවක් ඇඳ එම රේඛාවේ දුර මැන එය 2න් බෙදා මැද ලකුණු කරන්න. පසුව එම ස්ථානයේ සිට අංශක 90ට රේඛාවක් අත් රවුම දක්වා ඇඳීමෙන් අත් රවුම කැපෙන ස්ථානය Princess Line එක අත්රවුමේ රේඛාව හරහා යන ස්ථානය ලෙස සළකුණු කරන්න.

05. Cup Point එක ලකුණු කර එම ස්ථානයේ සිට තවත් අඟල් 1/2ක් ඉදිරිපස ලකුණු කරන්න. එම ස්ථානය හරහා යන පරිදි Princess Line එක අඳින්න.

06. ඉන රේඛාව මත ඇති දුර 2න් බෙදා එහි මැද ලකුණු කර එතැන් සිට තවත් අඟල් 1/2ක් නැම්ම දෙසට ලකුණු කර එම ස්ථානයෙන් යන පරිදි Princess Line එක ඇඳගත යුතුය.

07. ඉහත පිටුපස රූපසටහනේ පරිදි ඉන මත ඇති Aවල අගය මැනගෙන එම ප්‍රමාණයට තවත් අඟල් 1ක් එකතු කර නැම්මේ සිට හරස් අත පැත්තට උකුලේ රේඛාව මත ලකුණු කරන්න. එම ස්ථානය Princess Line එක උකුල හරහා යන ස්ථානය වේ.

08. ඉහත කරුණුවලට අනුව අදාළ ස්ථාන ලකුණු කර එම ස්ථාන හරහා යන පරිදි රූපසටහන බලා Princess Line එක අඳින්න.

09. මැද සහ පැති කොටස තබා මැසීමේදී පැති කොටසින් දුර අඩුවෙයි. එම නිසා මැද කොටසේ මැහුම් රේඛාව දිගේ යට සිට අත් රවුම දක්වා දුර මැනගෙන එම ප්‍රමාණය පැති කොටසේ මැහුම් රේඛාව දිගේ යට සිට ඉහළට ලකුණු කර එම ස්ථානයට නැවත පැති කොටසේ අත්රවුමේ රේඛාව අඳින්න. මෙහිදී පෙර අඳින ලද පැති කොටසේ අත් රවුමේ රේඛාවේ දුර මැනගෙන එම දුරට සමාන වන පරිදි පසුව අඳින ලද පැති කොටසේ රත් රවුමේ රේඛාව ඇඳිය යුතුය. දුර සමාන කිරීමේදී පසුව අඳින අත් රවුමේ රේඛාවේ හැඩය ගැනද සැළකිලිමත් වන්න.

10. වාටිය කවාකාර ලෙස හැඩ කරගැනීමේදී වාටියේ රේඛාව මත ඇති දුර 2න් බෙදා එහි මැද ලකුණු කර අංශය පැත්තෙන් උඩට උස්සන ප්‍රමාණය වාටියේ රේඛාවේ සිට ඉහළට ලකුණු කර එම ස්ථානයේ සිට වාටියේ රේඛාවේ මැද දක්වා හැඩ කර රූපසටහනේ පරිදි අඳින්න.


| | | | | |
|---|---|---|---|---|
| පිටුපස කර ගැඹුර | | $^3/_8$ | $^1/_2 - ^5/_8$ | $^5/_8 - ^3/_4$ |
| කර පළලට එකතු කරන ප්‍රමාණය | | $^3/_4$ | 1 | 1 |
| උරහිස බෑස්ම | | $^3/_4$ | 1 | $1\,^1/_4$ |
| පපුවට එකතු කරන ප්‍රමාණය | | $1\,^1/_2$ | 2 | $2\,^1/_2$ |
| ඉණට එකතු කරන ප්‍රමාණය | | 1 | 1 | 1 |
| උකුලට එකතු කරන ප්‍රමාණය | උකුල දක්වා උස ගත් විටදී | $2\,^1/_2$ | 3 | $3\,^1/_2$ |
| | උකුලට පහලින් උස ගත් විටදී | 6 | 7 | 8 |
| ඉදිරිපස හා පිටුපස කවාකාර වාටියේ උස | | $^1/_4$ | $^1/_4$ | $^1/_4$ |
| අත් කටේ වාටියේ උස | | $^1/_2$ | $^3/_4$ | 1 |
| අත් කටට එකතු කරන ප්‍රමාණය | | 1 | $1\,^1/_2$ | 2 |
| වාටියේ පැත්තෙන් උඩට උස්සන ප්‍රමාණය | | $2\,^1/_2$-3 | 3- $3\,^1/_2$ | $3\,^1/_2$ - 4 |
| අත්රවුම 1/2 ක් සඳහා පපුවේ මිම්ම ඇගේ ගානට අරගෙන එය 4ට බෙදූ පසු Cup එක අනුව අඩු කරන ප්‍රමාණය<br>Cup එක | | අඩු<br>1 | සාමාන්‍ය<br>$1\,^1/_2$ | වැඩි<br>2 |
| අත ඉහල කොටස 1/2 ක් සඳහා අත්රවුමේ මිනුමෙන් අඩුකරන ප්‍රමාණය | | $^1/_2$ | $^1/_2$ | $^1/_2$ |
| බොත්තම් වාසිය | | $^1/_2$ | $^5/_8$ | $^3/_4$ |
| ඇතුලට නැවෙන ප්‍රමාණය | | 1 | $1\,^1/_4$ | $1\,^1/_2$ |

(1 වගුව)

## Front - ඉදිරිපස

(3 රූපසටහන බලන්න)


01. ඉදිරිපස පලුව නිර්මාණය කරගැනීමේදී පළමුව ඔබ පිටුපස පලුව මතම ඉදිරිපස අත් රවුම ඇඳගන්න. මෙහිදී පිටුපස පලුව මත ඇති පපුවේ රේඛාව සහ උරහිසේ රේඛාව අතර පරතරය මැනගෙන එම ප්‍රමාණය පිටුපස අත් රවුමේ යට සිට ඉහළට ලකුණු කර එතැන් සිට පහලට ඉදිරියට අත් රවුම හැරීම සඳහා අවශ්‍ය ප්‍රමාණය පරතරය අනුව තෝරාගත යුතුය. මෙම මෝස්තරයේදී පපුවේ 1/4 කොටසට මැහුම් වාසිය සඳහා 1ක් එකතු කර ඇති නිසා පරතරයෙන් එම ප්‍රමාණය අඩුකර එන අගයට ඉදිරිපස අත් රවුම හාරන්න.




3 රූපසටහන

02. ඉදිරිපස මැද විවරය සඳහා ඇතුළට නැවෙන ප්‍රමාණයට සහ බොත්තම් වාසිය රෙද්දේ වාටියේ සිට හරස් අත පැත්තට ලකුණු කර ඒ හරහා එම ප්‍රමාණ රෙද්දේ දික් අත පැත්තට වෙන් කරගන්න.

03. ඇඳගත් බොත්තම් වාසියේ රේඛාව මත පිටුපස පලුවේ නැම්ම තබා උරහිසේ ඉහළ ස්ථානය, පහල ස්ථානය, ඉදිරිපස අත් රවුම සහ Princess Line එක පිටපත් කරගන්න. පසුව පිටුපස පලුවේ ප්‍රමාණයට යට සහ අංශය අත්රවුම දක්වා කපාගන්න.





4 රූපසටහන

04. ඉදිරිපස කරේ මෝස්තරය සඳහා ෂර්ට් කර හෝ V කරේ කවාකාර හැඩය දමන්න.

05. ඉදිරිපස කරේ ගැඹුර සඳහා කරමුලත් පපුව නොපෙනෙන ප්‍රමාණයත් අතරමැද දක්වා ලබාගත් මිම්ම උරහිසේ ඉහළ ස්ථානයේ සිට පහලට ගෙන කරේ මෝස්තරය ඇඳගන්න.

06. ඉහත රූපසටහනේ ඇඳ ඇත්තේ ෂර්ට් කරය. ඔබට අවශ්‍යනම් V කරේ කවාකාර හැඩය ඇඳගන්න.

07. ඉදිරිපස පලුව සඳහා පිටපත් කරගත් Princess Line එක අනුව මැද සහ පැති කොටස් වශයෙන් කොටස් 2කට වෙන්කර එම කොටස් දෙක එකිනෙකට තබා මසාගැනීමේදී පැති කොටසෙන් දුර අඩුවෙයි. එම නිසා මැද කොටසේ දුරට පැති කොටසේ දුර සමාන කළ යුතුය. මෙහිදී ඔබ කළ යුතු වන්නේ ඉදිරිපස මැද කොටසේ දුර මැනගන්න. වාටියේ රේඛාවේ සිට ඉදිරිපස අත්රවුම දක්වා මැහුම් රේඛාවේ දිගේ මනින්න. එම දුරද පැති කොටසේද වාටියේ සිට මැහුම් රේඛාව දිගේ ඉහළට ලකුණු කරන්න. පසුව එම ස්ථානයට ඉදිරිපස පැති කොටසේ අත්රවුමේ රේඛාව නැවත අඳින්න. මෙහිදී පෙර ඇඳ ඇති ඉදිරිපස අත්රවුම් පැති කොටසට අයිති ප්‍රමාණයේ දුර මැනගෙන එම දුරින් අඟල් 1/4ක් හෝ 3/8ක් අඩුවෙන පරිදි නැවත අඳින ලද පැති කොටසේ අත්රවුමේ රේඛාව අඳින්න.



2 රූපසටහන

## Sleeve - අත

(4 රූපසටහන බලන්න)

මෙම මෝස්තරය සඳහා සාමාන්‍ය අත හෝ ඔබ කැමති අත් මෝස්තරයක් දැමිය හැක. කුමන අත් මෝස්තරයක් දැම්මත් තෝරාගත් අත් මෝස්තරය නිර්මාණය කරගැනීමේදී අතේ අත් රවුම සඳහා පිටුපසේ පලුවේ ඇඳ ඇති පිටුපස අත්රවුමේ රේඛාව දුර මැනගෙන එම දුරින් අඟල් 1ක් අඩුකර එන අගයට අතේ රත් රවුම අඳින්න. ඊට හේතුව වන්නේ පිටුපස පලුවේ අත් රවුම ඇඳ ඇත්තේ මැහුම් වාසිය සඳහා අත්රවුමේ අගයට අඟල් 1ක් වැඩිපුර එකතු කරයි. එය මැද සහ පැති කොටස එකිනෙකට තබා මැසූ පසු අඩුවෙන නිසාය.



ප්‍රවීණ ඇඳුම් මෝස්තර නිර්මාණ පුහුණු දේශක සහ බතික් කලාව පිළිබඳව පුහුණු දේශක
චමින්ද කුමාර
You tube - Smart Fashion Lanka

## පාඩම් අංක 06

**හිතේ හයියෙන් ජීවිතය දිනන්න කැමති කොයිකාටත් අතහිත දෙන්න 'ධරණී' හැමදාමත් කැමතියි. නිකරුණේ ගෙවිලා යන කාලය තමන්ගේම කියලා ස්වයං රැකියාවක් වෙනුවෙන් යොදවන්න කැමති කාන්තාවන්ට ගෙදරදී පහසුවෙන්ම අත්කම් නිර්මාණ කරන හැටි පියවරෙන් පියවර කියලා දෙන්න අපි හිතුවේ ඒකයි. කඩදාසි, මැටි, පොල්කටු, රෙදි වගේ විවිධ දේ වලින් විවිධ නිර්මාණ කරන විදිය ගැන සහ ඒවා වෙළඳපොළ වෙත යොමුකරන ආකාරය ගැන මේ ලිපි මාලාව හරහා ඔබව දැනුවත් කරනවා. ඉතින් ස්වයං රැකියාවක් විදියට කෘත්‍රිම බේබි රෝස මලක් හදාගන්න හැටි අද බලමු.**

## ස්වයං රැකියා

**ජාතික ශිල්ප සභාවේ අලෙවිපොළවල් හරහා වගේම ලක්සැල හරහාත් මේවා අලෙවි කරන්න හැකියාව තියෙනවා.**

# ආස විදියට ජීවත් වෙන්න රෝස මලකින් උදව් ගනිමුද?


01


02


03


04


05


06

බේබි රෝස මලේ නිජබිම තමයි ජපානය. ඒ නිසාම බේබි රෝසවලට ජපන් රෝස කියලත් කියනවා. ඒ අරුණාම අපේ උදවිය නම් මේ මලට දවල් කුමාරි කියලත් කියනවා.

කොහොමවුණත් නමට රෝස කියලා කෑල්ලක් තිබුණාට මේක ඇත්තටම රෝස මලක් නෙමෙයි. මේ මල වගේම ශාකයත් රෝස ගසෙන් සම්පූර්ණයෙන්ම වෙනස්.

බේබි රෝස මල ශාක දෙමුහුන්කරණයක ප්‍රතිඵලයක්ලු. ඉතින් ඒ නිසා මේ මලට ලොකු ඉතිහාසයක් නැහැ.

හැබැයි මේ මලේ තියෙන ලස්සනයි සුවඳයි නිසා සමනල්ලු, බඹරුන් වගේ සත්තුන්ගේ ආකර්ශනය නම් අඩුවක් නැතුව ලැබෙනවා. ඒ නිසා ඒ වගේ සත්තු ගෙවත්තට ගෙන්නගන්න ආස උදවියත් වැඩිපුර මේ මල් ගෙවත්තේ හිටවනවා. හැබැයි කෘමි ආකර්ශනය වැඩි නිසා වදයක් වෙන තරමටම සමහර රටවල ජපන් රෝස මල් බෝ වෙලා. ඒ නිසා සමහර රටවල්වල මේක තහනම් මලක්. අධිවේගී මාර්ගවල නිතරම යන අයට නම් ජපන් රෝස මල හරි හුරුපුරුදුයි. අපේ රටේ විතරක් නෙමෙයි ලෝකේ බොහෝ රටවල අධිවේගී මාර්ග දෙපස මේ මල් හිටවනවා. ඒකට හේතුව තමයි ජපන් රෝස පැළයට තියෙන පාංශු ඛාදනය වැළැක්වීමේ හැකියාව.

හරි. එහෙමනම් ඉතින් ජපනුන්ගේ ජපන් රෝස මල හදලා පෝසතෙක් වෙන්නේ කොහොමද කියලා අද අපි බලමු.

වැඩේට කපුරෙදි මීටරයක්, කම්බි මීටර දෙකක්, ගම්ටේප්, සව් ග්‍රෑම් පනහක් වගේම රෙදි පාට කරන ඩයි ටිකකුත් හොයාගන්න. මේ මලත් රෝස, රතු, කහ, සුදු ඇතුළු පාට කිහිපයකින්ම තියෙන නිසා මල හදන්න ඔයා කැමති පාටක් ගන්න පුළුවන්.

ඕනම මලක් හදද්දී කරන්න ඕන මුල්ම වැඩේ තමයි රෙද්ද කැඳ කරන එක. සව් ටික වතුර ලීටරයකට දාලා හොඳට ඝනකම් වෙන්න උණු කරලා කපු රෙද්ද ඒකට ඔබ්බවලා තමයි ඔය රෙද්ද කැඳ කරන වැඩේ කරගන්නේ.

### 1 පියවර

මුලින්ම රූපයේ පේන විදියට මලේ බ්ලොක් එක කපාගන්න.

### 2 පියවර


දැන් කැඳ කරපු රෙද්දේ අර කපාගත්තු බ්ලොක් එක තියලා මල් පෙති කපාගන්න. එක මලකට මේ වගේ පෙති තුනක් විතර අවශ්‍ය වෙනවා.

### 3 පියවර

දැන් කරන්න තියෙන්නේ පෙති ටික පාට කරගන්න එක. සමහර බේබි රෝස මල් තියෙනවා එකම මලේ පාට දෙකක් තියෙනවා. ඉතින් කැමති නම් ඒ විදියට මල් පෙති පාට කරගන්න පුළුවන්.

### 4 පියවර

මල් පෙති නවන ටූල් එකකින් හරි අතින් හරි මල් පෙති ටික නවාගන්න ඕනේ. මල් පෙති දෙකක් පහලටත් එකක් උඩටත් හිටින විදියට මේ පෙති නවාගන්න ඕනේ.



### 5 පියවර

කම්බියකට ගම්ටේප් හරි කොළ පාට සව් කොළ හරි අලවගෙන කම්බිය උඩින් පුංචි රේණුවක් හදාගෙන අපි හදාගත්තු මල් පෙති ටික ඒකට අමුණාගන්න.

### 6 පියවර

දැන් මලට නටුවක් එකතු කරගන්න ඕනේ. රූපයේ පේන විදියට කොළ කපාගෙන මලේ කොළ හදාගන්න.

දැන් තියෙන්නේ මල් ටිකයි, පෙති ටිකයි එකට අමුණාගන්න එක. මේ එක පොකුරකට මල් 15ක් 20ක් අමුණාගන්න ඕනේ.

ඔහොම හදන මල් පොකුරක් රුපියල් 300-400කට විකුණාගන්න පුළුවන්. ජාතික ශිල්ප සභාවේ අලෙවිපොළවල් හරහා වගේම ලක්සැල හරහාත් මේවා අලෙවි කරන්න හැකියාව තියෙනවා.

ජාතික ශිල්ප සභාවේ මීරිගම මල් සැකසුම් මධ්‍යස්ථානයෙන් නොමිලේම හදාරන්න පුළුවන් මල් සැකසුම් පාඨමාලා ගැන දැනගන්න අවශ්‍ය කෙනෙක් ඉන්නවා නම් 077 524 27 45 අංකයට කෝල් එකක් දෙන්න.



අත්කම් නිර්මාණ උපදේශිකා
ශ්‍රියානි පුෂ්පලතා
ජාතික ශිල්ප සභාව

නදීශා නිර්මාණී



## රූපලාවන්‍ය උපදේශිකා - Beauty Advisor

වෙනසක් සොයන තරුණි ඔබට ජාත්‍යන්තර සමාගමකට අනුබද්ධ ආයතනයක රැකියා අවස්ථාවක්.

වයස අවු : 20-30 අතර තරුණියන් සඳහා ජාත්‍යන්තර රූපලාවන්‍ය නිෂ්පාදන අලෙවි කිරීමට ( Beauty Advisor ) බඳවා ගැනීම ආරම්භ කර ඇත.

මාසිකව රු 40,000/= වැඩි ආකර්ෂණීය ආදායමක් ( කොළඹ, නුවර, කුරුණෑගල, කෑගල්ල, කළුතර, මාතර, ගාල්ල, අනුරාධපුර, යාපනය. විශේෂයි. )

විමසීම් : 071-7725098 - ලක්ෂි

## උකස් රන් භාණ්ඩ

බේරාදී වැඩිම මිලට මිලදී ගනු ලැබේ.

බොරු නැත

රජයේ ලියාපදිංචි ආයතනයකි.

කැරට් 22, 21, 20, 18,14, 09.

077 28 49 889

SL PROMO

## උකස් රත්තරං

ඔබ උකස් කළ ආයතනයට පැමිණ පවුමකට 125,000 ගෙවනු ලැබේ.

ඉතිරි මුදල ඔබ අතට

077 - 310 9112

කර්තෘ, 'ධරණී' පුවත්පත
ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්
අංක 91, විජේරාම මාවත, කොළඹ 07.

දුරකතන: 0115 200 900
ෆැක්ස් : 0112 673 451
ඊ මේල් :
dharanee.editor@liberty.lk

දැන්වීම් :
0112 672601,
0112 672603
ෆැක්ස් :
0112 672648

බෙදාහැරීම් :
0115 9 78987,
0115 886186
ෆැක්ස් :
0112 455134

## වාණිජ බැංකු ඇබෑර්තු

★අලුතින් විවෘත වූ නව බැංකු ශාඛා කිහිපයක විවිධ තනතුරු සඳහා අයදුම්පත් කැඳවේ.

★අවම සුදුසුකම් O/L වේ.

★වැටුප් සමග පුහුණුව.

★රැකියාව තම ප්‍රදේශයටම.

වැටුප 35,000/-

18/40 ගැ/පි

(මෑන් පවර් නොවේ)

0702 231 694 | 0718 853 997
0712 564 715 | 0774 024 155
0705 244 099 | 0702 725 731

## ග්ලූකෝමා ඇතුළු සියලු ඇස් රෝග සඳහා ප්‍රතිකාර



පාරම්පරික අක්ෂි වෛද්‍ය

**බන්දු ලන්දෙගෙදර**

ලන්දේ ගෙදර වෙද පියස

ගැළණිගම අධිවේගී පිවිසුම් මාර්ගය අභියස, බණ්ඩාරගම.

071 141 3348 / 071 894 1027 / 038 225 6454

ප්‍රතිකාර කරන වේලාවන් උදෑසන 9.00 සිට සවස 7.00 දක්වා

Search on Youtube Dr. Landegedara

## අධික තරබාරුව හා අධික කෙට්ටුවීම

සඳහා වෛද්‍ය ප්‍රතිකාර

ප්‍රවීන වෛද්‍යවරියකගෙන්

සෙත් රෝහල - හෝමගම

සක්යා - මාතර

0113 031 717 / 0112 748 808 / 070 387 6241

## හෙදියන්

බඳවා ගනු ලැබේ (OPD)

- පළපුරුදු හෙදියන් වැටුප 35,000/-
- පුහුණු හෙදියන් වැටුප 30,000/-
- කැෂියර් - ලිපිකරු වැටුප 20,000/-

පුහුණුවට බඳවා ගනු ලැබේ.

දීමනාව 10,000/- නවාතැන් පහසුකම් ඇත.

සහන රෝහල
663/2, නුවර පාර,
කැලණිය.

011-29 16 344
071-48 15 387

## ජන සන්නිවේදනය (Media)

## 2023 - A/L

නව පන්ති ආරම්භය 2022-02-05 දින ආරම්භ වේ. Zoom හරහා පැවැත්වේ. සතියට දින දෙකක් පන්ති පැවැත්වේ.

වැඩි විස්තර සඳහා අමතන්න.

077 - 2 366 908 / 076 - 6 579 548

ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට නොමිලේම සේවාවක් ඔබට ලබාදෙන රජයේ ලියාපදිංචි එකම ආයතනය

## ජයසිකුරු මංගල සේවය



නො. 130 CD, නුවරපාර, මිරිස්වත්ත, ගම්පහ.

ශ්‍රී ලාංකික ඔබ කුමන තරාතිරමක වුවද සහකරුවෙක් හෝ සහකාරියක් බලාපොරොත්තුවෙන් දිවයිනේ කොතනක හෝ දිවයිනෙන් බැහැරව විදේශගතව සිටියද ඔබට ගැලපෙන සහකරු හෝ සහකාරියගේ තොරතුරු ඡායාරූප සහිතව ඒ මොහොතේම ඔබ අතට ලබාදීමට අපි සූදානම් !!!

දැන්ම අමතා ලියාපදිංචි වන්න

070 506 6555
076 336 33 96
033 221 57 61

රජයේ ලියාපදිංචි අංකය WK16905

ලියාපදිංචිය නොමිලේ

ඔබගේ විවාහ සිහිනය සැබෑවෙනු දකින් අපගේ එකම පැතුමයි.

## මෙවර සාමාන්‍ය පෙළ / උසස් පෙළ / ශිෂ්‍යත්වය ඇතුළු සියලුම විභාගවලින්

**විශිෂ්ට ජයග්‍රහණ ලබා ගැනීම සඳහා පැමිණ හමුවන්න.**

නැතහොත් ලිපියක් මගින් විමසන්න. (පූජා භාණ්ඩ ඔබ විසින් සැපයිය යුතුයි.)

## ප්‍රේම සබඳතා බිඳවැටෙන්නේ ඇයි? ව්‍යාපාර/ගේ දොර පාළු වී යන්නේ ඇයි? අයුතු සම්බන්ධතා නිසා පවුල් අවුල් වන්නේ ඇයි?

## මෙන්න!

එයින් මිදෙන්න නිසි මඟක්...

අයුතු සම්බන්ධතා නැවතීම

* නිවාස ආරක්ෂා
* නඩුහබ දිනීමට
* දරුඵල ලබීමට

මත්කුඩු සහ සුරාව

* රැකියා ලබා ගැනීමට
* සියලු විභාග සඳහා
* නොවිසිනෙන ඉඩම් විකිණීමට

*විවාහ පමා අයට
*නැරගිය අය ගෙන්වීම
*අසාර්ථක ව්‍යාපාර දියුණුවට

# මාතර වෙද හාමුදුරුවෝ

ඔබ කුමන හෝ මත්ද්‍රව්‍යයකට

**ඇබ්බැහි වූ අයෙක් ද?**

එසේ නම් ඉන් මිදීමට අමතන්න.

වරු තුනෙන් ප්‍රතිඵල පැමිණ හමුවන්න


අමතන්න 077 362 77 14

හමුවීම
බදාදා, සෙනසුරාදා
පෙ.ව. 8.00 සිට
ප.ව. 3.00 දක්වා

කුරුණෑගල, පොතුහැර
චන්ද්‍රසේල පිරිවෙන්
පුරාණ විහාරයේදී

ශාස්ත්‍රවේදී පණ්ඩිත **මාතර වෙද හාමුදුරුවෝ**

භාරකාරතුමා, ජනසෙත වෙද මැදුර, චන්ද්‍රසේල පිරිවෙන් විහාරය, කොළඹ පාර, පොතුහැර, කුරුණෑගල, පොතුහැර චන්ද්‍රසේල පිරිවෙන් පුරාණ විහාරයේදී



## නිවසේ මිණි පහන

උස් මහත් වෙද්දී ගෙයි දුව පැන්න පොඩි    පුතා
ගැස්සේවි හිත තුටින් හිත වෙවී නෙක    කතා
වස්සානෙ අත ළඟයි කඳුළ අහලක    නැතා
ලස්සනයි හෙට දවස ලෝකයම මගෙ    පුතා

හිස් බවක් නෑ හිතේ ලස්සනයි    මනහරයි
දිස්වෙනා ඒ දෙනෙත පින්බරයි    සිත්කලුයි
ඇස්වහක් කටවහක් හීනෙකින්වත්    නොවෙයි
තිස් තුනක කෝටියක් දෙවියො මගෙ පුතු    රකියි

ගස් ගලට ඔට්ටු වෙන්නට තරම්    ශක්තියක්
දස්කමට මගෙ පුතුගෙ හිතේ ඇත    භක්තියක්
ලස්සනට ඇන්ද විට දකින්නට    සිත්තමක්
රැස් කරන්නට පිනට හිතයි හිත පිං    කතක්

ගස්සනා ඔරවනා පුතුන් ඇති    ලෝකයක
තිස්සේම මට දැනෙයි නිමිති නෑ    ශෝකයක
අස්වස්සමින් හිත පාට පිරි    ලෝකයක
තිස්සේම පුතු හිඳියි මගේ හැම    හීනයක

● **දීපිකා ප්‍රියදර්ශනී ප්‍රනාන්දු**
**මොරටුව විල්ලෝරාවත්ත**

## මෙහෙණියකගේ සිතිවිලි

හිමි වී අහිමි වී ගිය සෙනෙහස    හින්ද
පැතුම් මල් පොකුරු මිලිනව ඉකි    බින්ද
සසරේ පෙර පතාගෙන ආවද    මන්ද
යොවුන් විය කසාවතකට පෙම්    බැන්ද

නිහඬ පරිසරය හද තත් පිරි    මදින
කුරුලු කූජනය බොදු ගී හඬක්    මෙන
ජීවිතයේ අරුත්සුන් බව කියා    දෙන
ලොකු මෑණියන් ලැබ දෙයි නියත    විවරණ

පෙර දිනයක පෙම් කළ ඔබට කිසි    ලෙස
නොකරමි ද්වේෂ සහ පිවිතුරු මලක්    ලෙස
සසර කෙටි කරන පැහැදිලි මගට    බැස
අපමණ සුවය ලබනෙමි මම නිරා    මිස

● **ලීලා කරුණානායක**
**හමන්ගල්ල**

## දෑස නිදනතුරු

සීත සුළං රැල් සමග - දඟ කරමින්
පාවී යන ඒ සේද මීදුම් සළුවක්
රඳවාගෙන දෝතින් තුරුලුකොට
සුළඟේ විහිදු පවනින් පතිත
නෙක පාට මල් පෙති අහුලා
සරසවා ගතිමි සේද සළුව
දැවටුවා නුඹ ගත පුරා අගෙයි එය
තුරුලතා මත පිපුණ මල් මත දිලිහි පිනිකැට
එකිනෙක ගෙන තෝඩු, මාල, වළලු අමුණා
හිස් දෙකන් පෙති ගෙල හා දෑත් යුගලේ පළඳවා
රෑ පිපී සැලුන සේපාලිකා මල් අහුලා
හිස මත දවටා හැඩ කළා තව තවත්
දෙව්ලොවින් බැස ආ දෙව්ලියක් සේ
දිස්වුණා මා ඉදිරියේ ඇය සිනාසී
රොන්සුණු දෙකොපුලේ තවරා
ඇයව සිපගන්නටයි සැරසුණේ
සීතලෙන් තිගැස්සී පිබිදුනේ සැනෙකින්
පසක් විය දිළිඳු මා රැයේ දුටු සිහිනයක් බව

● **පුෂ්පා නන්දනී**
**රත්නපුරය**

## කණ කැස්බෑ පැතුම

අඳුරු දියවැල් හා එතී
සොඳුරු පැතුමන් හිත ඇතී
පුර පෝය හඳ නම් දැක නැතී
නිල් අහස දුටුවත් ඒ ඇතී

වියසිදුරු නැති වුණත් ලෝකය
එකවරක් දැකගන්න හිතුණා
කිසිවෙකුත් නොදකිනා හවසක
මිනිස් දහනට හෙමින් එබුණා

ගොඩබිමක් ගිනි තැබූ මිනිසුන්
දියකඳත් ගිනි තබා තිබුණා
මියගියත් ලොව දකින්නට දෝ
හිමි එකම ඇස ඇරී තිබුණා

දිලෙන පුන්සඳ නැතත් හිතගත්
අහසකට පෙම් කළ එකී
දියවෙලා විෂ උදුරගත්තා
එකම ඇස පණ මෙන් රැකී

දරාගෙන දුක කඳුළ දිය කර
කරදියක නොගසා ඉකී
සමුඅරන් ඇය පාළු වෙරළක
දරා දුක කාටත් නොකී

● **පුෂ්පශාන්ත සමරනායක**
**මොරටුව**

# කවි යාය

ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට එවන්න.

“කවි යාය”
‘ධරණී’ කර්තෘ මණ්ඩලය,
අංක 91,
විජේරාම මාවත,
කොළඹ 07
නැතිනම්
dharanee.editor@liberty.lk
ලිපිනයට ඊමේල් කරන්න

සංස්කරණය - මනෝරා ප්‍රේමතිලක

## ආයාචනය

පුහු ආටෝප බොරු සෝබන හැම    පැත්තේ
තරහව ඉරිසියාවයි රජ වී    ඇත්තේ
මිනිසුන් නොමිනිසුන් වී ඇත ඒකයි    තත්තේ
දහමක් නොමැත අදහම පෙරමුණ    ගත්තේ

සැම දේ සැපයි අනියත බව නෑ    දන්නේ
දීමක් නොමැත තම මඩි තර කර    ගන්නේ
මුදු වදනක් නොමැත රළු බස්    පවසන්නේ
මිනිසුන් ඇයිද? දහමට පිටුපා    යන්නේ

මාපිය දෙදෙනා හරිහැටි හඳුනන්නෙ    නැත
මහලු නිවාසය සනසයි සැමගෙ    සිත
දරුවන් දැරිවියන් කෙළෙසයි සතර    අත
පිරිහෙන ලොවේ සදහම් මල් පිපෙනු    නැත

හුස්ම රැඳී ඇති තැන් වනසා    ලන්නේ
ගස්වැල් නොමැත මිහිමව කම්පා    වන්නේ
සතුනගෙ මස් බුදී දිවි සරිකරගන්නේ
කොරෝනා නුඹත් දඬුවමකිය දුන්නේ

වරදට දඬුවමක් ඇති බව සිතනු    මැන
ඒ ගැන සිතා දහමට සිත් යොමනු    මැන
අනියත බව පසක් කර දිවි ගෙවනු    මැන
කාලය මෙයයි බුදු සමිඳුනි වඩිනු    මැන

● **ප්‍රියානි ප්‍රදීපිකා**
**කැකණදුර**

## තුරුණු සිත

දඟ කැවුණ කඳු මුදුන
මුදු ගැසුණ කෙස් රොදක
සිරිය පා නිල් අහස
පියඹ යට වන පෙතක

ගලා ඇද හැලෙන දිය
දහරක්ව රටාවක
දෝත පා සිපගන්න
මුදු දෙපා සිතුවමක

ගහට නතු වැලක ලෙස
සියොතුන්ගෙ ගී රසින්
මුදු සවනත තෙපුල්
සරසනා යුග යොවුන්

සීතලට ගුලි ගැසුණු
මුදු සිත තනිකමින්
ඉගිල යමි ලෝකයට
යොවුන් සිත් කඩිනමින්

පියඹන්න තටු ඇතත්
නිල් අහසේ ඉඩ නැතේ
දඩබ්බර වූ සිතට
සෙනෙහසක් හිමි නැතේ

ජීවිතේ දිනන්නට හදවතට
නොම සිතේ
ලෝකයට යන්න දී
හිඳින්නට මට සිතේ

● **සන්ධ්‍යා D ප්‍රනාන්දු**
**සපුගස්කන්ද**

## අයිසිං ජීවිත

ටයි පටි ක්ලීන් සූට්
සාරි ඔසරි මුහුණට පියරු
ස්ත්‍රී පුරුෂ පාවෙන ජීවිත
සොයනවා ජීවිතය
විඳවමින් දඟලමින්

උගත්කම රස්සාව
කසාදය දරුමල්ලෝ
ගේදොර ඉඩකඩම්
අතර උකස් කර ජීවිතය
ලෝකයට පෙනෙන්නට
පිපාසෙන් සොයන වුන්
දිව ගිලී පණ අදියි

නිදහසක් සාමයක්
සැනසුමක් නැති වුණත්
හීනවල ගුලිගැහී
සොයනවා උන් යමක්
හීනමලු ජීවිතය
නැහැ උන්ට වෙන දෙයක්

පාට පාට හීනවල
මුරුගසන් වැහි වහියි
අකුණු පුපුරයි තදින්
කුණාටුව දැඩිව එයි
නැහැ උන්ට වගක්වත්
හති දමා උන් දුවයි
හැරී උන් බලනවිට
ඇඳි වතත් ඉතිරි නැත

● **දිනිත් අතපත්තු**
**මාතර**

## ජීවිතය

නොමැකෙන මතක සටහන් ගොන්නක්    එකට
හදෙහි දරා සිටියේ දුකකිනි    මෙලෙස
කඩාවැටුණු දිවියට සවියක්    විලස
ලැබුණි බුදුදහමේ හැටියට මට    සවිය

ජීවිතයම දුකකි යන ඒ බුදු    වදන
තේරුම් ගතිමි මගේ ජීවිතයේ    අරුත
රුකුළක් වුණේ අම්මාගේ    ආදරය
යන්නෙමි ඉදිරියට මැඩගෙන    බාධකය

සතෙකුටවත් හිංසාවක් නොකළ    නිසා
කිසිවෙකුහට වංචාවක් නොකළ    නිසා
ධර්මයටම මගෙ හිත යොමු කෙරෙන    නිසා
ඉරහඳ පවා මගෙ ගුණකඳ කියයි    සඳ

● **සුරේකා නිරංජී**
**තංගල්ල**

## ගතින් මහලු හිතින් තරුණ අපි

කළු කෙස් රොදක්    අතරේ
සුදු කෙස් ගසක්    වැතිරේ
නුඹගෙ දෙඇස්    ගැඹුරේ
නොදැවිටිනිද හිමියනි එය    මෙවරේ

හෙමින් පිරිමැද තදින් පෙම්    කළ
වස්තුවක් වැනි මගේ    කෙස්වල
අලංකරනෙට ගැසුව සුදු    මල
පරව ගොස් එයි ධවල කෙස්    වැල

ලෝක දහමට යටත් හැම    දෙය
කෙස් ගසට වුව වන්නෙ එම    දෙය
ඉතින් අපි අද ගතින්    මහලුය
හිතින් පමණක් තවම    තරුණය

● **සුසීමා චාන්දනී සේසත්පුර**
**දුනගහ**




කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.